FHSS
Repository
of Humanities and Social Sciences

Publication Committee
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

**E-Repository of Humanities and Social Sciences**
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

# Publication Donation Form

Please provide the following information of your publication (please note that one consent form needs to be filled for each publication if you have more than one on offer for the E-Repository of Humanities and Social Sciences).

1. Title of the publication : ආර්ථික සංවර්ධනයේදී කෘෂිකාර්මික අංශයේ කාර්යභාර
2. Author 1 : අනුර ජයසිංහ
3. Author 2 : ..........
4. Author 3 : ..........
5. Author 4 : ..........
6. Publisher : කර්තෘ
7. Year of Publication : 2013
8. ISBN/ISSN (if applicable) : 978-955-44480-0-1
9. Access option (**please refer to the letter and write the option number**) : [ ]
   *If you have selected option 3 or 4, please specify the number of pages allowed: [ ]
10. Format of the publication (select from the following options) to be submitted :
    a. Good quality PDF version of the publication: [ ]
    b. Hard copy of the original publication : [✓]
    c. Other (please specify) ...................... : [ ]

**Author/copyright owner statement:**

I/~~we~~, N. M. Anura Jayasinghe (your name/names), as the author/~~s~~ or copyright owner/~~s~~, would like to donate the above publication to **the E-Repository of Humanities and Social Sciences** of the University of Sri Jayewardenepura. I/~~we~~ also would like to provide my/~~our~~ consent to allow the E-Repository Management Committee to make the publication accessible to the University of Sri Jayewardenepura student community guided by limits of the permitted access option.

Signature of the Author/s or Copyright owner/~~s~~: 1)............ 2)............ 3) ............

Date: 30|08|2024

ආර්ථික සංවර්ධනයේදී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය සංවර්ධන ආර්ථික විද්‍යාව මෙන්ම කෘෂි ආර්ථික විද්‍යාව විෂය ක්ෂේත්‍රයෙහි ද සාකච්ඡා කරන ප්‍රධාන විෂයය කාරණයකි. එහෙත් ඒ පිළිබඳව අධ්‍යයනය සඳහා පරිශීලනය කිරීමට සිංහල භාෂාවෙන් ලියැවුනු ග්‍රන්ථයන් අවම අවස්ථාවක අනුර ජයසිංහ මහතා ගෙන ඇති මෙම උත්සාහය ප්‍රශංසනීය ය. පල්ලේබැද්ද අම්බැවිල මහ විද්‍යාලයෙන් ද්විතීයික අධ්‍යාපන කටයුතු සාර්ථකව අවසන් කරමින් 2005 වර්ෂයේ දී ශාස්ත්‍රවේදී උපාධි අධ්‍යයන කටයුතු සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ ඒ මහතා 2009 වර්ෂයේ දී ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂවේදී උපාධිය ප්‍රථම පෙළ පන්ති සාමාර්ථයක් සමඟ ලබාගත්තේ ය. 2010 වර්ෂයේ එම විශ්වවිද්‍යාලයේ ම නිබන්ධ ආචාර්යවරයෙකු වශයෙන් සේවයට එක්වූ ඔහු මේ වනවිට ශාස්ත්‍රපති උපාධි අධ්‍යයන කටයුතු සම්පූර්ණ කරමින් සිටී. විවිධ පර්යේෂණ හා අධ්‍යයන කටයුතුවල නියැලෙමින් අධ්‍යාපන ක්ෂේත්‍රයට කැපවී කටයුතු කරන අනුර ජයසිංහ මහතාගේ මෙම ග්‍රන්ථය මෙරට විශ්වවිද්‍යාලයන් හි මෙන්ම උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කටයුතු කරන මෙම ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් දක්වන සෑම විද්‍යාර්ථියෙකුට ම විශේෂයෙන් වැදගත් වේ.

මහාචාර්ය උදිත් ජයසිංහ-මුදලිගේ
කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය
කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
මාකඳුර, ගෝනවිල (වයඹ).
2013.04.04

ISBN 978-955-44480-0-1

මිල රු. 300.00

# ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය

අනුර ජයසිංහ

# ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය

අනුර ජයසිංහ

B.A. (Econ) Sp. (SJP)

# ස්තුතිය

ආර්ථික විද්‍යාවේ මූලකුරු කියාදෙමින් නිබඳවම මා දිරිමත් කරන ආර්ථික විද්‍යාව පිළිබඳ මාගේ මුල්ම ගුරු පියාණන් වන ඒ. එල්. පී. ජයවර්ධන මහතා මෙහිදී ප්‍රථමයෙන් ගෞරවයෙන් යුතුව සිහිපත් කළ යුතුය. එමෙන්ම මෙම කාර්යය සාර්ථකව සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශයේ වත්මන් අංශාධිපතිනිය වන ආචාර්ය ධම්මිකා විතානගේ මහත්මියට මෙන්ම එම අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඩී. පී. එස්. චන්ද්‍රකුමාර මහතාට ද මෙහිදී විශේෂයෙන් ස්තුතිවන්ත වියයුතුය. තවද, සෝදුපත් බැලූ විශ්‍රාමලත් විදුහල්පති පූජ්‍ය හටංගල ධම්මවංස ගුරුදේවයාණන් වහන්සේට ගෞරවනීය ස්තුතිය පුදකරමි. අවශ්‍ය උපදෙස් ලබාදෙමින් ග්‍රන්ථකරණයට මා උනන්දු කළ ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය නිමල් හේරත් මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ. ආර්. කෝදාගොඩ මහතා, ආචාර්ය ශිරන්ත හීන්කෙන්ද මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගාමිණී වීරසිංහ මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී දමයන්ති බමුණුසිංහ මහත්මිය, කථිකාචාර්ය අජන්ත කළ්‍යාණරත්න මහතා හා කථිකාචාරිණී වාසනා කළංසූරිය මහත්මිය මෙන්ම දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාර්ය රවීන්ද්‍ර ගුණසේකර මහතා ද අවශ්‍ය වෙනත් සහයෝගයන් ලබාදෙමින් කටයුතු කළ ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශයේ ම එච්. ජී. සැමී මහතා, අයි. කේ. ධර්මදාස මහතා, අජිතා හේවගේ මහත්මිය හා දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රේමදාස සිල්වා මහතා, සුදර්ශනී සමරනායක මෙනවිය ද සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශයේ ප්‍රසාද් මංගල කුමාර හා ධනුෂ්ක ගයාන් ජයසුන්දර සොයුරන් ද කෘතඥ පූර්වකව සිහිපත් කරමි. විශේෂයෙන් සහෝදරත්වයෙන් යුතුව හැකි සෑම කාර්යයකටම සහයෝගය ලබාදෙන දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාරිණී ඉමංගා නදීශානි මෙනවිය ද කෘතවේදීව සිහිපත් කරමි. මාගේ සෑම කාර්යයකදීම අවශ්‍ය සියලු

සහයෝගයත් ලබාදෙමින් හැමවිටම මා දිරිමත් කරන ආදරණීය අම්මා තාත්තා හා සහෝදර සහෝදරියන් මෙහිදී ද ලබාදුන් සහය හදපිරි සතුටින් අගයමින් කෘතවේදීත්වය දක්වන්නෙමි. තවද,

මෙම ග්‍රන්ථයට ආකර්ශනීය නිමාවක් ලබාදෙමින් කංචුකය නිර්මාණය කරදුන් චමිර එරන්ද මහතා ද මහත් උනන්දුවෙන් පොත මුද්‍රණ කටයුතු කළ සයිබර්ගේට් සර්විසස් ආයතනයටද, අවශ්‍ය සෙසු කාර්යයන් හි දී සහයෝගය ලබාදුන් සැමට ද හදපිරි ප්‍රණාමය හිමි වේ.

අනුර ජයසිංහ
අංක 59, පාසල් මාවත,
ගංගොඩවිල
නුගේගොඩ.



# පෙරවදන

අනුර ජයසිංහ මහතා පසුගිය වසර කිහිපය තුළ ආර්ථික විද්‍යාව විශේෂ උපාධිය හදාරා ප්‍රථම පන්තියේ උපාධියක් ලබාගත් අයෙකි. වර්තමානයේ ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාවකාලික නිබන්ධකවරයෙකු ලෙස කටයුතු කරයි.

'ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය' යන ඔහු විසින් රචිත මෙම කෘතිය විශේෂ කරුණු කිහිපයක් මත වැදගත් බව මම දකිමි. කෘෂි අංශයේ කාර්යභාරය පිළිබඳ න්‍යායාත්මක මෙන්ම ප්‍රත්‍යක්ෂමූල කාරණා ද ඇතුළත් කිරීමට උත්සාහ ගෙන තිබීම එක් වැදගත් කාරණයකි. එමෙන්ම ද්විතීයික මූලාශ්‍රවල පවතින දත්ත එලෙසම ඉදිරිපත් කිරීමෙන් ඔබ්බට ගොස් තමාගේම විශ්ලේෂණයන් තුළින් ද පැහැදිලි කිරීමට ගන්නා ලද උත්සාහය ද කැපීපෙනේ. ඉදිරිපත් කර ඇති විෂය කරුණු නිශ්චිත වූ ලේඛන සම්ප්‍රදායයන් හා ක්‍රම අනුගමනය කරමින් රචනාකර තිබීම ද වැදගත් ලක්ෂණයක් ලෙස සැලකීමට කැමැත්තෙමි. සමස්තයක් වශයෙන් ගත්කළ මෙම කෘතිය සංවර්ධන ආර්ථිකවිද්‍යාව, කෘෂිකාර්මික ආර්ථිකවිද්‍යාව වැනි විෂයයන් හදාරණ සිසුනට පමණක් නොව සාමාන්‍ය පාඨකයාට ද කියවා තේරුම් ගතහැකි ආකාරයෙන් රචනාකර ඇති බව ද සඳහන් කළ යුතුය.

අනුර ජයසිංහ මහතාගේ ලේඛන දිවියේ ඉදිරි ගමනට සුබ පතමි.

ආචාර්ය ඩී. පී. එස්. චන්ද්‍රකුමාර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# හැඳින්වීම

ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශය කෙසේ දායකවන්නේ ද යන්න විමසා බැලෙන මෙම ග්‍රන්ථය මඟින් සංවර්ධනය යන සංකල්ප අවබෝධයේ සිට කෘෂි අංශයේ ආර්ථික සංවර්ධන කාර්යභාරය දක්වා කරුණු ගණනාවක් න්‍යායාත්මකව මෙන්ම ඓතිහාසික සාක්ෂි ඇසුරින් ද සාකච්ඡා කර ඇත. ආර්ථික විද්‍යාත්මකව සංවර්ධනය හඳුනාගනු ලබන්නේ ආර්ථික වර්ධනය සමඟම රටක් චිරස්ථායි ලෙස ලබන දියුණුවයි. ඒ අනුව ආර්ථික වර්ධනයේ සිට සංවර්ධනය යන සංකල්පය වර්තමානය වනවිට තිරසාර මානව සංවර්ධනය යන සංකල්පය දක්වා ක්‍රමිකව විකාශනය වී ඇත. සංවර්ධනය මඟින් සිදුවනුයේ ආර්ථිකයේ ව්‍යුහාත්මක පරිවර්තනය බැවින් ආර්ථික ව්‍යුහය පිළිබඳ අවබෝධයක් පැවතීම මෙවැනි අධ්‍යනයකදී ඉතා වැදගත් වේ.

ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය කෘෂි ආර්ථිකවිද්‍යා විෂය සීමාවට අදාළ වේ. මෙහිදී සංවර්ධනය සංකල්පයක් වශයෙන් හඳුනාගත් ආකාරයෙන් ම කෘෂිකර්මය යනු කුමක්ද යන්න අවබෝධ කරගත යුතුය. සරලව සළකා බලන විට කෘෂිකර්මය යනු ආර්ථිකයේ ප්‍රධාන බලවේග තුනෙන් ප්‍රාථමික බලවේගය වන අතර එයට කෘෂිකර්මය, දැව ආදි වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය (සත්ත්ව පාලනය ද ඇතුළුව) ප්‍රධාන ක්ෂේත්‍ර ඇතුළත් වන බව වර්තමාන ජාතික ගිණුම් පිළියෙළ කිරීමේ අන්තර්ගතය පරීක්ෂා කිරීම මඟින් අවබෝධ කරගත හැකිය.

කෘෂිකාර්මික අංශය ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී දක්වන දායකත්වය නැතහොත් එහි කාර්යභාරය පිළිබඳව ප්‍රවේශයන් දෙකක් යටතේ කරුණු අධ්‍යනය කළ හැකිය. ඒ නූතන පොදු අදහස හා න්‍යායාත්මක පසුබිම වශයෙනි. නූතන පොදු අදහස ගත්විට කෘෂි අංශය සමස්ත ආර්ථික වර්ධනය හා සංවර්ධනය කෙරෙහි පංච මහා දායකත්වය සපයයි. ඒ, නිෂ්පාදන

දායකත්වය, ශ්‍රම දායකත්වය, වෙළෙඳපොළ දායකත්වය, ප්‍රාග්ධන දායකත්වය හා විදේශ විනිමය දායකත්වය යනුවෙනි.

සංවර්ධනය පිළිබඳ හැදෑරීමේ දී සංවර්ධන ආකෘතීන් නැතහොත් න්‍යායයන් පිළිබඳ හැදෑරීම අත්‍යාවශය වේ. එම අවශ්‍යතාව තුළින් සලකන විට සංවර්ධන ආකෘතීන් කිහිපයක් මඟින් ද සමස්ත ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය පිළිබඳ න්‍යායාත්මක විග්‍රහයක් ඉදිරිපත් කර ඇති බව *"සංවර්ධන සාහිත්‍ය (Development Literature)"* තුළින් විද්‍යාමාන වේ. එම න්‍යායන් අතුරින් න්‍යායන් කිහිපයක් මෙම ග්‍රන්ථය තුළින් සවිස්තරාත්මකව හඳුනාගනු ලබයි. ආර්ථිකයේ සංවර්ධනයට කෘෂි අංශයේ දායකත්වය පිළිබඳ ෆ්‍රිසියෝක්‍රැට්වාදීන්ගේ සිට ජෝර්ජ්සන්, ෂුල්ට්ස්. මෙලර්, රානිස් හා ෆෙයි, ලුවිස්, මයර් වැනි ආර්ථික විද්‍යාඥයින් තම අදහස් ඉදිරිපත් කර ඇත.

ලුවිස් 1954 දී ශ්‍රම අතිරික්තය පිළිබඳ න්‍යාය ඉදිරිපත් කරමින් කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමය කාර්මික අංශයට සංක්‍රමණය වීමෙන් අන්තර් ආංශික දියුණුවක් ද්විත්ව ආර්ථිකය තුළින් බලාපොරොත්තු වන ආකාරය උපකල්පන කිහිපයක් යටතේ ඉදිරිපත් කර ඇත. ලුවිස්ගේ මෙම න්‍යායේ පැවති දුර්වලතා මඟහරවා එය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මහාචාර්ය රානිස් හා මහාචාර්ය ෆෙයි විසින් 1964 දී ශ්‍රම අතිරික්තය පිළිබඳ නීතියක් ඉදිරිපත් කළේය. අවධි 6 ක් යටතේ රටක ආර්ථිකය සංවර්ධනය කරගන්නා ආකාරය පදනම කෘෂිකාර්මික අංශය වශයෙන් ගෙන ඉතා පැහැදිලි ලෙස ක්‍රියාවලියක ස්වරූපයෙන් තම සංවර්ධන ආකෘතියේ දී ඔවුන් විසින් ඉදිරිපත් කළහ.

කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ වැදගත් අදහසක් මෙලර් විසින් ද දක්වා ඇත. ඔහුගේ ආකෘතිය තුළින් ද අවධි තුනක විශ්ලේෂණයක් ඉදිරිපත් කෙරේ. වැඩවසම් කෘෂිකර්මය. අඩු දියුණු තාක්ෂණ භාවිත කෘෂිකර්මය හා දියුණු ශ්‍රම ඵලදාව ඉහළ දමන



තාක්ෂණය යොදා ගන්නා කෘෂිකර්මය ලෙස එම අවධීන් දක්වමින් එම අවධීන්ගේ පෙළක් රටක සංවර්ධන ක්‍රියාවලියේ දී දැකිය හැකි බව ද පෙන්වා දෙමින් මෙලර් තම වර්ධන ආකෘතිය ඉදිරිපත් කළ ද සමහර රටවල සංවර්ධන ඉතිහාසය විමසීමේ දී මෙම යුගවල පෙළක් දැකිය නොහැකි බව පැහැදිලි වේ.

1964 දී ෂුල්ට්ස්ගේ අදහස මඟින් ද කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ අදහස් ලබාගැනීමට හැකිවේ. ඔහු තම අදහස් ඉදිරිපත් කරණුයේ වැඩවසම් කෘෂිකර්මය ප්‍රාග්ධනිත කෘෂිකාර්මික අංශය බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියක් වශයෙනි. ඒ ඒ අංශවල විවිධ ආවේණික ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරමින් ඔහු තම අදහස තව දුරටත් පැහැදිලි කර ඇත.

කෘෂිකාර්මික සංවර්ධන පිළිබඳ මෙලෙස න්‍යාත්මකව කරුණු ඉදිරිපත් කළ ද ප්‍රත්‍යක්ෂ මූල වශයෙන් හෝ ඓතිහාසික සාක්ෂි තුළින් ඒවා තහවුරු විය යුතුය. ඒ බව ජපානයේ, තායිලන්තයේ, ඇමරිකාවේ හා එංගලන්තයේ ආර්ථික ඉතිහාසයන් දෙස නැවත ආපසු හැරී බැලීමෙන් ප්‍රත්‍යක්ෂ වේ. එබැවින් එම ඓතිහාසික කරුණු කෙරෙහි ද මෙහිලා අවධානය යොමු කර ඇත. මේ ආකාරයට සමස්ත ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය පිළිබඳ ආර්ථික විද්‍යාත්මක විශ්ලේෂණයට අදාළ කරුණු ගණනාවක් මෙම ග්‍රන්ථය තුළින් උකහා ගතහැකිය. කෘෂි ආර්ථිකවිද්‍යාව පිළිබඳව උනන්දුවන පිරිස හා උපාධි හා අනෙකුත් අදාළ උසස් විභාග සඳහා පෙනී සිටින පිරිස වෙනුවෙන් ද මෙම ග්‍රන්ථය අත්පොතක් වශයෙන් පරිශීලනය කළ හැකි බව මාගේ විශ්වාසය යි.

# පටුන

පිටුව

ස්තුතිය ....................................................................................vii

පෙරවදන ....................................................................................ix

හැඳින්වීම ....................................................................................xi

පටුන ....................................................................................xiv

සංඛ්‍යා සටහන් හා රූප සටහන් ..............................................xvii

**පළමු පරිච්ඡේදය :**

**සංවර්ධනයː සංකල්පමය අර්ථකථනය, විකාශනය** 01 - 10

1.1 හැඳින්වීම

1.2 සංවර්ධනයෙහි අර්ථකථනය

1.3 සංවර්ධන සංකල්පයේ විකාශය

1.4 සංවර්ධනයේ දී ආර්ථික ව්‍යුහයේ වැදගත්කම

1.5 ආර්ථිකය හා කෘෂි අංශය

**දෙවන පරිච්ඡේදය :**

**සංවර්ධන ක්‍රියාවලියේදී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරයː නූතන පොදු අදහස** 11 - 24

02.01 හැඳින්වීම

02.02 ආහාර සැපයුම

02.03 කාර්මික අංශයට ශ්‍රමය මුදාහැරීම.

02.04 ප්‍රාග්ධන සම්පාදනය

02.05 විදේශ විනිමය දායකත්වය

02.06 කෘෂි භාණ්ඩ සඳහා වෙළඳපොළ පුළුල් කිරීම

02.07 දරිද්‍රතාව පිටුදැකීම

තෙවන පරිච්ඡේදය :

**සංවර්ධන ක්‍රියවලියේදී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරයː න්‍යායාත්මක අදහස - පළමු කොටස** 25 - 54

3.1 හැඳින්වීම

3.2 කෘෂිකාර්මික සංවර්ධනය

3.3 ලුවිස්ගේ ශ්‍රම අතිරික්තය පිළිබඳ න්‍යාය හා කෘෂිකාර්මික සංවර්ධනය

3.4 කෘෂිකාර්මික අතිරික්තය පිළිබඳ රානිස් හා ෆෙයි ආකෘතිය

3.4.1 හැඳින්වීම

3.4.2 න්‍යායාත්මක විමසුම

සිව්වන පරිච්ඡේදය :

**සංවර්ධන ක්‍රියවලියේදී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරයː න්‍යායාත්මක අදහස - දෙවන කොටස** 55 - 75

4.1 කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ෂුල්ට්ස් න්‍යාය

4.1.1 හැඳින්වීම

4.1.2 න්‍යායාත්මක විමසුම

4.1.3 ෂුල්ට්ස්ට අනුව කෘෂිකාර්මික වර්ධනය සමස්ත ආර්ථික සංවර්ධනයට පදනම් වන අයුරු

4.2 කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ මෙලර්ගේ ආකෘතිය

4.2.1 හැඳින්වීම

4.2.2 න්‍යායාත්මක විමසුම

4.2.3 මෙලර්ගේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී කෘෂිකාර්මික පදනම

4.3 ජෝර්ජෙන්සන්ගේ ද්විත්ව ආර්ථික ආකෘතිය

4.3.1 හැඳින්වීම

4.3.2 ද්විත්ව ආර්ථික ආකෘතිය හා ආර්ථික සංවර්ධනය



පස්වන පරිච්ඡේදය :

**ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය පිළිබඳ ඓතිහාසික සාක්ෂි** 79 - 102

5.1 ජපානය

5.2 තායිවානය

5.3 ඇමරිකාව

5.4 එංගලන්තය

5.5 චීනය

**ආශ්‍රිත**

# සංඛ්‍යා සටහන් හා රූප සටහන්

පිටුව

*දෙවන පරිච්ඡේදය*


**2.1 සංඛ්‍යා සටහන**

ශ්‍රී ලංකාවේ 1990-2001 කාලයේ දී කෘෂිකාර්මික හා කර්මාන්ත අංශ අතර සේවා නියුක්ති වෙනස්වීම් 16

2.1 රූප සටහන

කෘෂි අංශය පදනම් කරගත් ප්‍රාග්ධනය සම්පාදනය කිරීම 19

2.2 රූප සටහන

දිළිඳුබවේ විෂම චක්‍රය බිඳවැටීම 22


*තෙවන පරිච්ඡේදය*


3.1 රූප සටහන

සාම්ප්‍රදායික අංශයේ ශ්‍රමයේ හැසිරීම (ලුවිස්ට අනුව) 35

3.2 රූප සටහන

නාගරික අංශයේ ශ්‍රමයේ හැසිරීම (ලුවිස්ට අනුව) 37

3.3 රූප සටහන

ලුවිස් දක්වන සංවර්ධන ක්‍රියාවලිය 40

3.4 රූප සටහන

කෘෂිකාර්මික අංශයේ ශ්‍රමයේ හැසිරීම
(රානිස් හා ෆෙයි ආකෘතියට අනුව) 46

3.5 රූප සටහන

කෘෂි අංශයේ වැටුප් වෙනස්වීම හා කාර්මික අංශයේ ශ්‍රම සැපයුම් වක්‍රය 48

3.6 රූප සටහන

සමබර වර්ධනය 53

3.7 රූප සටහන

සංවර්ධන ක්‍රියාවලිය (රානිස් හා ෆෙයි විග්‍රහය අනුව) 54

*සිව්වන පරිච්ඡේදය*

4.1 රූප සටහන

නිෂ්පාදන සාධකවල මිල තීරණය වීම 62

4.2 රූප සටහන

ෂූල්ට්ස් දක්වන ආර්ථික සංවර්ධනයේ ක්‍රමවේදය 64



4.2 රූප සටහන

ආර්ථික සංවර්ධනයේ පදනම (මෙලර්ට අනුව) 72

4.3 රූප සටහන

ද්විත්ව ආර්ථික ආකෘතියේ සංවර්ධන පියවර 77

*පස්වන පරිච්ඡේදය*

5.1 රූප සටහන

ඔකාවා න්‍යායට අනුව ජපානයේ
ආර්ථික සංවර්ධනයේ පියවර 84

5.2 රූප සටහන

තායිවාන් ආර්ථික සංවර්ධන ගමන්මග 91

5.3 රූප සටහන

එංගලන්තයේ කෘෂිකාර්මික විප්ලවය කාර්මික විප්ලවයට දායක වූ ආකාරය 98

## පළමු පරිච්ඡේදය

# සංවර්ධනය: සංකල්පමය අර්ථකථනය හා විකාශනය

## 1.1 හැඳින්වීම

සමාජයීය විද්‍යා *(Social Science)* විෂය ධාරාවේ ඉතා ජනප්‍රිය විෂයයන් අතර ආර්ථික විද්‍යාවට *(Economics)* හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. එය විවිධ උප විෂය කාණ්ඩ මඟින් සංවිධාන වූ ප්‍රධාන විෂය මූලාශ්‍රයක් වේ. ඒ යටතේ එන ''කෘෂි ආර්ථිකවිද්‍යාව *(Agricultural Economics)*'' යන විෂයය මඟින් කෘෂිකර්මය පිළිබඳ ආර්ථික විද්‍යා අර්ථ නිරූපනය ආර්ථික විද්‍යාත්මකව ඇගයීමට ලක්කරයි. ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය *(Role of Agricultural Sector in Economic Derelopment)* යන විෂය කාරණය ඇතුළත් වනුයේ මෙම විෂය ධාරාවේ අන්තර්ගතයට ය.

විවිධ උප විෂය ධාරාවන් රාශියකගේ තෝතැන්නක් වූ ආර්ථික විද්‍යාවේ වැඩි දෙනා සාකච්ඡාවට යොදාගන්නා තවත් උප විෂයයක් වන ''සංවර්ධන ආර්ථිකවිද්‍යාව *(Development Economics)*'' තුළින් ''සංවර්ධනය *(Development)*'' යන්නට ආර්ථික විද්‍යාත්මක අර්ථ නිරූපනයක් ලබා දෙනු ඇත. විවිධ පාර්ශවයන්, විවිධ විෂයයන් යටතේ විවිධ ආකාරයෙන් සංවර්ධනය යන්න හඳුනාගනී. එපමණක් ද නොව මෙම සංකල්පයෙහි යම් අවස්ථාවක සිට නූතන අදහස දක්වා පැහැදිලි ක්‍රමික විකාශනයක් ද අවබෝධ කරගත හැකි ය. කෙසේනමුත්, ඒ පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීම මෙහි අරමුණ නොවුව ද සංවර්ධනය යන්න හඳුනාගැනීම, විකාශනය, දායකත්වය, හා එහිදී ආර්ථික ව්‍යුහයෙහි කාර්යභාරය වැදගත් වන බැවින් එම කාරණා විශ්ලේෂණය කිරීම මෙම පරිච්ඡේදයෙන් සිදුවේ.





## 1.2 සංවර්ධනයෙහි අර්ථකථනය

සංවර්ධනය යනු පුළුල් සංකල්පයකි. එහි පරමාර්ථය මානව වර්ගයාගේ ජීවන පැවැත්ම උසස් කිරීමයි. එමෙන්ම එය ක්‍රියාවලියකි. කෙසේද යත් සංවර්ධනය අඛණ්ඩ ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලිය සඳහා අත්‍යාවශ්‍ය කොන්දේසිය වන්නේ කුමක් ද යන ගැටලුවට දිය හැකි පැහැදිලි පිළිතුර වන්නේ ''ආර්ථික වර්ධනය *(Economic Growth)*'' යි. මේ නිසා පැහැදිලි වශයෙන් සංවර්ධන සංකල්පයේ විකාශනයේ පදනම ආර්ථික වර්ධනය බව නිගමනය කළ හැකිය.

පරිච්ඡේදය ආරම්භයේදී සඳහන් කළ පරිදි සංවර්ධන සංකල්පයට ආර්ථික විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික, අධ්‍යාපනික ආදී විවිධ දෘෂ්ටිකෝණ මඟින් අර්ථකථයන් දිය හැකිය. *Economics of Development and Planning* යන කෘතිය ඉදිරිපත් කරමින් ඇග්‍රවෝල් හා කුන්ඩන් *(Agrawal and Kundan)* විසින් සංවර්ධනය යනු භෞතික සුභසාධන දියුණුවීම හා ඒකපුද්ගල ආදායම යන විචල්‍යයන්ගේ එකවර ලබන වර්ධනය බව පෙන්වා දී ඇත. මෙම නිර්වචනයට අනුව පැහැදිලි වන වැදගත් කරුණක් වන්නේ සංවර්ධනය යන්නට සංරචක දෙකක් ඇතුළත් වන බවත්, එම සංරචක

1. ඒක පුද්ගල ආදායම *(Per Capita Income)*
2. භෞතික සුභසාධනයේ ව්‍යාප්තිය *(Distribution of Material Welfare)*

යන ඒවා බවත් ය.

ප්‍රනාන්දු (2001) සංවර්ධනය හැඳින්වීමේදී ''ඩඩ්ලි සියර්ස්'' නම් ආර්ථික විද්‍යාඥයාගේ අදහස් පදනම් කරගනී. ඔහු සංවර්ධනය හඳුනාගන්නේ ''***රටක දුප්පත්කම අඩුවී ඇත්ද? එම රටෙහි අසමානතාවය අඩුවී තිබේද? හා එම රටෙහි සේවා වියුක්තිය අඩුවී***

***තිබේද? එසේනම් එවැනි රටක් සංවර්ධනය වූ රටක් ලෙස හැඳින්විය හැකිය''*** යනුවෙනි. මෙම නිර්වචනය පාදක මූලාශ්‍රයක් වශයෙන් සංවර්ධන අධ්‍යනයේදී යොදාගත හොත් සංවර්ධනය වූවායැයි දක්වන ආර්ථිකයක පැවතිය යුතු ලක්ෂණ කිහිපයක් එයින් ගම්‍යමාන කරගත හැකිය. ඔහු වැඩිදුරටත් පෙන්වා දෙන්නේ **රටක ජීවත්වන සෑම පවුලක් සඳහාම ප්‍රමාණවත් ආදායමක් තිබීම, එම පවුලේ වැඩ කළහැකි සෑම පුද්ගලයෙකු ම ජීවනෝපාය හෝ රැකියාවක් කිරීම, එම පවුලේ සාමාජිකයන්ට අධ්‍යාපනය ලබාගැනීම සඳහා ඉඩ ප්‍රස්ථාවන් තිබීම, රජයේ සංවර්ධන ක්‍රියාවලියේදී ජනතාවට ඒ සඳහා තීරණ ගැනීමට ඉඩකඩ සලසාදීම හා එම රට ජාතියක් වශයෙන් කටයුතු කිරීමට හැකියාවක් ඇත්නම් එවැනි තත්ත්වයක්** සංවර්ධනය වශයෙනි. ඩඩ්ලි සියර්ස්ගේ මෙම අදහස පරීක්ෂා කිරීමේදී සංවර්ධනය යනු වර්ධනය පමණක් නොවන බව විද්‍යාමාන ය.

සංවර්ධනය නිර්වචනය කිරීමේ තවත් වැදගත් අදහසක් 1968 පළමු සමාජ විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර විශ්ව කෝෂයෙන් *(International Encyclopaedia of Social Science)* උපුටා ගතහැක. එහි පෙන්වාදෙන ආකාරයට ''ආර්ථික සංවර්ධනය යනු ***මූර්ථ ඒක පුද්ගල නිෂ්පාදනය සීඝ්‍රයෙන් නොකඩවා ඉහළයාමක් ඒ සමගම ශිල්පීය, ආර්ථික, සාමාජීය ආදී වෙනත් ලක්ෂණයන් හි වෙනස්වීමකි***'' වික්‍රමසිංහ (2002) 'ජනහිතකාමී ආර්ථික සංවර්ධනය'' යනුවෙන් කෘතියක් පලකරමින් සංවර්ධනය පිළිබඳ නූතන අදහස ඉදිරිපත් කරයි. ඔහු පෙන්වා දෙන්නේ ආර්ථික සංවර්ධනය යන්න විවිධ තේරුම් දෙන ශබ්දයක් බව ය. ඔහුට අනුව නවසිය අසූ ගණන්වල දී ලෝක බැංකුව සංවර්ධනය නිර්වචනය කළේ ***''වඩා හොඳ අධ්‍යාපනයක්, සෞඛ්‍ය හා පෝෂණ පිළිබඳ වඩා උසස් තත්ත්වයක්, දිළිඳුකම අඩුවීමක්, වඩා පවිත්‍ර පරිසරයක්, වැඩි වැඩියෙන් එක සමාන අවශ්‍යතා ද වැඩි වැඩියෙන් පුද්ගලික නිදහස ද වඩා සාරවත් සංස්කෘතික ජීවිතයක් යනාදිය ඇතිවීම***'' වශයෙනි.





මේ ආකාරයට සංවර්ධනය පිළිබඳ විවිධ අර්ථ නිරූපනයන් ඉදිරිපත්කිරීම නිරර්ථක ක්‍රියාවලියක් ලෙස මතුපිටින් පෙනුන ද සංවර්ධනයේ කෘෂිකාර්මික අංශයේ පසුබිම සාකච්ඡා කිරීමට නම් එම අධ්‍යයනයෙහි මූලික අර්ථය හෙවත් සංවර්ධනය යන්න හඳුනාගෙන තිබීම ප්‍රයෝජනවත් වේ.

## 1.3 සංවර්ධන සංකල්පයේ විකාශනය

සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය කොන්දේසි පැහැදිලි කිරීමේදී එය ආර්ථික වර්ධනයෙන් ආරම්භ වන බව මුලින් සඳහන් කළෙමු. ඒ අනුව සංවර්ධන සංකල්පයේ පැහැදිලි විකාශනයක් අවධි කිහිපයක් යටතේ පෙළගැස්විය හැකිය. ඒ පහත පරිදිය.

1. සමාජයේ ආර්ථික වශයෙන් ලබන දියුණුව සංවර්ධනය වේ (මූර්ථ නිෂ්පාදිතයේ අඛණ්ඩ වර්ධනය නොහොත් ආර්ථික වර්ධනය මින් අදහස් වේ).
2. ආයෝජනය වැඩිකිරීම තුළින් රටක් සංවර්ධනය කළ හැක.
3. සංවර්ධනය තුළට දුප්පත්කම නැතිකිරීම ද එකතු වේ. ඊට අමතරව සේවා වියුක්තිය අඩු කිරීම ආදිය ද ඇතුළත් වේ.
4. සංවර්ධනය යන්නට සමාජ සංවර්ධනය ද ඇතුළත් විය යුතු බව; එනම් ආදායම් බෙදීයාමේ විෂමතාවය අවම විය යුතු බව දක්වයි.
5. සංවර්ධනයට ගුණාත්මකව ලබාගන්නා දියුණුව බද්ධ කරයි.
6. ආර්ථික ප්‍රතිව්‍යුහගතකරණය හා ධරණීය සංවර්ධනය එනම්, තිරසාර සංවර්ධනය යන්න සංවර්ධනය ලෙස සාකච්ඡා කෙරේ.

7. ගෝලියකරණය හා ප්‍රාදේශීකකරණය හමුවේ රටක් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දියුණුවක් ලබාගන්නේ කෙසේද යන්න සංවර්ධනය තුළින් ගම්‍ය වන බව දැක්වීම.

8. තිරසාර මානව සංවර්ධනය

මානව සම්පත්හි ගුණාත්මකතාවය හා නිර්මාණශීලීභාවය නංවාලීම, දුප්පත්කම තුරන්කිරීම, පරිසරය ආරක්ෂා කරගනිමින් නිෂ්පාදන කටයුතු නංවාලීමට මෙන්ම ආර්ථික සමාජයීය, දේශපාලන හා පාරිසරික සංවර්ධන කටයුතුවලදී එම රටෙහි පුද්ගල සහභාගීත්වය ලබාගැනීම මෙමඟින් අදහස් වේ.

සංවර්ධන සංකල්පයේ විකාශය මේ ආකාරයෙන් ඉතා ලඝුකොට දැක්වුව ද එය ගැඹුරින් අධ්‍යයනය කරනවිට පවත්නා සංකීර්ණතාවය අවබෝධ කරගත හැකිය. එම සංකීර්ණ සංකල්පය ආර්ථිකයක ව්‍යුහයේ ව්‍යුහාත්මක වෙනස්වීම් අනුව විග්‍රහ කිරීම සුවිශේෂී වේ. මේ නිසා සංවර්ධනය හැදෑරීමට පෙර, රටක ආර්ථික ව්‍යුහය හා එහි සම්බන්ධතාව හඳුනාගත යුතුය.

## 1.4 සංවර්ධනයේ දී ආර්ථික ව්‍යුහයේ වැදගත්කම

සංවර්ධනය ව්‍යුහාත්මක පරිවර්තනයකි. ඒ අන් කිසිවක් නොව ආර්ථිකයේ ව්‍යුහාත්මක පරිවර්තනය යි. සංවර්ධනය අර්ථ නිරූපණයන් තුළින් ද පැහැදිලි කළ අදාළ ව්‍යුහමය වෙනස ආර්ථිකයේ ව්‍යුහමය වෙනසකි. නූතන ආර්ථිකයක ව්‍යුහය තුළ ප්‍රධාන අංශ තුනක් හඳුනාගත හැකිය. එනම්,

1. කෘෂිකාර්මික අංශය *(Agricultural Sector)*
2. කාර්මික අංශය *(Industrial Sector)*
3. සේවා අංශය *(Service Sector)*





වශයෙනි. උදාහරණ වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගත්විට ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික කාර්යයන්[1] සියල්ලම මෙම අංශ ත්‍රිත්වය යටතේ පෙළගැස්විය හැකිය.

ප්‍රනාන්දු (2001) දක්වන ආකාරයට සංවර්ධන ක්‍රමෝපායයන් සැකසීමේ දී අංශ අටක් පෙන්වා දෙයි. එහිදී රටේ ආර්ථික ව්‍යුහයේ ඉහත සඳහන් කළ අංශ සෘජුව ම දක්වා නොමැති වුව ද දක්වන ලද කරුණු ආර්ථික ව්‍යුහයට බද්ධව පවතී. එම කරුණු අට වනුයේ

i. දේශිය ඉල්ලුම කෙරේ ප්‍රමුඛතාවය ලබාදීම
ii. කෘෂිකර්මය පදනම් මත ප්‍රමුඛත්වය දීම
iii. මධ්‍යස්ථ ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යාම
iv. ජනගහන වර්ධනය පාලනය කිරීම
v. කාන්තා සහභාගීත්වය ලබාගැනීම
vi. පුළුල් ජනතා සහභාගීත්වයක් ලබාගැනීම
vii. මානව සංවර්ධන ප්‍රතිපත්ති පුළුල් ලෙස ක්‍රියාවට නැංවීම
viii. රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය හා සිවිල් සංවිධානවල සහයෝගය ලබාගැනීම

[1] කෘෂිකාර්මික අංශය - 1 කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදී වන ද්‍රව්‍ය
2 ධීවර කර්මාන්තය
කාර්මික අංශය - 3 පතල් සහ කැණීම් 4 නිෂ්පාදන කර්මාන්ත
5 විදුලිය, ගෑස් සහ ජලය 6 ඉදිකිරීම්
සේවා අංශය - 7 තොග සහ සිල්ලර වෙළෙඳාම
8 හෝටල් සහ ආපනශාලා
9 ප්‍රවාහනය සහ සන්නිවේදනය
10 බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් යනාදිය
11 නිවාස අයිතිය 12 රාජ්‍ය සේවා
13 පෞද්ගලික සේවා

යන කරුණු ය. මේ මඟින් ආර්ථික සංවර්ධනයේදී ආර්ථික ව්‍යුහය කෙරෙහි අවධානය යොමු කළයුතු ක්ෂේත්‍ර පිළිබඳව අදහසක් ලබාගත හැකිය.

සංවර්ධනය සඳහා රටක් ගත්විට වියයුතු දායකත්වය විමසීමේ දී එයට ලැබෙන පිළිතුර වනුයේ එම ව්‍යුහයෙහි ඇති අන්‍යොන්‍ය අංශ බව සඳහන් කළ යුතුය. එම අංශ අතරට සමස්ත නිෂ්පාදන සාධක පද්ධතියම ඇතුළත් වන නිසා එම සාධක සාර්ව මට්ටමින් ගෙන සංවර්ධනයේ දායකත්වයන් හඳුනාගත හැකිය.

## 1.5 ආර්ථිකය හා කෘෂි අංශය

Desai (1998) කෘෂිකාර්මික ආර්ථික විද්‍යාවේ උපලක්ෂණයන් පැහැදිලි කිරීමේදී කෘෂිකාර්මික අංශය පිළිබඳව ඉතා වැදගත් අදහසක් ඉදිරිපත් කර ඇත. ඔහු කෘෂිකාර්මික අංශයේ ලක්‍ෂණ දහයක් පහත දැක්වෙන පරිදි හඳුනාගනී.

1. කෘෂිකර්මය යනු අනන්‍යසාධාරණ කර්මාන්ත *(Unique Industry)* යකි. එයින් අදහස් වන්නේ කෘෂිකාර්මික අංශයට එයට ම ආවේණික වූ ගුණාංගවල පැවැත්මක් පවතින බව ය. විශේෂයෙන් පවුලේ අතිරේක ආදායමක් ලෙස කෘෂිකර්මය යොදාගැනීමට ඕනෑම කෙනෙකුට අවස්ථාව පැවතිය ද කාර්මික අංශය තුළින් එවැන්නක් දැකිය නොහැක.
2. කෘෂිකාර්මික අංශය මූලික අංශයක් *(Basic Industry)* වශයෙන් එයට සම්බන්ධිත හෝ සම්බන්ධ නොවන ආදී ඕනෑම අයෙකුට ආහාර අවශ්‍යතාවය සපුරාලයි. එමෙන්ම අනෙකුත් අංශ සඳහා වන අමුද්‍රව්‍ය සැපයීම ද සිදු කරනු ලබයි.





3. වෙළෙඳපොළ උච්චාවචනයන්ට වහා අනුකූලතාවය දක්විය නොහැකි අංශයක් ලෙස කෘෂිකාර්මික අංශය හඳුනාගනී *(Like Industry).*
4. අනෙකුත් අංශවලට වඩා හීනවන ආන්තික එලදා නීතිය පැහැදිලි ලෙසට කෘෂි අංශය තුළින් දැකිය හැකිය. එය එම අංශය තුළ අජංගම *(Immobile)* ලක්ෂණයකි.
5. කෘෂිකාර්මික අංශයේ සමස්ත නිෂ්පාදනය ද ස්ථිතික (Static) වේ. එහෙත් අනෙකුත් අංශවල නම් වෙළෙඳපොළ ඉල්ලුමේ වෙනස්වීම් අනුව කෙටි දනගැනීමකින් නිමැවුම් විවිධාංගීකරණය හෝ විශේෂීකරණය විය හැකිය.
6. කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතු කාලීන *(Seasonal)* වේ. උදාහරණ ලෙස කන්න අනුව වගා කටයුතු කිරීම, සත්ත්ව පාලනයේ දී එළදෙනෙකුගෙන් කිරි ලබාගත හැක්කේ චක්‍රිය බලපෑම මත වීම ආදිය පෙන්වා දිය හැකිය.
7. බොහෝ කෘෂිකාර්මික භාණ්ඩ, ශාකයක හෝ සත්ත්වයකුගේ කොටසක් වේ. උදාහරණ ලෙස තිරිඟු, කිරි, හරක් මස්, ලොම් ආදිය යි.
8. කෘෂිකාර්මික අංශය විශාල වශයෙන් භූමියේ කොටස් යොදාගනිද්දී අනෙකුත් අංශ ශ්‍රම සේවා නියුක්තිය ඉහළ දමනු ඇත.
9. කෘෂිකාර්මික ක්‍රියාකාරකම් ඉතා සංකීර්ණ *(Complexible)* වේ.
10. ලෝකයේ සියලු ජනවර්ගවල පැරණිතම වෘත්තීය හා ප්‍රධාන වෘත්තීය කෘෂිකර්මාන්තය වේ.

මේ ආකාරයට කෘෂි අංශය තුළින් හඳුනාගත් ලක්ෂණයන්ට අමතරව නූතනයේදී කෘෂි අංශය ලෙස හඳුනාගනු ලබන්නේ කුමන ක්ෂේත්‍රයන් ද යන්න ජාතික ගිණුම් විශ්ලේෂණය තුළින් පැහැදිලි කරගත හැකිය. උදාහරණ වශයෙන් ලංකාවේ කෘෂිකාර්මික අංශය ලෙස කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කටයුතු (සත්ත්ව පාලනය ද ඇතුළුව) එක්ව ගෙන කෘෂිකාර්මික අංශය වශයෙන් හඳුනාගනී[2]. කෘෂිකර්මය යන්නට ධනපාල (1965) ද මෙවන් අදහසක් ඉදිරිපත් කරයි. එනම්, කෘෂිකර්මය යන්නෙන් සාමාන්‍යයෙන් භෝග වගාව හා සත්ත්ව පාලනය යන දෙකම අදහස් කරන බව ය. මේ ආකාරයට කෘෂිකාර්මික අංශය පිළිබඳව පැහැදිලි අදහසක් ලබා ගැනීමෙන් එය ආර්ථික සංවර්ධනයට කෙරෙන දායකත්වය පුළුල්ව විග්‍රහ කළ හැකිවේ.

[2] ශ්‍රී ලංකා මහ බැංකුව. (2007). වාර්ෂික වාර්තාව - *2006.* කොළඹ.





## දෙවන පරිච්ඡේදය

# සංවර්ධන ක්‍රියාවලියේදී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරයඃ නූතන පොදු අදහස

## 2.1 හැඳින්වීම

පළමු පරිච්ඡේදයේ දී සඳහන් කළ ආකාරයට සංවර්ධනය යනු ක්‍රියාවලියකි. එහිදී ආර්ථිකයේ එක් එක් අංශවල දායකත්වය පිළිබඳව ඒ ඒ ආර්ථිකවිද්‍යා උප විෂය ක්ෂේත්‍රයන් යටතේ විග්‍රහ කෙරේ. කෘෂි ආර්ථිකවිද්‍යා විෂයය තුළින් කෘෂිකාර්මික අංශය ආර්ථික සංවර්ධනය සඳහා කෙරෙන දායකත්වය පිළිබඳව විවිධ අදහස් න්‍යායාත්මකව, ප්‍රායෝගිකව යනාදි විවිධ ප්‍රවේශයන් යටතේ විග්‍රහ කෙරෙනු ඇත. මේ පිළිබඳව අදහස් ඉදිරිපත් කරන ආරච්චි (2007) කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා අංශ 04 (හතර) ක ඒකාබද්ධ සංවර්ධනයක් අවශ්‍ය බව පෙන්වා දී ඇත. එම අංශ

1. පාරිභෝගික කෘෂිකර්මය (යැපුම් කෘෂිකර්මය)
2. ව්‍යාපාරික කෘෂිකර්මය
3. සත්ත්ව පාලනය
4. ධීවර කර්මාන්තය

යනුවෙන් සඳහන් කළ හැක. මෙම අංශවල සංවර්ධනය උදෙසා විවිධාකාර ක්‍රියාදාමයන් අනුගමනය කළ හැකිය. එහෙත් එම අංශවල ඇතිවී තිබෙන වෘද්ධිය පමණක් සමස්ත ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමාණවත් නොවේ. කෙසේනමුත් ප්‍රනාන්දු (2001) ද මානව තිරසාර සංවර්ධනයන් ඇති කිරීමේ ක්‍රමෝපායයන් ඉදිරිපත්කිරීමේ දී කෘෂිකාර්මික අංශයේ දියුණුව පදනම් වූ සංවර්ධනයක් පිළිබඳව අදහස් ඉදිරිපත්කරයි. එබැවින් මෙම අදහස් අනුව ගම්‍ය වන්නේ සංවර්ධන ක්‍රියාවලියේ දී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය පිළිබඳව පැහැදිලිව අදහස් ඉදිරිපත් වී ඇති බව ය. එම අදහස් ප්‍රධාන වශයෙන් ප්‍රවේශයන් දෙකක් යටතේ

1. න්‍යායාත්මක අදහස හා
2. නූතන පොදු අදහස

යනුවෙන් අධ්‍යයනය කිරීමට යොදාගත හැකිය.





ඌන සංවර්ධිත රටවල් ආර්ථික වශයෙන් සංවර්ධනය කිරීමේදී යොදාගත හැකි ප්‍රධාන උපාය මාර්ග දෙකකි. එනම්,

1. කෘෂිකාර්මික අංශය දියුණුකිරීම මඟින්
2. කාර්මික අංශය දියුණුකිරීම මඟින්

යන උපාය මාර්ගික ක්‍රම තුළිනි (සෝමසුන්දර, 1997). කෙසේනමුත් ආර්ථික සංවර්ධන මාර්ගයක් වශයෙන් කෘෂිකාර්මික අංශය හෝ කාර්මික අංශය යොදාගැනීමේ දී ආර්ථික විද්‍යාඥයින් අතර ප්‍රධාන මත 03 (තුන) ක් ඇති වී තිබේ. එම මතවාද

1. රටක් සාර්ථක ලෙස කාර්මික කිරීම සඳහා තිබෙන එකම පදනම කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ දැමීම
2. දියුණුවන රටවල පවතින දුගී භාවය පිළිබඳ දුෂ්ඨ චක්‍රයන් බිඳ දැමීමේ එකම මාර්ගය එකී රටවල් කාර්මික කිරීම
3. කෘෂිකාර්මික හෝ කාර්මික සංවර්ධනය සැලසුම් වෙන් වෙන්ව ක්‍රියාත්මක කිරීමෙන් සංවර්ධනයක් ලබා ගත නොහැකිය. අංශ දෙකම කෙරෙහි එකවර සැලකිල්ලක් දැක්වීම (සෝමසුන්දර, 1997).

යනුවෙන් ඉදිරිපත්කිරීම යුක්ති සහගත ය. කෙසේනමුත් කෘෂිකාර්මික අංශයට මූලික තැන දිය යුතු යැයි දක්වන ආර්ථික විද්‍යාඥයින් අතර ටී. ඩබ්. ෂූල්ට්ස්, ජේ. ඩබ්. මෙලර්, ජෝර්ජ්සන්, කුස්නෙට්ස්, ජේකොබ් වයිනර්, නිකලොස්, රැනිස්, ෆෙයි, ආතර් ලුවිස් යන ආර්ථික විද්‍යාඥයින් වැදගත් වේ.

කරුණු කුමන ආකාරයෙන් සිදුවුවද 1960 වනතුරු කෘෂිකාර්මික අංශය කෙරහි පසුගාමී මතයක් සමස්ත ආර්ථික චින්තනයන් කෙරෙන් විද්‍යාමාන විය. එහෙත් 1960 න් පසු එනම් *"හරිත විප්ලවයෙන් (Green Revolution)"* පසු කෘෂි අංශය කෙරෙහි වූ අවධානය ඉතා දැඩි විය. 1964 දී මෙක්සිකෝව තිරිඟු

නිෂ්පාදනය තුළින් ලැබූ විප්ලවීය දියුණුව සමඟ 1968 දී USAID හි හිටපු අධ්‍යක්ෂකවරයකු වූ විලියම් ගවුඩ් (Wiliam Grand) මහතා විසින් හරිත විප්ලවයට එම නම තබනු ලැබීය (සෝමසුන්දර, 1997). කෙසේනමුත් හරිත විප්ලවයෙන් පසුව කෘෂිකාර්මික අංශය පිළිබඳ යොමු වූ අවධානයත් සමඟ සංවර්ධන ක්‍රියාවලියේදී එම අංශයෙහි ආයකත්වය පිළිබඳ න්‍යායාත්මක අදහස් දියුණු විය. එහෙත් එම අදහස් ධාරාවන් ක්‍රමයෙන් එතැන් සිට වර්තමානය දක්වා ගමනකිරීම තුළ නූතන වහරෙහි පිළිගන්නා පොදු සම්මතයක් පැහැදිලිව විද්‍යාමාන වේ. ඒ අනුව නූතනයේදී සමස්ත ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට ම කෘෂි අංශය පස්වැදෑරුම් බලපෑමක් කරන බව පෙන්වා දෙනු ලැබේ. එම ප්‍රධාන දායකත්වයන් ලෙස

1. වැඩිවන ආහාර ඉල්ලුම සපුරාලීම
2. කාර්මික අංශයට ශ්‍රමය මුදාහැරිම
3. ආර්ථිකයේ වෙනත් අංශයන්ට අවශ්‍ය ප්‍රාග්ධනය සැපයීම
4. විදේශ විනිමය ඉපයීම වැඩි කරගැනීම
5. කෘෂිකාර්මික භාණ්ඩ සඳහා වූ වෙළඳපොළ පුළුල් කිරීම

යන පංච මහා කරුණු දැක්විය හැකිය (සෝමසුන්දර, 1997).

## 2.1 ආහාර සැපයුම

ශ්‍රී ලංකාව ඇතුළු ඌන සංවර්ධිත රටවල මෙන්ම සංවර්ධිත රටවල ද ආහාර සඳහා ඇති ඉල්ලුමේ ඉහළ ප්‍රවණතාවක් දක්නට ඇත. එයට හේතුව ජනගහනය වර්ධනයවීමත් සමඟ එම වැඩිවන ජනගහනයේ ආහාර අවශ්‍යතා ඉහළයාම ය. මෙහිදී ටී. ආර්. මැල්තස්ගේ අදහස වැදගත් වේ. ඔහු දක්වන ආකාරයට ජනගහනය ගුණෝත්තර ශ්‍රේණියක ආකාරයට වර්ධනය වන විට ආහාර සැපයුම වර්ධනය වනුයේ සමාන්තර ශ්‍රේණියක ආකාරයකටය. එබැවින් මෙමගින් ආර්ථික ගැටලුවක් පැනනගී. කෘෂිකාර්මික නිෂ්පාදනය මඟින් ආහාර ඉල්ලුම සපුරාලීමට





නොහැකි වුවහොත් ආහාර ඉල්ලුම හා සැපයුම අතර අසමබරතාවයක් ඇතිවී මිල මට්ටම ඉහළයාමක් සිදුවේ. එවිට මුළු ආර්ථිකයේ ම උද්ධමනකාරී *(Inflation)* තත්ත්වයක් උද්ගත වේ. එබැවින් කෘෂිකාර්මික අංශය ආහාර සැපයීම යන අංශයෙන් කොපමණ වැදගත් ආර්ථික කාර්යභාරයක් ඉටුකරන්නේ ද යන්න ප්‍රත්‍යක්ෂ ය. තවද සෙසු ආර්ථික කටයුතුවල නියුතු පුද්ගලයන්ගේ ආහාර අවශ්‍යතාවය සැපයිය යුත්තේ ද කෘෂිකාර්මික අංශයට වන අතර ඒ පිළිබඳ වගකීම පැහැදිලි ලෙසට ම කෘෂි අංශයට පැවරේ. මේ අනුව ආහාර නිෂ්පාදනය පිළිබඳ විවිධ ආර්ථිකයන්ගේ උපනතීන් සළකා බලන විට මෙම තර්කය මනාව ගම්‍ය වේ.

ආහාර සැපයීමට අමතරව කාර්මික අංශයට අවශ්‍ය යෙදවුම් කෘෂි අංශය තුළින් සැපයීම ද සිදුවේ. කාර්මික නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ලෙස කෘෂි යෙදවුම් යොදාගැනේ. උදාහරණ ලෙස දුම්කොළ නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය ලෙස දුම්කොළ යොදාගන්නා අතර එම කර්මාන්තවල පැවැත්ම තහවුරු වන්නේ කෘෂි යෙදවුම් වන දුම්කොළ නිසාවෙනි. එසේ නොමැතිව ශ්‍රමය හෝ යන්ත්‍ර සූත්‍ර. ගොඩනැගිලි පැවතියද එම අදාළ අමුද්‍රව්‍ය නොමැතිව කර්මාන්තවල පැවැත්ම තහවුරු නොවේ. මේ නිසා අමුද්‍රව්‍ය සැපයීම අනුව ද කෘෂි අංශය ආර්ථිකයේ වැදගත් මෙහෙයක් ඉටු කරනු ලබයි.

## 2.3 කාර්මික අංශයට ශ්‍රමය මුදාහැරීම

ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ ඉදිරියට ගමන්කිරීමේ දී පැවති තත්ත්වයේ සිට නව තත්ත්වයකට අවතීර්ණ වනු ඇත. ඒ අනුව සමහරවිටෙක කිසියම් ආර්ථික අංශයක ඵලදායකත්වය ඉහළ යනු ඇත. නමුත් එසේ නොවන අවස්ථා ද තිබිය හැකිය. කෘෂිකාර්මික සංවර්ධන ආකෘතීන් බොහොමයක පෙන්වා ඇති පරිදි සංවර්ධනයේදී තාක්ෂණ භාවිතය හා ප්‍රාග්ධන ස්කන්ධය පාදක කර ගනිමින් කෘෂිකාර්මික අංශයේ ඵලදාව ඉහළ යන අතර එමඟින් කෘෂි

අංශය තුළ "ශ්‍රම අතිරික්තයක් *(Labour Sueplus)*" හටගන්නා බැවින් එම අතිරික්ත ශ්‍රමය කාර්මික අංශයට සංක්‍රමණය වීමක් සිදුවේ. මේ බව 02.01 වගුව තුළින් ද පැහැදිලි කරගත හැකිය.

### 2.1 සංඛ්‍යා සටහන

**ශ්‍රී ලංකාවේ 1990-2001 කාලයේ දී කෘෂිකාර්මික හා කර්මාන්ත අංශ අතර සේවා නියුක්ති වෙනස්වීම්**

| වර්ෂය | මුළු සේවා නියුක්ති ප්‍රතිශතය (%) | කෘෂිකාර්මික සේවා නියුක්ති ප්‍රතිශතය (%) | කාර්මික සේවා* නියුක්ති ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 1990 | 100 | 46.8 | 53.2 |
| 1992 | 100 | 42.1 | 57.9 |
| 1994 | 100 | 39.5 | 60.5 |
| 1996 | 100 | 34.4 | 65.6 |
| 1998 | 100 | 40.6 | 59.9 |
| 2000 | 100 | 36.0 | 64.0 |
| 2002 | 100 | 33.1 | 66.9 |
| 2004 | 100 | 34.1 | 65.9 |
| 2006 | 100 | 32.2 | 67.8 |
| 2008 | 100 | 32.6 | 67.4 |
| 2010 | 100 | 32.9 | 67.1 |

මූලය: Nanayakkara, A. G. W. (2004). *Employment and Unemployment In Sri Lanka – Trends, Issues and Options.* Colombo: Department of census and statistics Sri Lanka. and Central Bank of Sri Lanka. (2011). *Annual Report 2010*. Colombo.

සටහන: * මෙම අංශයට නිෂ්පාදන, ඉදිකිරීම්, වෙළඳ හා හෝටල්, සේවා හා වෙනත් අංශ ඇතුළත් කර ඇත.





1990-2010 කාල සීමාව සැලකූ විට ශ්‍රී ලංකාවේ කෘෂි අංශයේ පැහැදිලි සේවා නියුක්ති අපගමනයක් මෙන්ම අනෙකුත් අංශවල සේවා නියුක්ති අධිගමනයක් අවබෝධ කරගත හැකි බව ය. එයින් විද්‍යාමාන වනුයේ කෘෂි අංශයෙන් වියුක්ත වන ශ්‍රමිකයින් ආර්ථිකයේ කාර්මික අංශයේ සේවා නියුක්ත වී ඇති බව ය. එබැවින් කෘෂි අංශය ආර්ථිකය තුළ ඉටුකරන කාර්යභාරයන් අතර සේවා නියුක්ති දායකත්වය ද සුවිශේෂී වන බව මෙයින් තහවුරු වේ.

## 2.4 ප්‍රාග්ධන සම්පාදනය

ආර්ථිකයක් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූලික සාධක අතර ප්‍රාග්ධනයට *(Capital)* විශේෂ තැනක් හිමි වේ. එය නිෂ්පාදනය දියුණු කිරීම සඳහා, සමාජ පිරිවැය සඳහා සහ වෙනත් ඉදිකිරීම්, විදුලිය, ප්‍රවාහනය ආදී කටයුතු සඳහා විශාල වශයෙන් අවශ්‍ය වේ. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් ආර්ථිකයේ යටිතල පහසුකම් *(Infrastructure)* ප්‍රවර්ධනය, ප්‍රමෝධායනය හා නිපැයීම යන අවශ්‍යතාවයන් සඳහා ප්‍රාග්ධනය අත්‍යාවශ්‍ය වේ. මෙහිදී ප්‍රාග්ධනය වශයෙන් මුදල් පමණක් නොව යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි ආදී භෞතික වස්තූන් ද අන්තර්ගත වේ.

මුලින් සඳහන් කළ පරිදි ආර්ථික වර්ධනයක් සමඟ ව්‍යුහාත්මක වෙනස්වීම් හටගනී. එමෙන්ම ආර්ථික සංවර්ධනයේ මුල් අවස්ථාවේ දී ජාතික නිෂ්පාදිතයෙන් වැඩි කොටසක් ලැබෙනුයේ කෘෂිකර්මයෙනි. කෘෂිකාර්මික අංශයේ ඒක පුද්ගල පාරිභෝජන මට්ටම ඒක පුද්ගල ඵලදායී මට්ටමට වඩා අඩු වේගයකින් ඉහළයන්නේ නම් කෘෂිකර්මයෙන් නිපදවන අතිරික්තය ඉහළ යනු ඇත. එම අතිරික්ත ඵලදාව කෘෂි නොවන අංශයන්හි ප්‍රාග්ධන අවශ්‍යතා පිරිමසාගැනීම සඳහා යොදා ගතහැකිය. කෘෂිකාර්මික ඵලදාව අලෙවි කිරීමෙන් ලැබෙන අයභාරය නැතහොත් නිර්යාත කිරීමෙන් ලැබෙන විදේශ විනිමය ප්‍රාග්ධන භාණ්ඩ මිලදීගැනීම

සඳහා භාවිතා කළ හැකිය. කෘෂිකාර්මික අංශයේ ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මූලධනය සමහර විට මානුෂික ප්‍රාග්ධනය මඟින් පිරිමසා ගත හැක. මෙහිදී පරිභෝජන මට්ටම පහත වැටීමට නොදී කෘෂි අතිරික්තය ඉහළ නැංවිය හැකි නම් එමඟින් ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන වියදම් පියවා ගැනීමේ මාර්ගයක් මතු වේ.


තවද කෘෂිකාර්මික අංශය මත පනවන බදු මඟින් රජයේ යෝජනා ක්‍රම සඳහා අවශ්‍ය වියදම් පියවා ගැනීමට හැකි වේ. උදාහරණයක් වශයෙන් යම් ජලාශයක් සෑදීමට අවශ්‍ය ප්‍රාග්ධනය නැතහොත් මුදල් හා යන්ත්‍ර සූත්‍ර අවශ්‍යතා රජයක් ඉටුකර ගනු ලබන්නේ බදු මුදල් මඟිනි. එම බදු මුදල් කෘෂිකාර්මික අංශයේ යම් දායකත්වයක් පැවතීම මඟින් පැහැදිලි වන්නේ රටේ ප්‍රාග්ධන අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ දී කෘෂි අංශය උපකාර වන බව ය. තවදුරටත් විමර්ශනය කරන්නේ නම් කෘෂි අංශයේ ඵලදාව ඉහළයාමක් සිදුවේ නම් එයින් එම අංශයේ සේවා නියුක්තිකයන්ගේ ආදායම ඉහළයාමට පෙළඹවීමක් ඇති වේ. ඔවුන්ගේ ආදායම ඉහළ ගිය විට ඉතුරුම් සඳහා වන මානසික පෙළඹුම ද අනුව පෞද්ගලික ඉතිරිකිරීම් දියුණු වන අතර කෘෂි ශ්‍රමිකයින් ඒවා අනෙකුත් ප්‍රාග්ධන මූලාශ්‍ර එනම්, තැන්පතු, යන්ත්‍ර සූත්‍ර ආදියෙහි ආයෝජනය කිරීම මඟින් අනෙකුත් අංශ වෙත ප්‍රාග්ධනය ගලා යාමක් සිදුවේ. මේ ආකාරයට කෘෂි අංශය සෙසු ආර්ථික අංශ වෙත ප්‍රාග්ධනය සම්පාදනය කිරිම ප්‍රවේශ කිහිපයක් ඇසුරින් සාකච්ඡා කළ හැකි අතර එම කරුණු පහත රූප සටහන මඟින් ද ප්‍රත්‍යක්ෂ කර ගත හැක.





## 2.1 රූප සටහන

### කෘෂි අංශය පදනම් කරගත් ප්‍රාග්ධනය සම්පාදනය කිරිම




### 2.5 විදේශ විනිමය දායකත්වය

කෘෂිකාර්මික අංශයේ වැදගත් පරමාර්ථයක් වශයෙන් විදේශ විනිමය ඉපයීම සහ විදේශ විනිමය ඉතිරි කරගැනීම දැක්විය හැකිය. උදාහරණ වශයෙන් ශ්‍රී ලංකාවේ 1972-1976 පස් අවුරුදු සැලසුම මඟින් ආයාත ආදේශනය තුළින් විදේශ විනිමය ඉතිරි කරගැනීමටත් නිර්යාත වර්ධනය තුළින් විදේශ විනිමය ඉපයීමටත් අරමුණු කර තිබූ බව සඳහන් කළ හැකිය. ලංකාව ඇතුළු තෙවන ලෝකයේ බොහොමයක් රටවල අපනයන සංයුතීන් පිරික්සා

බැලීමේදී පැහැදිලි වන කරුණක් වන්නේ ඔවුන් ප්‍රාථමික අපනයන කෙරෙහි වැඩි නැඹුරුතාවයක් පෙන්වන බව ය. මෙම ප්‍රාථමික අපනයන වන්නේ බොහොමයක් කෘෂි අපනයනයන් ය. 1978 න් පසුව ලංකාවේ ඇඟළුම් කර්මාන්තය වර්ධනය වන තෙක් අපනයන ව්‍යුහය තුළින් විද්‍යමාන වූයේ ද මෙම ලාක්‍ෂණිකය ම ය. එම යුගය වනවිට ලංකාවේ සමස්ත අපනයනවලින් 90%ක් පමණ කෘෂි නිර්යාත වීම මෙම තර්කය යළි යළිත් තහවුරු කරයි. මෙසේ කෘෂි නිර්යාත අපනයනය කරමින් මෙරටට ආනයනය කර ඇත්තේ ප්‍රාග්ධන මූලාශ්‍රයන් ය. එබැවින් ඉතා පැහැදිලි වශයෙන් ම සඳහන් කළ යුත්තේ කෘෂි කිමැවුම් අපනයනය කිරීම මඟින් උපයන විදේශ විනිමය ප්‍රාග්ධන මූලාශ්‍ර ආනයනයට යොදාගැනීම හා කෘෂි නිමැවුම් සිදුකිරීම මඟින් කෘෂි භාණ්ඩ ආනයනය කිරීම වැළකී විදේශ විනිමය මෙරට රඳවා ගැනීමටත් කෘෂි අංශය ක්‍රියාකාරීව දායක වන බව ය.

## 2.6 කෘෂි භාණ්ඩ සඳහා වෙළඳපොළ පුළුල් කිරීම

කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම මඟින් කෘෂි කාර්මිකයින්ගේ ආදායම ඉහළ යන අතර ඒ නිසා කාර්මික භාණ්ඩ සඳහා වූ ඉල්ලුම ඉහළයාමක් සිදුවේ යන තර්කය මෙම කාරණයේ දී වැදගත් වේ. නමුත් මෙයින් අදහස් වන යථාර්ථයට මුහුණ දීමට නම් පැහැදිලි ලෙසට ම කෘෂි නිෂ්පාදන සඳහා වන වෙළඳපොළ පුළුල් කළ යුතුය. එබැවින් ඉන් ගම්‍ය වනුයේ කෘෂි නිෂ්පාදන වෙළඳපොළ පුළුල් කිරිම තුළින් ආර්ථිකයේ සෙසු අංශවල ප්‍රගමනයට එය සුවිශාල පිටිවහලක් වන බව ය.






## 2.7 දරිද්‍රතාව පිටුදැකීම

මෙම සමස්ත කාරණා පද්ධතියට අමතරව තුන්වන ලෝකයේ රටවල් සම්බන්ධයෙන් කෘෂිකාර්මික අංශය තුළින් වැදගත් කාර්යභාරයක් ඉස්මතු වේ. එනම් දුප්පත්කම අඩු කිරීම *(Poverty Reduce)* සම්බන්ධව කෘෂි අංශය වැදගත් ආයෝජනයක් ලෙස කටයුතු කිරීමයි. දරිද්‍රතාව යනු සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන ප්‍රබල ආර්ථික ගැටලුවකි. ලෝකයේ දිළිඳු ජනතාවගෙන් බහුතරය ග්‍රාමීය ජනතාව වනවා මෙන්ම ඔවුන් අතුරින් වැඩි දෙනා කෘෂිකාර්මික කටයුතුවල නිරතව සිටිති (ප්‍රනාන්දු, 2001). එබැවින් ප්‍රායෝගික වශයෙන් දිළිඳුකම අඩු කිරීම සඳහා කෘෂිකාර්මික අංශය මෙම රටවල මූලිකව වගකීමෙන් බැඳේ. මෙය ආකාර දෙකකින් සම්බන්ධ වේ. කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් දිළිඳුකම අඩු කිරීමට හේතු වන අතර, දිළිඳුකම අඩු කිරීමේ වැඩසටහන් කෘෂිකාර්මික වර්ධනය කෙරෙහි බලපානු ඇත. කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා ආයෝජනය කිරීම තුළින් දුගී බවේ විෂම චක්‍රයේ ප්‍රාග්ධන ඌනතා අවස්ථාව බිඳවැටී සමස්ත චක්‍රයම බිඳවැටෙන අතර එයින් ගම්‍ය වනුයේ කෘෂිකර්මය දියුණු කිරීම මඟින් දිළිඳුකම අඩු කළහැකි බවය. එය පහත පරිදි නිරූපනය කළ හැකිය.

## 2.2 රූප සටහන

### දිළිඳුබවේ විෂම චක්‍රය බිඳවැටීම








***විශේෂ සටහන***

ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ දායකත්වය පිළිබඳ නූතන පොදු අදහස මෙලෙස පෙළගැස්විය හැක. නමුත් සමහර ලේඛකයින් මෙම දායකත්වයන් ම වෙනත් ආකාරවලට ද ප්‍රකාශ කරන අවස්ථා ඇත. සේනානායක (2008) මේ පිළිබඳව දායකත්වයන් පහක් පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කරයි

1. නිෂ්පාදන දායකත්වය
2. ශ්‍රම දායකත්වය
3. වෙළඳපොළ දායකත්වය
4. ප්‍රාග්ධන දායකත්වය
5. විදේශ විනිමය දායකත්වය

එහෙත් සමස්ත කාරණා තුළින් පැහැදිලි වනුයේ වර්තමානය වනවිට කෘෂිකාර්මික අංශය ආර්ථික සංවර්ධනයේ දී තම කාර්යභාරය විවිධ පරිදි ඉටු කරන බවය.

## තෙවන පරිච්ඡේදය

# සංවර්ධන ක්‍රියවලියේදී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරයඃ න්‍යායාත්මක අදහස - පළමු කොටස

## 3.1 හැඳින්වීම

ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ එන්ජිම 1950 ගණන්වල දී පිළිගත් ආකාරයට කාර්මික අංශය දියුණු කිරීම නොහොත් "කාර්මිකකරණය *(Industrilization)*" විය. නමුත් මීට ඉහත පරිච්ඡේදයේ දී සඳහන් කළ ආකාරයට ආර්ථික සංවර්ධනයේ පදනම කෘෂිකාර්මික විප්ලවය බව "හරිත විප්ලවයෙන් *(Green Revolution)*" පසුව පිළිගැණුණි. ඒ යටතේ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක පසුබිම පැහැදිලි ලෙස ම ප්‍රවර්ධනය විය. එබැවින් කෘෂි ආර්ථිකවිද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමේ දී මෙකී න්‍යායන් පිළිබඳව විශේෂ අවධානය යොමු කරයි. කෙසේනමුත් මෙලෙස න්‍යායාත්මක පසුබිම දියුණුවීමත් සමඟ කෘෂිකාර්මික හා කාර්මික අංශවල ස්වාධීන දියුණුව නොව උභයාර්ථ සංවර්ධනය සියලු න්‍යායන් තුළින් ආර්ථික සංවර්ධනය කරණ කොට ගෙන අවධාරණය කර ඇති බව ද විශේෂිතව සඳහන් කළ යුතුය.

## 3.2 කෘෂිකාර්මික සංවර්ධනය

ඉහත දී සඳහන් කළ ආකාරයට කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක පදනම පුළුල්කිරීමේ දී මුල් කාලීන ආර්ථික චින්තනයේ සිට ඒ බව හෙළිදරව් කර ඇත. ඒ අනුව "වාණිජවාදයෙන් *(Mercontilisum)*" පසුව එළෙඹි "ෆ්‍රිසියෝක්‍රැට්[3] *(Physiocrats)*" වාදීන්ගේ සිට මෙම තර්කය ආර්ථික චින්තනය තුළට එකතු වී ඇත. ෆ්‍රිසියෝක්‍රැට් වාදයේ පුරෝගාමී චින්තකයා වූ සයිමන් කුස්නට්ස්ට (Quesnay) අනුව ආර්ථික සංවර්ධනය සඳහා **සාධක දායකත්වය** ඇතිවන්නේ දෙන ලද අංශයකින් තවත්

[3] "Early theoretical literatyre on the role Agriclture in Economic Development can be traced to as for back as the eighteenth century in the writings of the Physiocrats" (Sadhu, 2000).





අංශයකට සම්පත් මාරුවීමක් සිදුවීමෙනි. ඔහු දක්වන ආකාරයට කෘෂිකාර්මික අංශය දියුණුවීමෙන් ආර්ථික සංවර්ධනය සඳහා **නිෂ්පාදන දායකත්වයක්** ඇති වේ. කෘෂි අංශය අනෙකුත් අංශයන් සමඟ වෙළඳාමෙහි යෙදෙන්නේ නම් **වෙළඳපොළ දායකත්වයක්** ඇති වේ. එමෙන් ම එම අංශයෙන් අනෙකුත් අංශවලට සම්පත් මාරුවීමක් සිදු වේ නම් එයින් සාධක දායකත්වයක් ඇති වේ. මෙලෙස ප්‍රධාන දායකත්වයන් තුනක් කුස්නට්ස් අවධාරණය කර ඇති බව පැහැදිලිය. එලෙස හුවමාරු කළ හැකි සාධක ශ්‍රමය හා ප්‍රාග්ධනය වන අතර කෘෂිකාර්මික අංශයෙන් ප්‍රාග්ධනය ලබාගැනීමේ දී මතුවන ප්‍රධානතම ගැටලුව නම් රට තුළ කෘෂිකාර්මික අතිරික්තයක් ලබා ගැනීමේ හැකියාවට බාධාවක් නොවන පරිදි එම පරමාර්ථ උදාකර ගැනීමය. එමෙන් ම කුස්නට්ස්ගේ වචනවලින් දක්වන්නේ නම් කෘෂි අංශයේ ආර්ථික වර්ධනය සඳහා වන වෙළඳපොළ දායකත්වය ක්‍රම දෙකක් යටතේ සිදු වේ (සේනානායක, (2008). එනම් දේශීයව හෝ විදේශීයව හෝ කෘෂි නිෂ්පාදනය සඳහා අවශ්‍ය යම් යම් යෙදවුම් අනෙකුත් අංශවලින් ලබාගැනීම හා දේශීය ආර්ථිකයේ අනෙකුත් අංශවලින් හෝ විදේශයන්ගෙන් යෙදවුම් ලබාගැනීම සඳහාත් පාරිභෝගික ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහාත් තම නිෂ්පාදනයෙන් කොටසක් අලෙවිකිරීම හෝ කෘෂිකාර්මික අංශය තුළ ම පාරිභෝජනයට නොගෙන කුමන ආකාරයකින් හෝ තම නිෂ්පාදනයෙන් කොටසක් අන් අයට පැවරුම යන ආකාරවලිනුයි. කුස්නට්ස් පෞද්ගලික වශයෙන් විදේශ විනිමය දායකත්වය ද ප්‍රත්‍යක්ෂ කර ඇත්තේ වෙළඳපොළ දායකත්වය තුළිනි.

ආර්ථික විද්‍යාවේ පියා වශයෙන් සැලකෙන "ඇඩම් ස්මිත්"[4] *(Adam Smith)*" ගේ අදහස් ද මෙහිදී සඳහන් කළ යුතුය. කිසියම් රටක ආර්ථික සංවර්ධනයේ දී ආහාර නිෂ්පාදන දායකත්වයේ ඇති වැදගත්කම ඔහු ද අවධාරණය කර ඇත. ඔහු කෘෂිකාර්මික අංශය වෙළඳ හා අනෙකුත් අංශවලට වඩා ඵලදායී බව දක්වන්නේ ශ්‍රම බලකාය ද පදනම් කරගෙන ය. "*නිකොල්ස්*" දක්වන්නේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් විසින් විශ්වාසය රැඳවිය හැකි ආහාර අතිරික්තයක් ලබාගැනීමට අසමත් වනතුරු ඒවාට ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ පූර්ව කොන්දේසිය සපුරාලීමට නොහැකි බව ය (සේනානායක, 2008). සමස්තයක් ලෙස කෘෂිකාර්මික අංශයේ වැදගත්කම සම්භාව්‍ය ආර්ථික චින්තකයන්ගේ සිට පවා ඇගයීමට ලක් වී ඇති බව මෙහිලා සඳහන් කළ යුතුය.

එලෙස කාරණා දැක්වීමේ දී අමතක කළ නොහැකි චින්තකයෙකු ලෙස "ඩේවිඩ් රිකාඩෝ' *(David Ricardo)*" ගේ අදහස් වැදගත් වේ. ඔහු ස්මිත්ගේ අදහස් තවදුරටත් විශ්ලේෂණය කරමින් තම අදහස ඉදිරිපත් කර ඇත. බදු කුලිය පිළිබඳ අදහස් ඉදිරිපත්කරමින් භූමියේ හීනවන ඵලදා න්‍යායන් නිසා ඇති වන දුර්විපාක වළක්වා ගැනීම සඳහාත් ප්‍රාග්ධන රාශීකරණය පවත්වා ගැනීම පිළිබඳවත් කරුණු ඉදිරිපත් කර ඇත. ධාන්‍ය නිෂ්පාදනය හා යොදා ගන්නා ශ්‍රම ප්‍රාග්ධන ප්‍රමාණයන් ඇසුරින් සිය විශ්ලේෂණය සිදුකරමින් දක්වන්නේ ශ්‍රමයේ ආන්තික හා සාමාන්‍ය ඵලදාවන්ගේ වෙනස කුලිය වන අතර මුල් නිමැවුමෙන් කුලිය හා වැටුප් වියදම අඩු කළ පසු ලාභය ලැබේ. එය ආර්ථිකයේ මුල් නිමැවුම ඉහළයාම සමඟ එනම් ආර්ථික සංවර්ධනය තුළින් මුල් නිමැවුම ඉහළ යනවිට

[4] "Importaance of Agriculture in Economic Development was recognized by the classical writers too. In view of the essential Adam Smith and the Physiocrats lived, it is not suprising to find that the general out look of Adam Smith was not French Political Economy." (Sadhu, (2000).





වැටුප් අරමුදල ද ඉහළ යන අතර ධාන්‍ය ඉල්ලුම ඉහළයාම හා ශ්‍රම ප්‍රමාණය (ජනගහනය) ඉහළයාමත් නිසා ධාන්‍යවල මිල ඉහළයාමත් වන බව ය (Sadhu, (2000). නමුත් කෘෂි අංශයේ පවත්නා හීනවන ඵලදා න්‍යායාත්මක බලපෑම නිසා ලාභයේ කොටස අඩු වේ. මේ තත්ත්වය තුළ කෘෂිකාර්මික සංවර්ධනය ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී කැපී පෙනෙන දායකත්වයක් සපයන බව රිකාඩෝ පෙන්වා දෙයි.

මේ ආකාරයට ආර්ථික විද්‍යා චින්තනයේ ක්‍රමයෙන් ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී කෘෂිකාර්මික අංශයේ කාර්ය පිළිබඳව න්‍යායාත්මක අදහස දියුණු වී ඇත. කෙසේනමුත් පසුගිය දශක හතර හමාරක පමණ කාලය තුළ මේ පිළිබඳ වෙනස් මතයන් දෙකක් එකක් අභිබවා අනෙක වරින් වර ඉස්මතු වෙමින් පැවති බව කියවේ (සේනානායක, 2008). කෘෂිකාර්මික ආර්ථිකවිද්‍යා සාහිත්‍ය විමසා බලනවිට ඉන් පළමු අදහස ලෙස පෙනී සිටින්නේ කාර්මික සංවර්ධනය ලබාගැනීමේ දී ඊට *'උපකාර'* අංශයක් ලෙස කෘෂිකාර්මික අංශයේ ඇති වටිනාකම *(Instrumental Value of Agricultural)* ය. මේ අදහසට අනුව මීට ඉහත පරිච්ඡේදයේ දී සඳහන් කළ පංච මහ දායකත්වයන් ලබාදෙමින් කෘෂිකාර්මික අංශය කාර්මික අංශයේ සංවර්ධනයේ මඟ සකස් කරනු ඇත. මෙම අදහස තුළින් තුන්වන ලෝකයේ රටවල ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සකස්කිරීමේ දී මඟ උපදෙස් ලබාගත් බව ඉතා පැහැදිලි ය. එනම් කෘෂි අංශයේ සංවර්ධනයේ ප්‍රතිලාභ ආර්ථිකයේ සෙසු අංශවල ආයෝජනය කිරීමට සැලසුම් සකස්කිරීම *(Developing Planning)* යි.

එකක් අභිබවා නැඟුණු මත දෙකෙන් ද්වීතීයික මතය වන්නේ කෘෂිකාර්මික අංශය වර්ධනය කළ යුත්තේ එම අංශයේ ම පවතින ස්වභාවික හෙවත් ආවේණික වටිනාකම *(Intrinsic Value)* සලකාබැලීම මඟින් යැයි දක්වන මතය යි. මෙම අදහස ඉදිරිපත් කරන අය තර්ක කරනුයේ කෘෂිකාර්මික අංශය සංවර්ධනය කළ

යුත්තේ කාර්මික අංශයේ දියුණුව තකා නොව එම අංශයේ ම පවතින දුගී දුප්පත්කම, දුෂ්පෝෂණය, සේවා වියුක්තිය හා ග්‍රාමීය ජනගහනය නගර කරා ඇදීයාම හෙවත් ශ්‍රම සංක්‍රමණය *(Labour Migration)* යනා දී වන ගැටලු විසඳා ගැනීමට බව ය. නමුත් Meier පෙන්වා දෙන්නේ දිගු කාලයේ දී මුළු දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයෙන් දායක වන අනුපාතය අඩු කරගැනීමට නම් එම ව්‍යුහාත්මක පරිවර්තනය සපල කරගැනීමට කෙටි කාලයේ දී කෘෂිකාර්මික සංවර්ධනය ලබාගැනීමට ඉවහල් වන සාර්ථක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළයුතු බව ය. විශේෂයෙන් නිරපේක්ෂ දුප්පත්කම[5] *(Absolute Poverty)* අඩු කරගැනීම සඳහාත්, සේවා නියුක්තිය ඉහළ දමාගැනීම සඳහාත් කෘෂිකාර්මික අංශය සංවර්ධනය කළ යුතු බව ඔහු තවදුරටත් අවධාරණය කරයි. මෙයින් විද්‍යමාන වන්නේ Meier දක්වන ආකාරයට සංවර්ධනය ව්‍යුහාත්මක පරිවර්තනය රඳා පවතින්නේ එම රටේ කෘෂිකාර්මික සංවර්ධනයේ ප්‍රගතිය හා ප්‍රමාණය මත බව ය.

මෙම වාතාවරණය තුළ සමස්ත ආර්ථිකයේ සංවර්ධනය උදා කරගැනීම සඳහා කෘෂිකාර්මික අංශය දායක වන්නේ කෙසේ ද? එසේත් නැතහොත් කෘෂිකාර්මික සංවර්ධනය ආර්ථික සංවර්ධනයට දායක වන්නේ කෙසේ ද? යන කාරණයට උත්තර සෙවීමේ දී කෘෂිකාර්මික සංවර්ධන න්‍යායන් කිහිපයක් තුළින් අවශ්‍ය පිළිතුරුකරණය කර ඇත. එම න්‍යායන් අතර

[5] "An absoluate measure of poverty is an attempt to determine the minimum subsistence level: an assessment of income required to purchase what are regarded as the absoluate essentials of life, a specified amount of food, clothing, and shelter and so on." (Sandford, (1977).





1. ෆ්‍රිසියෝක්‍රැට්වාදීන්ගේ කෘෂිකාර්මික සංවර්ධන ආකෘතිය.
   *(The Physiocrat's Model of Agricultural Development)*

2. ලුවිස්ගේ ශ්‍රම අතිරික්තය පිළිබඳ න්‍යාය.
   *(Lewis Theory of Unlimited Supplies of Labour)*

3. ෂුල්ට්ස්ගේ කෘෂිකාර්මික සංවර්ධන න්‍යාය.
   *(Schultz's Theory of Agricultural Development)*

4. ජෝර්ජ්සන්ගේ ද්විත්ව ආර්ථික ආකෘතිය.
   *(Jorgenson's Dual Economy Model)*

5. රානිස් හා ෆෙයිගේ කෘෂිකාර්මික අතිරික්තය පිළිබඳ ආකෘතිය.
   *(The Fei and Ranis Model of Agricultural Development)*

6. මෙලර්ගේ කෘෂිකාර්මික සංවර්ධන ආකෘතිය.
   *(J. W. Mellor's Model of Agricultural Development)*

7. හයාමි හා රුට්ටේයින්ගේ කෘෂිකාර්මික සංවර්ධන ආකෘතිය.
   *(Y. Hayami and V. W. Ruttan Model of Agricultural Development)*

යන න්‍යායන්ගේ අදහස් ඉතා වැදගත් වේ (Desai, (2001). තෝරාගත් න්‍යායන් කිහිපයක් ඇසුරින් ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය කෙබඳු ද? යන්න ඉදිරියේ දී වඩා විග්‍රහාත්මකව ඉදිරිපත් කෙරෙණු ඇත.

## 3.3 ලුවිස්ගේ ශ්‍රම අතිරික්තය පිළිබඳ න්‍යාය හා කෘෂිකාර්මික සංවර්ධනය

කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක තත්ත්වය සාකච්ඡාවට යොමු කිරීමේ දී මහාචාර්ය ඩබ්. ඒ. ලුවිස් *(W. A. Lewis)* විසින් 1954 දී ඉදිරිපත් කළ ශ්‍රම අතිරික්තය පිළිබඳ න්‍යාය *(Theory of Unlimited Supplies of Labour)* වැදගත් ස්ථානයක් උසලනු ලබයි. මෙම න්‍යාය ගොඩනැඟීමේ දී ලුවිස් ද්විත්ව ආකෘතියක් සහිත ආර්ථිකයක් *(Two Sectors Economy)* පිළිබඳ අදහස් කර ඇත. කෙසේනමුත් න්‍යාය ඉදිරිපත් කිරීමේ පසුබිම පිළිබඳ අවධානය යොමුකිරීමේ දී පැහැදිලි වන්නේ ඌන සංවර්ධිත රටවල් සංවර්ධනය කිරීමේ ව්‍යාකූලත්වය ඔහුගේ මෙම න්‍යාය ගොඩනැඟීමේ අදහස සඳහා හේතු වී ඇති බව ය. ඔහු දක්වන ආකාරයට අසීමිත ශ්‍රම සැපයුම හා ප්‍රාග්ධන රාශීකරණය *(Unlimited Supply of Labour and Capital Acumulation)* යන සාධක දෙක මත ආර්ථික සංවර්ධනය පරායත්ත් වන බව යි. ඒ අනුව ඌන සංවර්ධිත රටවල අසීමිත ශ්‍රම සැපයුම්ක් පැවතිය ද ඊට අනුකූල ප්‍රාග්ධන රාශීකරණය දුර්වල තත්ත්වයක පැවතීම නිසා එම ආර්ථිකයන් සංවර්ධනය කිරීමේ අභියෝගාත්මක ගැටලුවකට එම රටවල් මුහුණ දී ඇති බව ඔහුගේ නිගමනය විය. මෙම පසුබිම තුළ ලුවිස්ගේ ශ්‍රම අතිරික්තය පිළිබඳ අදහස් න්‍යායක් වශයෙන් ආර්ථිකවිද්‍යා විෂයයට ප්‍රවේශ වීම සිදු විය (Desai, 2001).

පළමුව ආතර් ලුවිස්ගේ න්‍යාය ගොඩනැඟීමේ උපකල්පන *(Assumption)* පිළිබඳ අවධානය යෙදීම වඩා ප්‍රතිඵලදායක ය. ඔහු මෙහි දි උපකල්පන කිහිපයක් යොදාගනී.





1. ආර්ථිකය අංශ දෙකකින් යුක්ත බව. එනම්,
   - ග්‍රාමීය අංශය / සාම්ප්‍රදායික අංශය *(Subsistence Sector)*
   - නාගරික අංශය / ප්‍රාග්ධනිත අංශය *(Capitalist Sector)*

   යනුවෙනි. නමුත් කාර්මික සංවර්ධනය පිළිබඳව සලකා බැලෙන නිසා මෙම අංශයන් කෘෂිකාර්මික අංශය හා කාර්මික අංශය *(Agricultural Sector and Industrial Sector)* ලෙස හැඳින්වීම ද සාධාරිත ය.

2. සාම්ප්‍රදායික අංශයේ ශ්‍රම අතිරික්තයක් *(Surplus of Labour)* පවතී.

   එයින් අදහස් කරන්නේ ශ්‍රමය අවශ්‍ය ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයක් සාම්ප්‍රදායික අංශය තුළ සිටින / පවතින බවයි. මෙම අංශයේ ශ්‍රමය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ජනගහනයේ වැඩි වීම, බොහෝ දෙනා කෘෂිකර්මාන්තය ජීවනෝපාය ලෙස යොදා ගැනීම, භාහිර වෙනත් ජීවනෝපායක් නොමැති වීම යන කාරණා නිසා මෙම අංශයේ සේවා වියුක්තියක් *(Unemployment)* හා ඌන සේවා වියුක්තියක් *(Under-Unemployment)* හටගෙන තිබේ.

3. සාම්ප්‍රදායික අංශය සාම්ප්‍රදායික තාක්‍ෂණය *(Poor Technology)* භාවිතා කරන අතර නූතන අංශය නැතහොත් ප්‍රාග්ධනිත අංශය නූතන තාක්‍ෂණය හා විද්‍යාව *(Rich Technology & Science)* නිෂ්පාදනය සඳහා යොදා ගනී.

4. ශ්‍රම සංක්‍රමණය පිළිබඳ උපකල්පනයක් ලෙස සිච්චන උපකල්පනයෙන් ඉදිරිපත් කරන්නේ සාම්ප්‍රදායික අංශයේ අතිරික්ත ශ්‍රමයක් පවතින බැවින් දෙන ලද වැටුපක් සඳහා ඕනෑම අවශ්‍ය ශ්‍රමිකයින් සංඛ්‍යාවක් නූතන අංශයට / නාගරික අංශයට මාරු කළ හැකි බව ය.

5. නාගරික අංශයේ සිටින ව්‍යාපාරිකයින් තමන් ලබන අතිරික්ත ලාභය සැමවිට ම නැවතත් ව්‍යාපාරික කටයුතුවලට ආයෝජනය කරයි. ඔවුන් සැමවිට ම ලාභ උපරිම කිරීමට කටයුතු කරයි.

6. ඉතිරිකිරීම් *(Savings)* හා ආයෝජනය *(Investments)* මුළු නිෂ්පාදනයේ වර්ධනය අතර සරල සබඳතාවයක් නාගරික අංශයේ පවතී.

7. තාක්ෂණය ස්ථාවර වේ.

8. නාගරික අංශයේ සේවා වියුක්තියක් නොපවතී.


ලූවිස්ගේ න්‍යායට අනුව සාම්ප්‍රදායික අංශයේ හා නූතන අංශයේ හැසිරීම වෙන වෙනම අධ්‍යයනය කිරීම මඟින් කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ අවබෝධ කරගත හැකිය. සාම්ප්‍රදායික අංශයේ ලක්ෂණ අතර විශාල ජනගහනයක් සිටීම, එක් පවුලකට අයත් සාමාජික සංඛ්‍යාව වැඩි වීම, ඉහළ ජනගහන වර්ධන වේගයක් පැවතීම, යැපීම සඳහා නිෂ්පාදනය කිරීම, ස්වයංපෝෂිත තත්ත්වයක් පැවතීම, තාක්ෂණය සාම්ප්‍රදායික වීම, ප්‍රාථමික කටයුතු මත සමස්ත ආර්ථික කටයුතු රඳා පැවතීම යන ලක්ෂණ වැදගත් වේ.





### 3.1 රූප සටහන

### සාම්ප්‍රදායික අංශයේ ශ්‍රමයේ හැසිරීම (ලූවිස්ට අනුව)



ඉහත රූප සටහනට අනුව $L_{A1}$ - $L_{A2}$ වනවිට ශ්‍රමයේ ආන්තික ඵලදාව ශූන්‍යට වඩා කුඩා හෝ සමාන වේ ($MP_L \leq 0$). ආන්තික ඵලදා වක්‍රය ශ්‍රමයේ ඉල්ලුම් වක්‍රය ලෙස ද හැඳින්විය හැකිය. මෙහි දී ශ්‍රමයේ ආන්තික ඵලදාව ශූන්‍ය වීමෙන් අතිරික්ත ශ්‍රමයක් පවත්නා බව අදහස් වේ. කෘෂිකර්මය ප්‍රධාන ජීවනෝපාය කරගත් සාම්ප්‍රදායික අංශයේ මුළු නිෂ්පාදනය සේවා නියුක්තියක් සමඟ වැඩි වන බව $Y_A$ අඩුවන වේගයෙන් ඉහළට ගමන් කිරීමෙන් ගම්‍ය වේ. එනම් ශ්‍රමයේ ඵලදාව අඩු වන බව ඉන් ගම්‍ය වේ. මේ තත්ත්වය තුළ පවුලේ සාමාජිකයින් කිහිපදෙනෙක් කෘෂිකර්මාන්තයෙන් ඉවත් වී නූතන කාර්මික අංශයට සංක්‍රමණය වේ. එනම් මුළු නිමැවුම තවදුරටත් වැඩි නොවන අවස්ථාව වනවිට පවුලේ ශ්‍රමිකයින් කිහිපදෙනෙකුට එයට දායක විය හැකි බැවින් කිහිපදෙනෙකුගේ ආන්තික ඵලදාව ශූන්‍ය වන බැවින් ඔවුන් ඵලදායී ලෙස වේ. මෙය කෘෂි අංශය ආර්ථික සංවර්ධනයේ දී කාර්මික අංශයට ශ්‍රම සැපයීම් දායකත්වයක් සපයන බවට කළ තර්කය න්‍යාය තුළින් පෙන්වා දීමකි. ඒ අනුව කෘෂිකාර්මික අංශය සංවර්ධනය වීම තුළ එය සමස්ත ආර්ථික වර්ධනයට දායක වන බව පැහැදිලි ය. මෙම සංක්‍රමණය වඩා වේගවත් කරනුයේ නූතන අංශය තුළ කෘෂි අංශයට වඩා ඉහළ වැටුපක් සැපයීමයි.

ලුවිස් දක්වන ආකාරයට නාගරික අංශය පූර්ණ සේවා නියුක්තියක් පැවතීම, ව්‍යාපාරිකයින් තම ලාභය උපරිම කිරීමට කටයුතු කිරීම, තාක්ෂණය දියුණු හා ස්ථාවර මට්ටමක පැවතීම, වැනි ලක්ෂණවලින් දැකගත හැකිය. එමෙන්ම නාගරික අංශයේ වැටුප් ග්‍රාමීය අංශයට වඩා ඉහළ මට්ටමක පවතී. එයට හේතු පාදක වනුයේ සාම්ප්‍රදායික බැඳීම්වලින් ඉවත්වීම සඳහා වැඩි වැටුපක් ගෙවීමට සිදු වීම, පදිංචිවීම හා ඉහළ ජීවන වියදමට සරිලන මූලික අත්තිකාරම් අවශ්‍යවීමත් යන කාරණා ය. මේ අනුව ලාභය ආයෝජනය කිරීම නිසා නිමැවුම ප්‍රසාරණය වේ. එනම් ආර්ථිකය






වර්ධනය වේ. එමෙන්ම ඒ සමඟ ම ශ්‍රමයේ ඵලදාව ද ඉහළයාමක් සිදුවේ.

## 3.2 රූප සටහන

### නාගරික අංශයේ ශ්‍රමයේ හැසිරීම (ලුවිස්ට අනුව)



ලාභය නැවත ආයෝජනය කිරීම නිසා ආර්ථික පද්ධතිය තුළ ප්‍රාග්ධනය වැඩි වේ. ඒ නිසා නිෂ්පාදනය වැඩි වන අතර එම තත්ත්වය නිෂ්පාදන ශ්‍රිතය ඉහළට විතැන් වීමෙන් තහවුරු වේ. මුලින් සඳහන් උපකල්පන යටතේ වැටුප දෙන ලද මට්ටමක පවතින අතර එබැවින් වැටුප් ස්ථාවර වේ. එම ස්ථාවර වැටුප යටතේ $L_{M1}$ ශ්‍රම ප්‍රමාණයේ සිට $L_{M3}$ දක්වා ශ්‍රම සේවා නියුක්තිය ඉහළ යයි. ඒ ඇසුරින් බොහෝ දෙනෙකුගේ සුභසාධනය ඉහළ යයි. නූතන අංශයේ ව්‍යාපාරිකයන් තීරණ ගනු ලබන්නේ ලාභය උපරිම කරන අවස්ථාව වන MC = MR හෙවත් ආන්තික පිරිවැය, ආන්තික ප්‍රතිලාභයට සමාන වන අවස්ථාවේ දී ය. මෙම තත්ත්වය යටතේ මුළු ඵලදා වක්‍රයේ බෑවුමෙන් ප්‍රකාශ වන්නේ ශ්‍රමයේ ආන්තික නිෂ්පාදනය යි. එමඟින් ආන්තික ඵලදා වක්‍රය නිරූපනය වන අතර එය ශ්‍රමයේ ඉල්ලුම් වක්‍රය වේ. එය ඉහළ සිට පහළට බෑවුම් වේ. $L_{M1}$ ශ්‍රමික ප්‍රමාණයක් යටතේ $OABL_{M1}$ ප්‍රමාණය යනු මුළු නිෂ්පාදනය වේ. එයින් $OW_MBL_{M1}$ ප්‍රමාණය වැටුප් පිරිවැය වන අතර $W_MAB$ යනු ව්‍යාපාරික ලාභය වේ. එම ලාභය නැවත නැවත ආයෝජනය කිරීම මඟින් මුළු නිෂ්පාදනය වැඩි වේ. එයින් TP වක්‍රය ඉහළට විතැන් වේ. එපමණක් ද නොව $MP_L$ වක්‍රය ද ඉහළට විතැන් වේ. මෙයට බලපානුයේ ආයෝජනය වැඩි කිරීම මඟින් ප්‍රාග්ධනය ද ඉහළ යන ($K_{M1}$ - $K_{M2}$) බැවිනි. මෙම ප්‍රස්තාරය තුළින් හඳුනා ගතහැකි තවත් කාරණයක් වන්නේ සාම්ප්‍රදායික අංශයේ වැටුප ($W_A$) හැමවිටම නූතන අංශයේ වැටුපට ($W_M$) වඩා ඉහළ මට්ටමක පවතින බව ය. මෙම ආකෘතිය මඟින් ග්‍රාමීය අංශයේ අතිරික්ත ශ්‍රමය නාගරික අංශයට සංක්‍රමණයවීමත් ඉදිරිපත් කළ ද එම අංශයේ අතිරික්ත ශ්‍රමය අවසන් වූවිට නාගරික අංශය කොතරම් ඉහළ වැටුපක් ලබාදුන්න ද තවදුරටත් ශ්‍රමය සංක්‍රමණයවීමක් සිදු නොවේ.






මෙම න්‍යාය මඟින් කෘෂි අංශයේ දියුණුව කාර්මික අංශයට බලපාන අතර එම උභය අංශයන් දියුණුවීමෙන් සමස්ත ආර්ථිකය සංවර්ධනය වන බව පෙනේ. කෙසේනමුත් මෙම න්‍යායට විවේචන කිහිපයක් එල්ල වී ඇත. විශේෂයෙන් නාගරික අංශයේ ද අතිරික්ත ශ්‍රමයක් පැවතීම වර්තමානයේ දැකිය හැකි අතර එම කාරණය මෙමඟින් අමතක කර ඇත. ලුවිස්ට අනුව ව්‍යාපාරිකයින් සැමවිට ම ලාභය උපරිම කිරීමට කටයුතු කරන අතර ඒ සඳහා ස්ථාවර තාක්‍ෂණයක් භාවිතා කරයි. එමෙන් ම ලාභය නැවත නැවත ආයෝජනය කිරීමට ද පෙළඹේ. එහෙත් ව්‍යාපාරිකයින් ලාභ උපරිම කිරීම සඳහා ව්‍යාපාරයේ ප්‍රමාණය පුළුල් කිරීමේ දී වැඩි වැඩියෙන් ප්‍රාග්ධන සූක්‍ෂම තාක්‍ෂණය යොදා ගෙන ඒ සඳහා ආයෝජනය කරයි. එනම් තාක්‍ෂණය අස්ථාවර වේ. එවිට ශ්‍රමය සඳහා වන ඉල්ලුම ස්ථාවර වේ. නමුත් ව්‍යාපාරිකයින්ගේ ලාභය පමණක් ඩැඩි වේ. නමුත් ලුවිස් මෙම ප්‍රායෝගිකත්වය බැහැර කර ඇත. තවද නාගරික අංශයේ ස්ථාවර වැටුපක් පිළිබඳ දක්වන අදහස ප්‍රායෝගික නොවන්නකි.

ලුවිස්ගේ ශ්‍රම අතිරික්තය පිළිබඳ න්‍යාය තුළින් ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී එය ක්‍රියාවලියක ආකාරයෙන් ගලා යාමක් පවතී. එම ක්‍රියාවලිය *(Process)* පහත රූප සටහන තුළින් විස්ථාපනය කළ හැකිය (Desai, 2001).

## 3.3 රූප සටහන

### ලුවිස් දක්වන සංවර්ධන ක්‍රියාවලිය




## 3.4 කෘෂිකාර්මික අතිරික්තය පිළිබඳ රානිස් හා ෆෙයි ආකෘතිය

### 3.4.1 හැඳින්වීම

ශ්‍රම අතිරික්තය පිළිබඳ ආතර් ලුවිස්ගේ න්‍යායේ පැවති අඩුපාඩු ඉවත් කිරීම වෙනුවෙන් කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ වඩා සාර්ථක යැයි ඉදිරිපත් කළ අදහසක් 'මහාචාර්ය ජෝන් ෆෙයි' *(John Fei)* හා 'මහාචාර්ය ගුස්ටෝව් රානිස් *(Gustav Ranis)* විසින් මෙම න්‍යාය ආර්ථික විද්‍යාවට දායාද කළහ. ලුවිස්ගේ ශ්‍රම සැපයුමේ අතිරික්ත න්‍යාය මඟින් කෘෂිකාර්මික සංවර්ධනය තෘප්ත කරන





විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට අසමත් විය. ඒ අනුව මොවුන්ගේ මතවාදය ඉදිරියට පැමිණියේ ය. නමුත් දෙපාර්ශවයේ ම අරමුණ එකක් විය. එනම් ඌන සංවර්ධිත රටවල සංවර්ධනය එකතැන පල්වීමට හේතු සොයා බැලීම යි. ෆෙයි හා රානිස් ඔවුන්ගේ *'Theory of Economic Devolopment"* යන ලිපිය මඟින් මෙම අදහස් ඉදිරිපත් කළේය.

ලුවිස්ගේ ආකෘතිය මෙන්ම ෆෙයි හා රානිස් දෙදෙනා ද ශ්‍රම සැපයුම පිළිබඳ අවධානය යොමුකරයි. ද්විත්ව ආර්ථික ක්‍රමයක් සහිත ආර්ථික පදනමක සිට සංවර්ධනීය අදහස දක්වන මොවුන් පෙන්වා දෙන්නේ එවන් ආර්ථිකයක මූලික බැඳීම පවතින්නේ කෘෂිකාර්මික අංශයේ බව ය. එම අංශයේ සිට කාර්මික අංශය වෙත ක්‍රමානුකූල විතැන්වීමේ ක්‍රියාවලියක්, ජනගහනය සංක්‍රමණයවීමෙන්, කෘෂි හා කාර්මික අංශ අතර බැඳීම දිරිමත්කිරීමෙන්, කාර්මික සේවා නියුක්තිය පුළුල්කිරීමෙන් හා එහි නිමැවුම වැඩි කිරීමට මෙන්ම ඒ හා සමානව කෘෂි අංශයේ ඵලදායීතාව ප්‍රමාණවත් පරිදි වර්ධනය කිරීම ආදී ක්‍රියාපටිපාටීන් හරහා සිදුවිය යුතුය. තවදුරටත් සරලව පැහැදිලි කළහොත් රානිස් හා ෆෙයි පෙන්වා දෙන්නේ ජනගහනයේ කුඩා කොටසක් නැතහොත් ප්‍රතිශතයක් සමස්ත ආර්ථිකයේ ම ආහාර හා අමුද්‍රව්‍ය සැපයීම සඳහා අවශ්‍ය සවිබලය නො අඩුව ලබා දිය හැකි බව යි. එයින් ගම්‍යාර්ථ වන්නේ ආර්ථිකයේ සමස්ත සංවර්ධනයේ දී එම ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගෙනයාමට අවශ්‍ය ජීව ඉන්ධන කෘෂිකාර්මික අංශය මඟින් සැපයෙන බව ය. මෙවුන්ගේ මෙම අදහස් ලිපියක් වශයෙන් මුලින් ම ඉදිරිපත් වූ අතර 1964 දී එය ග්‍රන්ථයක් වශයෙන් ප්‍රකාශයට පත් විය.

ෆෙයි හා රානිස් ශ්‍රම අතිරික්තය පිළිබඳ සංකල්පයෙන් අවධාරණය කරනුයේ ඌන සංවර්ධිත රටවල ජනගහනයෙන් වැඩි කොටසක් සේවා නියුක්තව පවතින්නේ සාම්ප්‍රදායික කෘෂි අංශයේ බැවින් ද එම ආර්ථිකයන් පසුගාමී තත්ත්වයෙන් දිගු කාලීනව ස්ථතික මට්ටමේ පැවතීම *(Stagnant)* ද ආදී කාරණාද්වය අතර යම්

ඒකායන බැඳීමක් පැවතිය හැකි බව ය. ඒ අනුව ඔවුන් කෘෂිකාර්මික නොවන අංශ මෙම ආර්ථිකයන්ගේ පැවතීම පිළිබඳ දෝලනයක් නොවන බව දක්වන අතර නමුත් ඒවාට සීමා සහිත ප්‍රාග්ධනයක් උරුම වීම, ශ්‍රම බලකාය ප්‍රවර්ධනය වීම, ආදී තත්ත්වයන් හමුවේ එම අංශවල ප්‍රගතිය ආර්ථිකයට බලපෑම පිළිබඳ ප්‍රසිද්ධියක් ලැබී නොමැත.

### 3.4.2 න්‍යායාත්මක විමසුම

කෙසේනමුත් ලුවිස් න්‍යායේ දුර්වලතා ප්‍රතිනිර්මාණය නොකර ඒවාට ප්‍රතිකර්ම යෙදීම සඳහා රානිස් හා ෆෙයි ඉදිරිපත් කළ ආකෘතියේ පහත දැක්වෙන උපකල්පන යොදා ගෙන තිබේ.

1. ලුවිස් මෙන්ම මොවුන් ද ආර්ථිකය ද්විත්වාකාර බව උපකල්පනය කරයි.

   එම අංශ වනුයේ ක්‍රියාකාරී කාර්මික අංශය *(Industrial Sector)* හා සාම්ප්‍රදායික කෘෂිකාර්මික අංශය *(Traditional Agricultural Sector)* යන ද්විත්වය යි. එම සාම්ප්‍රදායික අංශය අඩු ක්‍රියාකාරීත්වයක් පෙන්වයි.
2. භූමියේ සැපයුම ස්ථාවරයි.
3. ජනගහන වර්ධනය බහිර්ජන්‍ය සංසිද්ධියකි. එනම් දෙනු ලබන විචල්‍යයකි.
4. වැඩ කරන ශ්‍රමිකයින් විචල්‍ය සාධකය වන අතර ස්ථාවර පරිමාණානුකූල ඵල *(Constant Return to Scale)* පවතී.
5. කාර්මික අංශයේ වැටුප ස්ථාවර වේ.





6. කෘෂිකාර්මික අංශයේ ප්‍රාග්ධන රාශීකරණයක් *(Capital Accumulation)* නොමැති අතර ඉඩම් ප්‍රතිසංස්කරණයක් *(Land Reclamation)* ද සිදු නොවේ.
7. කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදනය භූමිය *(Land)* හා ශ්‍රමය *(Labour)* යන නිෂ්පාදන සාධක මත තීරණය වේ.
8. කාර්මික අංශයේ නිමැවුම ප්‍රාග්ධනය *(Capital)* හා ශ්‍රමය යන සාධක මත තීරණය වන අතර නිෂ්පාදන සාධකයක් වශයෙන් භූමියට කාර්ය පටිපාටියක් ද නොමැත.
9. කෘෂිකාර්මික හා කාර්මික යන අංශ දෙකටම කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදන සැපයීමක් සිදු වේ.
10. ශ්‍රමයේ ආන්තික ඵලදාව *(Marginal Productivity of Labour)* යම් ලක්ෂයක දී ශුන්‍ය වේ. ජනගහනය අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි නම් ශ්‍රමයේ ආන්තික ඵලදාව ශුන්‍ය වන විට කෘෂිකාර්මික අංශයට කිසිඳු අහිමිවීමක් නොමැතිව කාර්මික අංශට ශ්‍රමය මාරු කළ හැකිය.

මෙලෙස උපකල්පන කිහිපයක් මත තම න්‍යාය ඉදිරිපත් කළ මෙම මහාචාර්යවරුන් දෙදෙනා ශ්‍රම අතිරික්තයේ වර්ධනය තෙවැදෑරුම් කර ඉදිරිපත් කරයි. නැතහොත් ශ්‍රම අතිරික්තයේ අවධි තුනක් දැක ගත හැකි බව පෙන්වීය. එම අවධි තුන පහත පරිදි වේ.

1. පළමු අවධියේ දී සැඟවුනු සේවා වියුක්තියක් *(Disguised Unemployment)* පවතී. ඔවුන් කෘෂි නිමැවුම සඳහා කිසිඳු දායකත්වයක් ලබා නොදේ. එබැවින් ඔවුන් ඉතා පහසුවෙන් කාර්මික අංශයට සංක්‍රමණය කරවිය හැකිය. නැතහොත් කෘෂිකාර්මික අංශයට බාධාවක් නොවන පරිදි ඔවුන් එම

අංශයෙන් ආර්ථිකයේ අනෙකුත් අංශවලට යොමු කළ හැකිය.

2. දෙවන අවධියේ දී කෘෂිකාර්මික ශ්‍රමිකයින් කෘෂිකාර්මික නිමැවුමට දායකත්වයක් ලබා දෙන අතර නමුත් ඔවුන්ගේ වැටුප් කාර්මික අංශයට වඩා පහළ මට්ටමක පවතී. එබැවින් ඔවුන් ද පහසුවෙන් කාර්මික අංශයට මාරු කළ හැකිය.

3. තෙවන අවධියේ දී 'ස්වයං තිරසාර වර්ධනයක්' *(Self Sustained Growth)* වෙනුවෙන් කෘෂිකාර්මික ශ්‍රමිකයින් එකතු වන අතර කෘෂිකාර්මික නිමැවුමට ඔවුන්ගේ දායකත්වය ද ලබා දේ. මෙම අවධිය වන විට කෘෂිකාර්මික අංශයෙන් බැහැර කරන අතිරික්ත ශ්‍රමය වාණිජකරණය වේ.

යතෝක්ත සඳහන් කළ පරිදි රානිස් හා ෆෙයි දෙදෙනා ශ්‍රම අතිරික්තයේ අවධි තුනක් පමණක් නොව සමස්ත ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ද

1. කෘෂි අංශයේ සංවර්ධනය
2. කාර්මික අංශයේ සංවර්ධනය
3. කෘෂිකාර්මික අතිරික්තය සාමාන්‍යකරණය කිරීම
4. කෘෂිකාර්මික අතිරික්තයේ වැටුප් අරමුදලක් වශයෙන් වන ක්‍රියාකාරීත්වය
5. ශ්‍රමය වෙන් කිරීමේ අවධිය
6. සමබර වර්ධනය

යනුවෙන් අවධීන් 06 ක් යටතේ ඉදිරිපත් කර ඇත. ඒ අනුව මොවුන්ගේ ආර්ථික සංවර්ධනය පිළිබඳ කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය ඇතුළත් වර්ධන ආකෘතිය ක්‍රමානුකූල පියවරාවලියක් වශයෙන් ගමන් කරන බව පැහැදිලි ය.






ආර්ථික සංවර්ධනය පිළිබඳ ජෝන් ෆෙයි හා ගවුස්ටෝ රානිස් විසින් ඉදිරිපත් කළ වර්ධන ආකෘතියෙහි පදනම වන්නේ කෘෂිකාර්මික අංශය බව ඉහත කරුණු අනුව පැහැදිලි වේ. ඔවුන් දක්වන ආකාරයට කෘෂි අංශය අධි ජනගහනයේ ගැටලුවලින් සන්නද්ධ වී ඇති අතර එය තවදුරටත් ඌන සේවා වියුක්තියේ අභියෝගයන් ඉදිරිපත් කිරීමට මූලනය වී ඇත. තවද සැඟවුනු සේවා වියුක්තියක් හා ශ්‍රම අතිරික්තයක් පැවතීම කෘෂි අංශයේ පැවැත්මට යම් පීඩනයක් එල්ල කරයි. කෘෂිකාර්මික අංශය තුළ පවතින්නේ භූමිය ප්‍රධාන වූ හිඟ ස්වභාවික සම්පත් වන බැවින් මෙම තත්ත්වය භූමි - ශ්‍රම අනුපාතයට *(Land - Labour Ratio)* අයහපත් බලපෑමක් එල්ල කළ හැකිය. තවද තාක්ෂණය ස්ථාවරය යන කොන්දේසිය යටතේ භූමියේ ප්‍රමාණය වැඩි නිසාත්, විශාල වශයෙන් වගා කර ඇති නිසාත් කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදන හීනවන න්‍යායට මුහුණ දෙන බව මොවුන් පෙන්වා දෙයි. එබැවින් කෘෂිකාර්මික නිමැවුම අඩුවන වේගයෙන් වර්ධනය වේ. මේ නිසා තවදුරටත් ශ්‍රමයේ ආන්තික ඵලදාව හීන වේ. මෙම වාතාවරණය මතු දක්වෙන රූප සටහන තුළින් විශ්ලේෂණය කළ හැකිය.

## 3.4 රූප සටහන

## කෘෂිකාර්මික අංශයේ ශ්‍රමයේ හැසිරීම

## (රානිස් හා ෆෙයි ආකෘතියට අනුව)









යෙදවුම් සාධකයක් ලෙස ශ්‍රමය යොදා ගෙන රානිස් හා ෆෙයි කෘෂිකාර්මික අංශය පිළිබඳ පැහැදිලි කිරීම ඉහත රූප සටහන තුළින් පෙන්වයි. A රූපයෙහි තිරස් අක්ෂයෙන් ශ්‍රමයත් සිරස් අක්ෂයෙන් භූමි ප්‍රමාණයත් දක්වන අතර A, B, C යනුවෙන් නිමැවුම් සමෝච්ඡ රේඛා (සම නිමැවුම් වක්‍ර) නිරූපනය කරයි. OM හා ON යනු මායිම් රේඛා දෙකකි. ඒවා මගින් සාධකවල ආදේශකතාවය දක්වන අතර එම රේඛා දෙකින් ආරවණය වී ඇති ප්‍රදේශයේ දී සාධකවල ආදේශ කිරීමේ හැකියාව දක්වයි. B සම නිමැවුම් වක්‍රය S ලක්ෂයේ සිට තිරස් අක්ෂයට සමාන්තර වේ. එනම් තවදුරටත් ශ්‍රමය ඉහළ දැමීම ඵලදායක නොවන බව පෙන්වයි. එයට හේතුව මුළු ඵලදායීතාව ස්ථාවර වීමයි. එහි Ot මගින් අදාළ ශ්‍රම ප්‍රමාණය සමඟ යෙදවිය හැකි භූමියේ ප්‍රමාණය අදහස් වේ. Es යනු ශ්‍රම බලකායේ අතිරික්තයයි. එනම් කෘෂි අංශයේ නිමැවුම වෙනස් නොකර ශ්‍රම බලකාය වැඩි කළ හැකි අතර එම කොටස වැඩි නොකර පැවතුන හොත් ඔවුන් අතිරික්ත ශ්‍රමිකයින් වේ. මෙම අතිරික්ත ශ්‍රමිකයින් පහසුවෙන් ආර්ථිකයේ අනෙකුත් අංශවලට සංක්‍රමණය කළ හැකිය. එයට හේතුව මොවුන් තවදුරටත් කෘෂි අංශයේ පවත්වා ගැනීම යනු එහි ශ්‍රමිකයින්ගේ ආන්තික ඵලදාව ක්‍රමයෙන් හීනවීමයි. ඒ අනුව මෙයින් තවදුරටත් ගම්‍යවනුයේ කෘෂිකාර්මික අංශයේ මුළු ඵලදාව අඩුවන වේගයෙන් වර්ධනය වන අතර එම නිසා ආන්තික ඵලදාව ඉහළ සිට පහළට බෑවුම් වන බව (B හා C ප්‍රස්තාර සටහන් බලන්න) යි.

කෘෂි සංවර්ධනයෙන් පසුව ඔවුන් පෙන්වාදුන් ක්‍රියාවලියේ මීළඟ අවධිය වනුයේ කාර්මික සංවර්ධනයයි. ඉහත දැක්වූ පරිදි කෘෂිකාර්මික අංශයෙන් ඉවත් වන ශ්‍රමිකයින් ආර්ථික පද්ධතිය තුළට නැතහොත් ඵලදායී නිෂ්පාදන ක්‍රියාවලියට දායක කරගැනීමට නම් කාර්මික අංශයේ කාර්යභාරය අවශ්‍ය වේ. එය අවශ්‍යතාවයක් නොව අත්‍යාවශ්‍යතාවයකි. මෙම අංශයේ නිෂ්පාදන ධාරිතාවය හා වර්ධනය සඳහා කෘෂි අංශයෙන් නිදහස් වන ශ්‍රමිකයින්ට අතිරේකව

භූමිය, ශ්‍රමය හා ප්‍රාග්ධනය ඇතුළුව අත්‍යාවශ්‍ය ප්‍රාථමික යෙදවුම් කාර්මික අංශය තුළ ගැබ්ව පවතී. එම යෙදවුම් කෘෂි අංශය තුළින් අන්තර්ග්‍රහණය කරගැනීම නොවළහා කළ යුතුය.

**3.5 රූප සටහන**

**කෘෂි අංශයේ වැටුප් වෙනස්වීම හා කාර්මික අංශයේ ශ්‍රම සැපයුම් වක්‍රය**








ඉහත ප්‍රස්තාරයෙහි A සටහන මඟින් $N_0$, $N_1$, $N_2$ යනුවෙන් අංශ දෙකෙහිම නිෂ්පාදන ප්‍රමාණ වක්‍ර නිරූපනය කෙරේ. රානිස් හා ෆෙයි දක්වන ආකාරයට අංශ දෙකෙහිම පවතින්නේ ස්ථාවර පරිමාණානුකූල ඵල වන අතර $OA_0$, $OA_1$, $OA_2$ යනුවෙන් විස්තර මාර්ගයක් (Explan Path) දක්වයි. එය ශ්‍රම බලකායේ ක්‍රමවත් වැඩිවීම දක්වමින් ක්‍රමයෙන් ඉහළට ගමන් කරයි. ශ්‍රමය තුළින් කෘෂි අංශයේ නිමැවුමත් ප්‍රාග්ධනය මඟින් කාර්මික අංශයේ නිමැවුමත් අදහස් කළහොත් $L_0$ සිට $L_2$ දක්වා ක්‍රමිකව කෘෂි අංශයේ වර්ධනය ද $C_0$ සිට $C_2$ දක්වා කාර්මික අංශයේ වර්ධනය ද පෙන්වනු ඇත. ෆෙයි හා රානිස් කෘෂිකාර්මික අංශය කාර්මික අංශයට ශ්‍රමය සැපයීමේ ප්‍රධාන මූලාශ්‍රය වශයෙන් සළකා ඇති අතර, ඉන් කාර්මික අංශයට කෘෂි අංශයෙන් ශ්‍රමය මිලදී ගත හැකි බව දක්වයි. ඒ අනුව කාර්මික අංශයේ සැපයුම පුළුල් වන අතර එය $S_0$ සිට $S_2$ දක්වා පෙන්වයි (B ප්‍රස්තාරයෙහි). මෙහිදී කෘෂිකාර්මික අංශයේ වැටුප ස්ථාවර වන බව OS මඟින් ගම්‍ය වන අතර $S_3$ වල සිට කාර්මික අංශයේ ශ්‍රම සැපයුම් වක්‍රය නිර්මාණය වේ. එලෙස OS දක්වා වැටුප ස්ථාවර වන්නේ සත්‍ය වැටුප වේ. එනම් මෙයින් ගම්‍ය වනුයේ අතිරික්ත ශ්‍රමිකයින් ලබාගැනීමට හැකියාව පවතින්නේ සත්‍ය වැටුප් වැඩි කළහොත් පමණක් බව පැහැදිලිය. ඒ අනුව විවිධ ප්‍රාග්ධන මට්ටම්වලට අනුරූපව ආන්තික ඵලදා වක්‍රයන් නිර්මාණය කළ හැකිය (B ප්‍රස්තාරය). මුලින්ම කාර්මික අංශයේ ප්‍රාග්ධන තොගය $C_0$ මට්ටමේ පවතින විට සමතුලිත සේවා නියුක්ති ලක්ෂ්‍යය වන්නේ $S_0$ ලක්ෂ්‍යය වන අතර සැපයුම් වක්‍රය ආන්තික ඵලදා වක්‍රය මඟින් ඡේදනය වන බැවින් සමතුලිත සේවා නියුක්තිය ඒ ඒ ප්‍රාග්ධන මට්ටම් අනුව විවිධ පරිදි වටහා ගත හැකිය. B සටහනෙහි අඳුරු කළ කොටසින් සමතුලිත ලාභය පෙන්නුම් කරන ඔවුන් එම ලාභය ආයෝජන අරමුදල්වල ප්‍රධාන මූලාශ්‍රය ලෙස කාර්මික අංශය තුළ වැදගත් කාර්යභාරයක් ඉටුකරන බව දක්වයි. මෙපරිද්දෙන් කාර්මික අංශය කෘෂි අංශයේ යෙදවුම් මත යැපෙමින් සාර්ථක ලෙස කාර්මික දියුණුවක් ලාභය ආයෝජන මූලාශ්‍රය වශයෙන් යොදා

ගැනීමෙන් සිදුවන බව රානිස් හා ෆෙයිගේ වර්ධන ආකෘතිය තුළින් විද්‍යමාන වන බව මෙම විශ්ලේෂණය තුළින් ගම්‍ය වේ.

කෘෂිකාර්මික අංශයේ අතිරික්තය සාමාන්‍යකරණය කිරීම ලෙස ෆෙයි හා රානිස් විසින් සිය සංවර්ධන ක්‍රියාවලියේ දී තෙවන අවධිය ඉදිරිපත් කරති. සැඟවුනු ඉතුරුම් යොදා ගනිමින් කෘෂිකාර්මික අංශයේ අතිරික්තයට සුදුසු ආයෝජනයක් කිරීම මෙමඟින් අදහස් කරයි. ඒ සඳහා එම අංශය පුළුල් කළ යුතුය. ඒ අනුව පවතින අතිරික්තය අන්තර්ගහණය කිරීම සඳහා ආයෝජන අවස්ථාවන් පුළුල් කිරීමට ආර්ථිකයේ ඉතුරුම්වලට විශාල වගකීමක් පැවරේ. ඒ අනුව කෘෂි භාණ්ඩවල පවතින අතිරික්තය තුළින් පුද්ගලයින්ගේ ආදායම ඉහළ ගොස් ඉතුරුම් බිහිවන අතර එම ඉතුරුම් නැවත වරක් ආයෝජනය කිරීම මඟින් තුන්වන අවධියේ දී අපේක්ෂා කරනුයේ එම අංශයේ පුළුල් පරාසයක විහිදීමකි. මෙලෙස කෘෂි භාණ්ඩ අතිරික්තයක් හටගන්නේ ශ්‍රමිකයින්ගේ සාමාන්‍ය ඵලදාව අභිබවා කෘෂි නිමැවුම වර්ධනය වීම නිසාවෙනි. මුලදී සඳහන් කළ පරිදි කෘෂි අංශයේ ශ්‍රම අතිරික්තය ඉහළ යාමෙන් එය කාර්මික අංශය තුළට බෙදාහැරීමක් කළ හැකිය. මෙම තත්ත්වය 3.5 වන රූප සටහනෙහි B කොටස තුළින් තහවුරු කර ගත හැකිය. ස්ථාවර භූමි ප්‍රමාණයක් පවතින බව සිතන අතර මුළු ජනගහනය OP මඟින් දක්වයි. මුළු කෘෂි නිමැවුම PM වේ. ඒ අනුව ශ්‍රමයේ මුළු සාමාන්‍ය ඵලදාව MP/OP වේ. එමෙන්ම මූර්ථ වැටුප් සමාන වේ. B රූප සටහන මඟින් මුළු කෘෂිකාර්මික ශ්‍රම බලකාය OP වන අතර වැඩි වශයෙන් පවතින ශ්‍රම සංඛ්‍යාව PQ වේ. මෙම ශ්‍රමිකයින් කොටස කාර්මික අංශයේ බෙදාහැරීමක් කළ යුතුය.

තුන්වන අවධියේ දී කෘෂිකාර්මික අතිරික්තය සාමාන්‍යකරණය කිරීම යනුවෙන් ඔවුන්, එම අංශයේ අතිරික්ත ශ්‍රමය ශ්‍රම බලකාය තුළට ඵලදායී ලෙස අන්තර්ගහණය කිරීම අදහස් කළ අතර සිව්වන අවධිය තුළින් වැටුප් අරමුදලක් ලෙස කෘෂිකාර්මික අතිරික්තයේ කාර්යභාරය ඉදිරිපත් කරයි. මෙය





අවබෝධ කර ගැනීම සඳහා ආර්ථිකයේ අංශ දෙකම සමගාමීව සලකා බැලිය යුතුය. එහිදී ඔවුන් පෙන්වා දෙන්නේ කෘෂි අංශයට මිනිස් බලය සමගාමීව යොදා ගැනීමට හැකියාව ඇති බවත්, කෘෂි අංශය හා කාර්මික අංශය යන අංශ දෙක එකට එකතු වී අවශ්‍ය කරන වැටුප් අරමුදල ඵලදායී ක්‍රියාකාරකම් සඳහා යෙදීම මඟින් ආර්ථිකයේ සමස්ත සංවර්ධනය සඳහා විශාල කැප කිරීමක් කළ හැකි බවත් ය. වෙනත් ආකාරයට දක්වන්නේ නම් අත්‍යාවශ්‍ය මූර්ථ සම්පත් ද්විත්ව ආර්ථිකයේ ක්‍රියාවට නැංවෙන්නේ පහත පරිදි ය. ඒ කෂිකාර්මික අංශයෙන් නිදහස් කරනු ලබන කම්කරුවා කෘෂි අංශය තුළින් යැපුන ද ඊට අමතරව කාර්මික අංශයේ නව නිමැවුමක් කිරීමට ඔහුට සිදු වී තිබීමයි. එනම් කෘෂිකාර්මික අංශය ආර්ථිකය තුළ උපක්‍රමික ක්‍රියාවලියක් ලෙස කටයුතු කරනු ලැබීමයි. එමෙන්ම කෘෂිකාර්මික අංශයේ මුළු නිමැවුමේ උත්පාතය කාර්මිකකරණයේ දී ආයෝජන අරමුදල සඳහා ලාභ අතිරික්තයක් වශයෙන් ක්‍රියාකරනු ඇත. ඒ අනුව සංවර්ධනයට අදාළ ප්‍රාග්ධන භාණ්ඩ කාර්මික අංශයට ලැබෙනුයේ මෙම ආයෝජන ක්‍රියාවලිය තුළිනි.

අවධි හයක් යටතේ සංවර්ධන ක්‍රියාවලිය ඉදිරිපත් කළ රානිස් හා ෆෙයි පස්වන අවධිය ලෙස ශ්‍රමය නැවත බෙදාවෙන් කිරීමේ අවශ්‍යතාවය දක්වයි. කෘෂිකාර්මික අංශයේ සිට කාර්මික අංශයට ශ්‍රමය සංක්‍රමණය කිරීමේ වේගවත් ක්‍රියාවලිය අනුව ආර්ථිකයේ වෘද්ධිය වේගවත් කරනු ඇති බව රානිස් හා ෆෙයි මෙහි දී පෙන්වා දෙයි[6]. මෙහිදී මොවුන් දියුණු යුරෝපා හා උතුරු ඇමරිකා ආර්ථිකවල කෘෂිකාර්මික ජනගහනය ක්‍රමයෙන් අඛණ්ඩව අඩුවීමේ ප්‍රවණතාවයක් පසුගිය 150 වසර පුරා දක ගතහැකි බව පෙන්වා දෙති. උදාහරණයක් ලෙස කෘෂිකාර්මික අංශය කාර්මික

6 "According to Fei and Ranis, the procee of labour reallocation must be sufficiently rapid to shift the economy from agricultural to industrial sector. The process of labour reallocation, the faster will be the growth of the economy concerned." (Deasi, (2001).

අංශය ක්‍රියාත්මක ද්විත්ව ආර්ථීකයක 80% ක ශ්‍රම බලකායක් ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට ද 20% ක ශ්‍රම බලකායක් කාර්මික කම්කරුවන් වශයෙන් ද සිටී නම් කාලීනව කෘෂි අංශයේ ඵලදාව අඩුවන බව තේරුම් ගන්නා එහි සිටින ශ්‍රමිකයින් පිරිසක් මුළු ජනගහනයෙන් 40% ක් මුළු ආර්ථීකයට ම ආහාර නිෂ්පාදන සැපයීමට ඉදිරිපත් වේ. එවිට ශ්‍රම බලකායෙන් 60% ක් කාර්මික අංශයට අයත් වේ. එවිට කාර්මික නිමැවුම ඉහළ ගොස් එම භාණ්ඩවලට වන ඉල්ලුම ඉහළයාමෙන් එම කම්කරුවන්ගේ ආදායම ඉහළයයි. ඒ මත කෘෂි අංශය පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් පැනනගිනු ඇත්තේ වැඩිවන ජනගහනයට අනුකූලව ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කළ යුතු බැවිනි. මේ ආකාරයට ශ්‍රමය නැවත බෙදාහැරීම තුළින් ආර්ථීක සංවර්ධන ක්‍රියාවලිය වේගවත් වන බව පැහැදිලි ය.


ෆෙයි හා රානිස්ගේ ආර්ථීක සංවර්ධන ක්‍රියාවලියේ ඉතා වැදගත් අවධිය වන්නේ සමබර වර්ධනීය *(Balenced Growth)* අවස්ථාවයි. සරලව ගත්විට මෙමඟින් ඔවුන් පෙන්වා දෙන්නේ ද්විත්ව ආර්ථීකයක් ලෙස ක්‍රියාත්මක වනවිට එම ආර්ථීකයේ අදාළ අංශ දෙකේම එකවර වර්ධනය තුළින් සමස්ත ආර්ථීක සංවර්ධනය අපේක්ෂා කිරීමයි. මෙහිදී මෙම කෘෂිකාර්මික හා කාර්මික යන අංශ දෙකටම සමගාමීව ආයෝජනය කළ යුතුය.





### 3.6 රූප සටහන

### සමබර වර්ධනය





සමබර වර්ධනය පිළිබඳ ඉහත ප්‍රස්තාර සටහන උපයෝගී කරගනිමින් රානිස් හා ෆෙයි කරුණු ඉදිරිපත් කළහ. ඒ අනුව M යනු ශ්‍රමයේ ඉල්ලුම් වක්‍රයන් වන අතර S යනු සැපයුම් වක්‍රයන් වේ. A ලක්ෂයන්වල දී අංශ දෙකෙහිම ශ්‍රම බලකාය පිළිබඳ අදහස් ඉදිරිපත් කරන අතර ම OL මඟින් කාර්මික අංශයේ ශ්‍රම බලකායේ තරම පිළිබඳ අදහස් කරයි. එම ශ්‍රම ප්‍රමාණය සේවා නියුක්තවීමෙන් ලබන මුළු නිමැවුමේ ලාභය $S_1M_1A_1$ ප්‍රදේශයෙන් නිරූපනය කෙරේ. මෙම මූළු ලාභය ආයෝජනය කිරීම මඟින් කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාවය ඉහළ යන බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් කාර්මික අංශයේ ශ්‍රම ප්‍රමාණය ඉහළයාමෙන් ශ්‍රම සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ. එයට හේතුව කෘෂි අංශයේ ඵලදායීතාවය ඉහළයාමෙන් අතිරික්ත ශ්‍රමයක් හට ගැනීමෙන් ඔවුන් කාර්මික අංශයට විතැන්වීමෙනි. අවසානයේ එහි ප්‍රතිඵලයක් ලෙස කාර්මික

අංශයේ ශ්‍රම ඉල්ලුම් වක්‍රය ද දකුණට විතැන් වේ. මේ ආකාරයට මෙම අංශ දෙක අතර සමබර වර්ධනයක් $S_1A_2$ රේඛාව අනුව වටහා ගත හැකිය.

මේ ආකාරයට 1964 දී රානිස් හා ෆෙයි විසින් ඉදිරිපත් කළ සංවර්ධන ආකෘතියේ එකිනෙක පියවර විග්‍රහ කළ හැකි අතර එම විග්‍රහය තුළ කෘෂි අංශයේ ප්‍රධාන කාර්යභාරය කාර්මික අංශයට ශ්‍රමය සැපයීමක් ලෙස වැදගත් කොට දක්වමින් ආර්ථික සංවර්ධනයේ දී කෘෂි අංශයේ කාර්යභාරය ඉතා පැහැදිලි ලෙස ඉදිරිපත් කරයි (Desai, 2001). ඒ අනුව මෙම ක්‍රියාවලිය පහත පරිදි සිදුවන බව දැක්වීම තවදුරටත් විශ්ලේෂිතය.

**3.7 රූප සටහන**

**සංවර්ධන ක්‍රියාවලිය (රානිස් හා ෆෙයි විග්‍රහය අනුව)**








## සිව්වන පරිච්ඡේදය

# සංවර්ධන ක්‍රියවලියේදී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය : න්‍යායාත්මක අදහස - දෙවන කොටස

## 4.1 කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ෂුල්ට්ස් න්‍යාය

### 4.1.1 හැඳින්වීම

අඩු දියුණු රටවල සැඟවුණු සේවා වියුක්තිය ප්‍රත්‍යක්ෂ මූලික වශයෙන් මිනීම සඳහා කිහිපදෙනෙකුම උත්සාහ දරා ඇත. එම අය අතර *'ෂුල්ට්ස්'* (Schultz: 1964) විශේෂ ස්ථානයක් ගනී. පළමු වන ලෝක යුද්ධයෙන් පසු ඉන්දියාවේ දක්නට ලැබුණු සාක්ෂි අනුසාරයෙන් එම රටෙහි සැඟවුණු සේවා වියුක්තියක් ඇතැයි යන්න මොහු තරයේ ප්‍රතික්ෂේප කළේය. ඉන්දියාවේ එම කාලයේ දී ඇතිවුන වසංගතයෙන් කෘෂිකාර්මික ජනගහනයේ යම් අඩුවීමක් සිදු වූ නිසා ඊළඟ වසරේ දී කෘෂිකාර්මික නිමැවුම ද පහත වැටුණු බව ඔහු පෙන්වා දුන්නේය (සේනානායක, (2008). මෙලෙස ආර්ථික සංවර්ධනය හා ඌන සංවර්ධිත රටවල් සම්බන්ධයන් විශේෂ අදහස් ඉදිරිපත් කළ ආර්ථික විද්‍යාඥයෙකු වශයෙන් මහාචාර්ය ටී. ඩබ්. ෂුල්ට්ස් කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ඉදිරිපත් කළ අදහස මෙම තේමාව තුළින් පෙළගස්වනු ලැබේ.

### 4.1.2 න්‍යායාත්මක විමසුම

ෂුල්ට්ස්ගේ න්‍යාය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී වැඩවසම් ආර්ථිකය *(Feudal)* හා ධනවාදී ආර්ථිකය *(Capitalism)* පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. එයට හේතුව මොහු තම සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කර ඇත්තේ මෙම අංශ දෙක අතර පරිවර්තනයක් වශයෙන් වීමයි[7]. කෙසේනමුත් ෂුල්ට්ස් මෙම අදහස් ඉදිරිපත් කරන ලද්දේ ඔහුගේ *'Transforming Traditional Agriculture''* යන කෘතිය මඟිනි. එහිදී කෘෂිකර්මය සාම්ප්‍රදායික නැතහොත් වැඩවසම් ආර්ථිකයේ ඉතා වැදගත් ආර්ථික අංශය

[7] "The Transformation from feddalism to capitalism necessarily implies a transformation of agriculture" (Deasi, (2001).





වශයෙන් හඳුනාගෙන ඇත. විශේෂයෙන් වැඩවසම් ආර්ථික ක්‍රමයක් පැවති සියලු ආර්ථිකයන්ගේ එම ක්‍රමය ක්‍රියාත්මක වූ ආකාරය විමසා බැලීම මෙහිදී වැදගත් වේ. උදාහරණ වශයෙන් ජපානයේ තොකුගව පාලන සමය වනතෙක් වැඩවසම් ක්‍රමය ප්‍රබල ලෙස පැවති අතර මෙයිජි යුගයේ දී සම්පූර්ණයෙන් ම වැඩවසම් ලක්ෂණ ඉවත්කර නූතන ආර්ථිකයට ගැලපෙන ලෙස කෘෂිකර්මයට වෙනස් මුහුණුවරක් ලබාදුනි. ඒ තුළින් වර්තමානයේ පවත්නා දියුණු තත්ත්වයට ජපානය ගෙන ඒමට හැකිවූ බව නැතහොත් අද පවත්නා සංවර්ධනයට පදනම වැටුණු බව පිළිගනු ලබයි. එයින් පැහැදිලි වන්නේ රටක් සංවර්ධනය වීමේ දී කෘෂිකර්මයේ වැඩවසම් ආර්ථික ස්වභාවයන් ඉවත් වී එය ධනවාදී ආර්ථික රටාවන්ට පරිවර්තනය කළයුතු බව ය. මෙම නිගමනය ජපානය තුළින් මේ ආකාරයට තත්ත්වාකාරයෙන් ප්‍රත්‍යක්ෂ වෙද්දී ෂුල්ට්ස් එය න්‍යායාත්මකව විග්‍රහ කර ඇති අතර එය ෂුල්ට්ස්ගේ කෘෂිකාර්මික සංවර්ධන න්‍යාය වශයෙන් හඳුනාගනී.

***වැඩවසම් ආර්ථික කෘෂිකර්මයේ ලක්ෂණ***

1. පැරණි වගා ක්‍රම නැතහොත් නිෂ්පාදන ක්‍රම භාවිතයට ගැනීම
2. ගොවීන්ගේ කටයුතු, ලාභදායීත්වය, තාක්ෂණික උපක්‍රම ආදිය ගොවියා විසින් ම කළමනාකරණය කරයි
3. ගොවිතැන පරම්පාවෙන් උරුම වූ ගොවීන් සිටින අතර ඔවුන් මහන්සි වී වැඩ කළ යුතුය
4. යැපීම සඳහා පමණක් යොමුවූ කෘෂිකාර්මික කටයුත්තක් වේ
5. භූමිය සාරවත් වේ (Land is Rich)
6. ගොවීන් විද්‍යාව හා නව තාක්ෂණයෙන් වියුක්ත වූ අය වේ

යනුවෙන් ෂුල්ට්ස් වැඩවසම් කෘෂිකර්මයෙහි ලක්ෂණ කිහියපක් පෙන්වා දෙයි. එමෙන්ම ඔහු වැඩවසම් කෘෂිකර්මය හඳුනාගනු ලබන්නේ *'Farming based wholly upon the kinds of factors of production that have been used by farmers for generations can be called Traditonal Agriculture''* යනුවෙනි. එනම් ගොවිතැන පදනම් වූ නිෂ්පාදන සාධක වර්ග භාවිතා කරමින් ගොවීන් කටයුතු කරයි නම් එය වැඩවසම් කෘෂිකර්මය වශයෙන් සරලව විවරණය කළ හැක. ආර්ථිකයේ පැවැත්ම වැඩවසම් කෘෂිකර්මය මත තීරණය වන අතර එහෙත් එහි නියුතු ගොවීන් අවාසනාවන්ත ලෙස දුප්පතුන් වී ඇති බව ඔහු වැඩිදුරටත් පෙන්වා දෙයි.

කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳව ෂුල්ට්ස් විසින් මෙපරිද්දෙන් අර්ථ විග්‍රහය ආරම්භ කරන අතර ම ඊට අදාළව ඔහු ප්‍රශ්නයක් මතු කරයි. එනම් වැඩවසම් අර්ථ ක්‍රමය ඵලදායීතාවයකින් යුතු අංශයක් බවට පත් කරනුයේ කෙසේ ද? යනු ගැටලුව ය. ෂුල්ට්ස් පවසනුයේ මෙය මෞලික වශයෙන් ආයෝජන ගැටලුවක් *(Investment Problem)* වන බව ය. එයින් අදහස් වන්නේ කෘෂිකාර්මික අංශයට ආයෝජනය කිරීම මඟින් එම අංශයෙහි කාර්ය ඵලය වර්ධනය වන බැවින් එය ඉහළ ඵලදායී අංශයක් කිරීම ආයෝජන ගැටලුවක් වන බව ය. තවදුරටත් ෂුල්ට්ස් පෙන්වා දෙන්නේ කෘෂිකාර්මික සංවර්ධනය තුළින් කාර්මික සංවර්ධනය ඇති කිරීමට නම් එය ආයෝජන විසඳුමක් වශයෙන් ඉදිරිපත් කිරීම තර්කානුකූල වන බව යි. කෘෂිකාර්මික අංශය ආර්ථික වර්ධනයෙහි මූලාශ්‍රයක් වශයෙන් ෂුල්ට්ස් හඳුනාගෙන තිබුණි (Deasi, (2001). ඔහු මෙය හඳුන්වන්නේ ආර්ථික වර්ධනයේ බලාත්මක යාන්ත්‍රණය කෘෂිකාර්මික අංශය වශයෙනි. එය සමස්ත ආර්ථික වර්ධනයට පෙර සිදුවිය යුතු *(Pre Requisite)* පූර්ව අවශ්‍යතාවයකි. එබැවින් ආයෝජන මඟින් ගොවීන් දිරිගැන්විය යුතුය. මෙම කාරණය ෂුල්ට්ස්





දක්වන්නේ නිසි ආයෝජන අවස්ථා හා කාර්යක්ෂම දිරිගැන්වීම් මඟින් ගොවීන් වැලි රත්රන් බවට පරිවර්තනය කරන බව ය[8].

මහාචාර්ය ෂුල්ට්ස් ආර්ථික වර්ධනයේ දී කෘෂිකාර්මික සංවර්ධනය යොදා ගැනීම පිළිබඳ ප්‍රශ්න තුනක් අවධාරණය කරයි. එම ප්‍රශ්න වනුයේ

1. අඩු ආදායම් ලබන ප්‍රජාවක් පදනම් වූ වැඩවසම් කෘෂිකර්මයෙහි කෘෂිකාර්මික නිෂ්පාදනය තිරසාරව වර්ධනය කිරීම හා කාර්යක්ෂම ලෙස නිෂ්පාදන සාධක බෙදාහැරීම කළමනාකරණය කිරීම
2. රටවල් අතර ආර්ථික වර්ධනය සඳහා කෘෂිකර්මය යොදා ගැනීමේ දී විශාල වෙනස්කම් කෘෂිකාර්මික නිෂ්පාදන සාධක අතර ප්‍රාථමිකව දැකිය හැකි වීම
3. කෘෂිකර්මයට කුමන සාධක යටතේ වුවද ආයෝජනය කරනුයේ ඇයි?

මෙම ගැටලු තුන ඉදිරිපත් කරමින් ෂුල්ට්ස් ඉන් පළමු හා තෙවන ගැටලු වැඩවසම් කෘෂිකර්මය පරිවර්තනය කිරීමේ මූලික ගැටලු වශයෙන් හඳුනාගනී. කෘෂිකාර්මික සංවර්ධනයේ දී භූමියේ වෙනස්කම් අඩු වැදගත්කමක් ගන්නා අතර වැදගත් වනුයේ ගොවීන්ගේ ධාරිතාවය යි.

ෂුල්ට්ස් වැඩවසම් කෘෂිකර්මයෙහි උප ලක්ෂණ කිහිපයක් පෙන්වා දෙමින් එහි සීමාකම් වශයෙන් එම ලක්ෂණ හඳුනාගෙන ආර්ථික සංවර්ධනයේදී මෙම ආර්ථික ඒකකය පරිවර්තනය කිරීමේ දී විශේෂ අවධානයට යොමු කර ඇත.

[8] "Jonston සහ Mellor දෙදෙනාගේ අදහසට අනුව........ආර්ථික සංවර්ධනයේ මුල් අවස්ථාවලදී හෙවත් ව්‍යුහාත්මක පරිවර්තනයක් මුල් අවධියේ දී කෘෂිකර්ම අංශයේ ප්‍රාග්ධන දායකත්වයට ප්‍රධාන තැනක් දීම සුදුසු බව යි.'' (සේනානායක, (2008).

I. වැඩවසම් ගොවීන් දීර්ඝ කාලීනව සාම්ප්‍රදායිකව කටයුතු කිරීම. එනම් වැඩවසම් කෘෂි අංශය නොයෙක් සංස්කෘතික ගති ලක්ෂණවලින් අනූන ය.

II. වැඩවසම් කෘෂිකර්මාන්තය ආයතනික ලක්ෂණවලින් යුක්තය

උදාහරණ වශයෙන් ඉඩම් හිමිකම, ගොවීන්ගේ නායකයෙකු වශයෙන් රදළයින් කටයුතු කිරිම පෙන්වා දිය හැකිය.

III. වැඩවසම් කෘෂිකර්මයෙහි අදීන තාක්ෂණික ලක්ෂණ පැවතීම

යනුවෙන් එම උප ලක්ෂණ පෙන්වා දෙන ෂුල්ට්ස් ඒවායින් ආර්ථික ලක්ෂණවලට ගෙවීමක් කරන බවත් සංස්කෘතික ලක්ෂණ මඟින් ගොවීන්ට යම් බලපෑමක් වන බවත් පෙන්වා දෙයි. මෙම ලක්ෂණ අනුව ගොවීන් තම ජීවිතයේ ඉහළ තත්ත්වයන් සඳහා අභිලාෂයන් ඇති කර ගන්නා හෙයින් කෘෂිකාර්මික සංවර්ධනයේ දී ඒවා කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. වැඩවසම් කෘෂි අංශය පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියේ දී එහි සමතුලිත්‍ය පිළිබඳව ද අවබෝධයක් තිබිය යුතුය. තවද බෙදාහැරීමේ කාර්යක්ෂමතාවය පිළිබඳව ද දැනුම අවශ්‍ය වේ. නිෂ්පාදන සාධක නැවත කාර්යක්ෂමව බෙදාහැරීම හා එම සාධක නිවැරදි කළමනාකරණයට යොමු කිරීමෙන් කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කළ හැකිය. ඒ අනුව සාධක බෙදාහැරීමේ දී ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැයට සමාන වන ආකාරයට එම ක්‍රියාවලිය සිදුවිය යුතුය. එවිට කෘෂිකාර්මික නිෂ්පාදනයෙන් ඉහළ ඵලදාවක් ලැබෙන හෙයින් එම ප්‍රගතිය කාර්මික අංශයට ගලා යාමට සැලසුම් කළහැකි ය. කෙසේනමුත් වැඩවසම් කෘෂිකර්මයෙහි ගොවිපොළ කළමනාකරණයක් නොතිබුණු අතර එබැවින් ඵලදායී සාධක බෙදාහැරීමක් ද නොසිදු විය. මේ නිසා වැඩවසම් කෘෂිකර්මය ඵලදායී ධනවාදී කෘෂිකාර්මික අංශයට පරිවර්තනය කළයුතු ය.






වැඩවසම් කෘෂිකර්මයෙහි අඩු ප්‍රාග්ධන තොගයක් පැවතුණ ද කළු කඩකරුවන් (ඉහළ රදළ පැලැන්තිය) නිමැවුමෙහි ඉහළ කොටසකට හිමිකම් කීවේය. මෙම කාරණය ද වැඩවසම් කෘෂි අංශයෙහි දුර්වලතාවයක් වේ. ඒ ගොවීන්ගේ ආදායමෙන් ඉතුරුම්වලට යොදන ප්‍රමාණයෙහි ඌණතයක් පැවතීමයි. එමෙන්ම විදේශීය ප්‍රාග්ධන ආයෝජනයක් ද සිදු නොවන බැවින් වැඩවසම් කෘෂි අංශය තුළ ප්‍රාග්ධන හිඟතාවයක් පැවතීම ආර්ථික පුනර්ජීවය සඳහා බාධාවකි (එනම් ශුද්ධ ප්‍රාග්ධන අනුපාතය පහළ අගයක් ගැනීම නිසා).

මේ නිසා කෘෂි අංශයට ආයෝජනය කිරීම මඟින් ප්‍රාග්ධනය ඉහළ දමා කෘෂිකර්මාන්තයේ ආදායම් අනුපාතය ඉහළ දැමිය හැකිය. එමඟින් ගොවීන්ගේ ඉතුරුම් ඉහළ ගොස් සමස්ත ආර්ථිකයේම ප්‍රාග්ධන තොගය ඉහළ යනු ඇත. එය ආර්ථිකයේ සංවර්ධනය සඳහා යොදා ගත හැකිය. ෂුල්ට්ස් ප්‍රවේශයන් දෙකක් යටතේ වැඩවසම් කෘෂිකර්මය ධනවාදී කෘෂිකර්මය බවට පරිවර්තනය කිරීමෙන් ආර්ථික සංවර්ධනයේ පදනම වශයෙන් කෘෂි අංශය කටයුතු කරන බව පෙන්වා දෙයි. එනම් පොදු ප්‍රවේශය යටතේ දේශපාලන බලය භාවිත කිරීම තුළින් කෘෂිකාර්මික නිෂ්පාදන නැවත සංවිධානය කිරීම හා ගොවිපොළ කටයුතු පරිපාලනය කිරීම ද වෙළඳපොළ ප්‍රවේශය යටතේ ආර්ථික දිරිගැන්වීම් හා උපදේශනයන් මඟින් ගොවීන්ගේ නිෂ්පාදන තීරණගැනීම හා කාර්යක්ෂම ලෙස සාධක බෙදාහැරීම පිළිබඳ පරිචයක් ලබාදීම ද යනුවෙනි.

මෙතෙක් සාකච්ඡා කළ කරුණු අනුව ෂුල්ට්ස්ගේ කෘෂිකාර්මික සංවර්ධන න්‍යාය පිළිබඳ සැලකිය යුතු අදහසක් ලබාගත හැකි ය. මතු සඳහන් රූප සටහන තුළින් ද එම කරුණු අවබෝධ කර ගැනීම පහසු වනු ඇත.

## 4.1 රූප සටහන

### නිෂ්පාදන සාධකවල මිල තීරණය වීම




ඉහත රූප සටහන මඟින් නිෂ්පාදන සාධක මිල තීරණය වීම පිළිබඳ කරුණු දැක්වේ. වැඩවසම් කෘෂි අංශයේ නිෂ්පාදන සාධක නැතහොත් යෙදවුම් මිල ඉතා ඉහළ ය. එයට හේතුව සාධක සඳහා ඉල්ලුම හා සැපයුම අඩු මට්ටමක පැවතීම යි. මේ තත්ත්වය තුළ සාධක සංයෝගයෙහි ඵලදාව ද අඩු වේ. $R_0$ වැඩවසම් අංශයේ සාධක ඵලදාව ද $R_1$ ධනවාදී අංශයේ සාධක ඵලදාව ද වේ. 3.8 වන රූප සටහනෙහි $I_m$ මඟින් වැඩවසම් සමතුලිතය පෙන්වන අතර $H_m$ මඟින් ධනවාදී සමතුලිතය පෙන්වයි. එහි දී සාධක සඳහා තරගකාරිත්වයක් ඇතිවන නිසා යෙදවුම්වල මිල පහළ මට්ටමක






පවතී. කෘෂි අංශය දියුණු කර ආදායම් උපයා ගැනීම ලාභදායක වූවිට සාධක ඉල්ලුම් සැපයුම් වැඩි වේ. එබැවින් ධනවාදී අංශයට පැමිණෙන විට සාධකවල මිල පහළ යනු ඇත ($R_0$). නමුත් සාධක ඵලදාව ඉහළ යයි ($R_1$). මෙලෙස වැඩවසම් ආර්ථික කෘෂි අංශයේ සිට ධනවාදී කෘෂි අංශය දක්වා වෙනස් වන විට ආර්ථිකයේ සාධක ඵලදාව ඉහළ යාමෙන් ආර්ථික වර්ධනය ඇති වේ[9].

[9] "According to Prof. Mellor, traditional agriculture is the first phase which implies a backward, primitive and labour intensive agriculture" (Deasi, (2001).

### 4.1.3 ෂූල්ට්ස්ට අනුව කෘෂිකාර්මික වර්ධනය සමස්ත ආර්ථික සංවර්ධනයට පදනම් වන අයුරු

**4.2 රූප සටහන**
**ෂූල්ට්ස් දක්වන ආර්ථික සංවර්ධනයේ ක්‍රමචේදය**








## 4.2 කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ මෙලර්ගේ ආකෘතිය

### 4.2.1 හැඳින්වීම

පහළ ආදායම් ලබන රටවල වේගවත් ජනගහන වර්ධනයක් සහිත අතර ඉහළ ආදායම් ඉල්ලුම් නම්‍යතාවයක් කෘෂිකාර්මික භාණ්ඩ සඳහා පවතින මෙන්ම කෘෂිකාර්මික භාණ්ඩ සැපයුම විශාල වශයෙන් වර්ධනය වන තත්ත්වයක පසුවේ. වාණිජ කෘෂිකාර්මික භාණ්ඩ අපනයනය කර ඒ අනුව විදේශ විනිමය උපයා ගනිමින් කාර්මික අංශය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය කරයි. මෙම වාතාවරණය හමුවේ දුප්පත් රටවල් සංවර්ධනය කිරීමේ කාර්යයේ දී අත්‍යාවශ්‍ය සාධකයක් ලෙස කෘෂිකාර්මික නිෂ්පාදනවල ඵලදායීතාව වැඩිකිරීම කළයුතු බව අවබෝධ කරගෙන ඇත. මෙහි විශේෂත්වය එම රටවල සංවර්ධන කාර්යයේ දී ඉතා වැදගත් සාධකය එය පමණක් වශයෙන් මෙම ආකෘතිය තුළින් ඉදිරිපත් කිරීමයි. මෙම අදහස් 1966 දී මහාචාර්ය ජේ. ඩබ්. මෙලර් *(J. W. Mellor)* විසින් "The Economic of Agricultural Development" යන කෘතිය මඟින් තම සංවර්ධන ආකෘතිය ඉදිරිපත් කරමින් පහැදිලි කර ඇත.

### 4.2.2 න්‍යායාත්මක විමසුම

මෙලර්ගේ න්‍යාය මඟින් කෘෂිකාර්මික ආර්ථිකයක අවධි තුනක් හඳුනාගනී (Deasi, 2001). එනම්

1. වැඩවසම් / සාම්ප්‍රදායික කෘෂිකර්මය හෝ කෘෂිකාර්මික සංවර්ධනයේ පූර්ව සාධක පවත්නා අවධිය *(Traditional Agricultural or Pre - Conditional of Agriculture Development)*

2. කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ යන අඩු ප්‍රාග්ධනයක් හා ශ්‍රමය දිරිගැන්වීමේ තාක්ෂණයක් සහිත අවධිය *(Rising Agriculture Production - Low Capital - labour Intensive Technology)*

3. කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ යන ඉහළ ප්‍රාග්ධන ශ්‍රම ඵලදායී තාක්ෂණය භාවිත යුගය *(Risisng Agriculture Production – High Capital Labur Saving Technology)*

යන අවධීන්ය. මෙලර්ගේ න්‍යායේ පළමු යුගය වන්නේ වැඩවසම් යුගය නොහොත් සාම්ප්‍රදායික කෘෂිකාර්මික අවධිය යි. මෙලර් සාම්ප්‍රදායික කෘෂිකර්මය වශයෙන් හඳුනාගනු ලබන්නේ පසුගාමී, අසංවර්ධිත හා කෘෂිකර්මය සඳහා ශ්‍රමය බහුල ලෙස යොදා ගන්නා කෘෂිකාර්මික අවධිය යි (Desai, 2001). මෙම යුගයේ දි කෘෂිකාර්මික නිෂ්පාදනය තාක්ෂණය භාවිතයට ගැනීමෙන් ඉහළ දැමීමට හැකියාව ඇත. කෙසේනමුත් තාක්ෂණය භාවිතයට ගැනීම තීරණය වනුයේ අනෙකුත් කෘෂි නිෂ්පාදන යෙදවුම් මත ය. අඩු දියුණු රටවල මෙම යුගයේ දී ගොවීන්ගේ සංවිධාන ශක්තියේ විවිධ වෙනස්කම් දැකිය හැකිය. ආර්ථික, සංස්කෘතික හා භෞතික සාධකවල මෙම වෙනස පෙන්නුම් කරයි. නමුත් සමස්තයක් ලෙස මෙම වෙනස්කමෙහි සමානතාවයක් රටවල් අතර දැකිය හැකි බව මොහු පෙන්වා දී ඇත. ඌණ සංවර්ධන රටවල බොහෝ ගොවිපොළවල් ගැමි ගොවිපොළ *(Peasant Farms)* වේ. ඒවාට අවශ්‍ය ශ්‍රමය, කළමනාකරණය හා ප්‍රාග්ධනය යන සියල්ල කුටුම්භයන් විසින් ම සපයා ගනී. සාමාන්‍යයෙන් සංවර්ධිත රටවල ගොවිපොළවලට සාපේක්ෂව මෙම ගොවිපොළ ප්‍රමාණයෙන් කුඩා වන අතර එක ගොවිපොළකට සිටින ශ්‍රමික සංඛ්‍යාව විශාල වේ. එසේ වුවත් තාක්ෂණික දිරිගැන්වීම් මඟින් මෙම වාතාවරණය වෙනස් කළ හැකිය.





විශේෂයෙන් ගොවිපොළ ගොවීන්ගේ තීරණ ගැනීමේ හැකියාව, පරිසර කළමනාකරණය යනාදිය දියුණු කිරීම මඟින් ඒ සඳහා වඩා හොඳ ප්‍රතිඵල ලබාගත හැකිය. එම රටවල මුළු කෘෂි නිමැවුම වැඩි වුවද සාමාන්‍ය කෘෂි නිමැවුම පහළ මට්ටමක පවතී. බොහෝදුරට මෙම අවධියේ දී සමහර සාම්ප්‍රදායික නොවන යෙදවුම් (රසායනික පොහොර, බිත්තර හෝග) සැලකිය යුතු බලපෑමක් මුළු කෘෂි නිමැවුමට එල්ල කරනු ඇත. මේ අනුව පැහැදිලි වන්නේ සාම්ප්‍රදායික කෘෂි අංශය ප්‍රබල ආයතනික මට්ටමේ වෙනස්කම්වලින් පමණක් හැරෙන්නට විශාල ප්‍රමාණයේ බලපෑමක් වන ආකාරයේ වෙනසක් කළ නොහැකි බව ය. මෙලර් තවදුරටත් පෙන්වා දෙන්නේ සාම්ප්‍රදායික කෘෂිකර්මයෙහි පවතින්නේ ඌන සේවා නියුක්තියක් වන අතර ගොවීන් අතර භූමිය බෙදාහැරීමේ දී මෙය සැලකිල්ලට ගතයුතුය යන්න ය. ගොවීන්ගේ කටයුතු යැපුම් මට්ටමේ පවතින අතර ඒ සඳහා පවුලේ ශ්‍රමිකයින් ද යොදා ගන්නා බැවින් ගොවීන්ගේ ආන්තික නිෂ්පාදනය ශූන්‍ය මට්ටමේ පවතී. තවද විවේකය හා ශ්‍රමය වැය කිරීම අතර තෝරාගැනීමක් ද මෙම ගොවීන් විසින් සිදුකරයි. තවද ශ්‍රමිකයින් ප්‍රමාණය අඩු වනවිට අනෙක් ශ්‍රමිකයන්ගේ ආදායම වැඩිවන අතර එම ප්‍රතිඵලය ලබා ගැනීමට නම් ගොවීන්ට තම ගොවිපොළ ප්‍රමාණය ද විශාල කරගැනීමට සිදුවේ. කෙසේනමුත් ගොවීන් තාක්ෂණය භාවිතයට ගැනීම හමුවේ පසු කර්මාන්ත ආර්ථිකයට දායාද වේ. මෙම තත්ත්වය ආර්ථිකයේ අනෙකුත් අංශවලට බලපානුයේ කෙසේ ද යන්න දැක්වීමේ දී පැහැදිලිවනුයේ ආහාර සඳහා ඉල්ලුම ඉහළ යාම, ජනගහන වර්ධනය හා ඒක පුද්ගල ආදායම ඉහළ යාම ඒ ඇසුරින් ඉතුරුම් ඉහළ යාම වැනි යනාදී ලෙස එය බලපාන බව ය. එනම් අනෙකුත් අංශවලට ඉදිරිපෙළ බලපෑම් ඇතිවන බව ගම්‍ය වේ. මේ ආකාරයට ආර්ථිකයේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික අංශයේ වර්ධනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිවල අවධානය ලැබීමේ වැදගත්කම ද ප්‍රත්‍යක්ෂ වේ.

මෙලර්ගේ සංවර්ධන ආකෘතියෙහි දෙවන අවධියේ දී කෘෂිකාර්මික අංශය ක්‍රියාකරනුයේ සමස්ත ආර්ථික සංවර්ධනයේ පුරෝගාමී අංශය වශයෙනි. කෘෂිකර්මාන්තයට ඉහළ ඵලදාවක් සහිත නව යෙදවුම් යෙදීම මඟින් සාම්ප්‍රදායික යෙදවුම්වල ආන්තික ඵලදායීතාවයන් ද ඉහළ යනු ඇත. නැතහොත් ඒ සඳහා දිරිමත් කරයි. එනම් නව යෙදවුම් භාවිතය නිසා සාම්ප්‍රදායික යෙදවුම් ඇතුළත් නිෂ්පාදන ශ්‍රිතය ඉහළට එසවීමක් නැතහොත් ඉහළට විතැන්වීමක් සිදුවේ. එසේ වුවත් නව යෙදවුම් බොහොමයක් ප්‍රාග්ධනිතය. එම යෙදවුම් භාවිතය නිසා අක්කරයකට ඵලදාව ඉහළ යයි. සමස්ත ආර්ථිකය තුළ මෙම අවධියේ දී කෘෂිකර්මයෙහි පහත ලක්ෂණ දැක ගත හැකිය.

- කෘෂිකර්මික නිමැවුම මුළු ආර්ථිකයේ ම විශාල නිමැවුමක් වේ
- කෘෂිකාර්මික භාණ්ඩ සඳහා වන ඉල්ලුම විශාල වශයෙන් වැඩි වේ
- ගොවිපොළ ප්‍රමාණය වැඩි කළ නොහැක
- යන්ත්‍ර සූත්‍ර කෘෂිකර්මය සඳහා භාවිතා කළ නොහැක. නමුත් ලාභදායී ලෙස ශ්‍රමය යෙදවිය හැකිය

මීට අතිරේකව කාර්මික නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන ප්‍රාග්ධනය ආර්ථිකය තුළ හිඟවුවද එහි ප්‍රතිලාභ ඉහළ මට්ටමක පවතී.

මෙලර් මෙම අවධියේ පසුවන කෘෂිකර්මය දිරිගැන්වීම සඳහා කළ යුතු කාර්ය පටිපාටීන් කිහිපයක් මෙසේ සඳහන් කර ඇත (Desai, 2001).





**a) ගොවිතැන දිරිගැන්වීමේ ආයතනික දිරිමත් කිරීම**

අඩු දියුණු රටවල් කෘෂිකාර්මික නිෂ්පාදනය වර්ධනය සඳහා කුඩා පරිමාණයේ ගොවීන් කෙරෙහි අඩු දිරිගැන්වීමක් කරයි. නමුත් ඔවුන්ගේ අභිප්‍රේරණය සමස්ත කෘෂි නිමැවුම සඳහා වැදගත් වේ. ඒ අනුව කෘෂි නිමැවුම දිරිමත් කිරීම සඳහා ආයතනික වෙනස්කම් මෙම රටවල කළ යුතුය (ගොවි රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු).

**b) ආයතන සමඟ සම්බන්ධ වීම**

කෘෂි උපකාරක ආයතන විසින් නව යෙදවුම් උපකරණ බෙදාහැරීම, අලෙවිකරණ ආයතනික සේවා, දිගු කාලීන ණය හා ණය උපදේශන සේවා, කෘෂි යාන්ත්‍රික සේවා, ප්‍රවාහන සේවා ආදිය මෙම ආයතන විසින් සැපයීම මඟින් කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කළ හැකිය.

**c) පර්යේෂණ ධෛර්යමත් කිරීම**

ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා විවිධ යෙදවුම් වෙනුවෙන් පර්යේෂණ වැඩසටහන් දිරිමත් කළයුතුය. විශේෂයෙන් මෙලර් පෙන්වා දෙන්නේ මෙම කරනු ලබන පර්යේෂණ අවසානයේ ගොවිපොළ සාධකයන් සමඟ සම්බන්ධ වියයුතු බව ය. එමෙන්ම පැලෑටි හා සත්ත්ව විද්‍යාවේ කරනු ලබන ප්‍රායෝගික පරීක්ෂණ කෘෂිකාර්මික ඵලදායීතාවය ඇති කිරීම සඳහා ඉතා වැදගත් වේ.

**d) සන්නිවේදන පද්ධතිය සංවර්ධනය කිරීම**

කෘෂිකාර්මික යෝජනා සඳහා විකල්පයන් කිහිපයක් තිබිය හැකිය. උදාහරණ වශයෙන් බිම් සකස් කිරීමක් ගතහොත් ඒ සඳහා මිනිස් ශ්‍රමය යොදා ගැනිම, ට්‍රැක්ටර් භාවිතය, සතුන් යොදා ගැනීම ආදී විකල්ප කිහිපයක් පවතී. මෙලෙස කෘෂි අංශය පිළිබඳ කරනු ලබන යෝජනාවකට පක්ෂ හා විපක්ෂ මතවාද පවතින බැවින් ඒවා

පිළිබඳ ගොවීන්ට උපදේශන ලබා දීම සඳහා සන්නිවේදනය වැදගත්වේ.

### e) නව වැඩි දියුණු කළ යෙදවුම් සැපයීම

භෞතික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා නව වගා ක්‍රම හා උපකරණ අවශ්‍ය වේ. නව වැඩි දියුණු කළ බීජ, සත්ත්ව විශේෂ, රසායනික පොහොර ආදිය අත්‍යාවශ්‍ය ය.

### f) අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම

මෙම වැඩසටහනෙහි අවසාන සාර්ථකත්වය තීරණය වන්නේ ගොවීන් ලබන පුහුණුවත් සමඟ ය. ගොවියා ලබන කුසලතාවය හා පුහුණුව ඔහුට නිර්මාණශීලී තීරණ ගැනීමට මඟ පෙන්වයි. මේ පිළිබඳ මෙලර්ගේ දැක්ම වනුයේ කෘෂිකාර්මික නිෂ්පාදන අනුපාතය ප්‍රායෝගිකව තීරණය වීමේ දී විවිධ සංවර්ධනාත්මක ආයතනයන්ගෙන් පුද්ගලයින් ලබන දැනුම සීමාකාරී ලෙස බලපනු ලබන බව ය.

මෙම කාර්යාවලිය එකිනෙකට සම්බන්ධ ක්‍රියාවලියකි. නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා සම්පත් නැවත සේවා නියුක්ත කිරීම මෙන්ම නව තාක්‍ෂණය භාවිත කිරීම ද වැදගත් වේ. ප්‍රාග්ධන මූලික නොවූ කෘෂිකර්මයෙහි මෙම දෙවන අවධිය තුළ ශ්‍රමය හා ශ්‍රමයට පූර්ණ ආදේශන ප්‍රාග්ධනය භාවිතයට ගන්නා බව මෙම කරුණු අනුව ගම්‍ය වේ.

කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ දෙවන අවධිය යනු සමස්ත සංවර්ධන ක්‍රියාවලියෙහි එන තෙවන අවධිය සිදු වීමේ ආසන්න අවධිය වශයෙන් මෙලර් හඳුනාගනී. මෙහි දී ආර්ථිකයේ පවත්නා කෘෂිකාර්මික නොවන අංශයේ වර්ධනය ආර්ථික සංවර්ධනය සඳහා දායක වීම පෙන්වයි. ඒ අනුව මෙහි දී ප්‍රාග්ධන භාවිතය වැඩි වේ. තවද ශ්‍රම ඵලදායීතාවය ද ඉහළ යන අතර ඒ සඳහා පැලෑටි හා සත්ත්ව නිෂ්පාදන පිළිබඳ පර්යේෂණ වැඩි වීම ද





බලපානු ඇත. එමෙන්ම කෘෂිකාර්මික අංශයට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් ආයෝජනය වේ. ඒ හරහා එම අංශයේ ශ්‍රම ඵලදාව ඉහළ යන බැවින් කෘෂිකාර්මික අංශයේ ශ්‍රමිකයින්ගෙන් කොටසක් කෘෂි නොවන අංශයට ඇදී යයි. එමෙන්ම කෘෂි ගොවිපොළ ප්‍රමාණය ද වර්ධනය වේ. නමුත් කෘෂිකාර්මික නොවන අංශයේ ඉල්ලුම කෘෂිකාර්මික අංශය මත රඳා පවතින බැවින් සමස්ත ආර්ථික සංවර්ධනයෙහි පදනම වශයෙන් කෘෂි අංශය ක්‍රියාත්මක වේ.


කෙසේනමුත් මෙම ක්‍රියාවලිය සුමටව ක්‍රියාත්මකවීමක් පෙන්නුම් කළ ද එමෙන්ම ක්‍රමික ගලායාමක් දැක්වුව ද විවිධ රටවල ප්‍රායෝගිකව සංවර්ධන ක්‍රියාවලිය සිදුවීමේ දී එසේ සිදුනොවූ අවස්ථා හමුවේ. උදාහරණ වශයෙන් ඇමරිකාවේ සංවර්ධන ක්‍රියාවලිය තුළ පළමු අවධිය න්‍යායට අනුගතව සිදුවුවද දෙවන අවධිය ක්‍රියාත්මක වී ඇත්තේ තෙවන අවධියට පසුව වීම විශේෂිත ය.

### 4.2.3 මෙලර්ගේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී කෘෂිකාර්මික පදනම

මෙලර්ගේ කෘෂිකාර්මික සංවර්ධන න්‍යාය තුළ ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ පදනම සපයන ආකාරය පහත රූප සටහන මඟින් පෙන්නුම් කරනු ලබයි.

## 4.3 රූප සටහන

### ආර්ථික සංවර්ධනයේ පදනම (මෙලර්ට අනුව)




## 4.3 ජෝර්ජෙන්සන්ගේ ද්විත්ව ආර්ථික ආකෘතිය

### 4.3.1 හැඳින්වීම

ඩේල් ඩබ්. ජෝර්ජේන්සන් *(Dale W. Jorgenson)* විසින් හඳුන්වාදුන් "ආර්ථික සංවර්ධනය පිළිබඳ ද්විත්ව ආර්ථික ආකෘතිය/න්‍යාය *(Jorgenson's Dual Economy Model)*" අඩු දියුණු රටවල් සඳහා යම් සංශෝධන යටතේ ගැලපිය හැකිය. මෙම න්‍යාය මඟින් ආර්ථික සංවර්ධනයේ දී සමාජ හා ආර්ථික සම්බන්ධතාවය හා එහි වෙනස්වීමේ රටාව තාර්කිකව පැහැදිලි කෙරෙයි. ද්විත්ව ආර්ථික ආකෘතිය හා "කර්මාන්ත අංශයේ සංයුතිය පිළිබඳ න්‍යාය *(Theory of Industrial Composition)*" අතර ඉතා සමීප සම්බන්ධතාවයක් පවතී. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී





කර්මාන්ත අංශයේ නිෂ්පාදන කාර්යභාරය වැඩිවීමක් දැකිය හැකි අතර එම තත්ත්වය කෘෂිකාර්මික අංශය සමඟ සම්බන්ධ වන්නේ කුමන ආකාරයෙන් ද යන්න විවරණය කිරීමට මෙම සමීප සම්බන්ධතාවය අවබෝධ කරගත යුතුය.

ආර්ථික සංවර්ධනයේ ද්විත්ව ආකෘතිය "සම්භාව්‍ය *(Classical)*" හා "නවතම සම්භාව්‍ය *(Neo-Classical)*" යන ආර්ථික ගුරුකුලයන් ද්විත්වය මගින් ම පැහැදිලි කර ඇත. නමුත් එම ගුරුකුලයන් මෙකී න්‍යාය යොදාගෙන කෙරන විවරණයන් අතර වෙනසක් පවතී. සම්භාව්‍ය හා නවතම සම්භාව්‍ය න්‍යායයන් අතර ද්විත්ව ආර්ථික ආකෘතික විවරණයේ පවතින ප්‍රධාන වෙනස වන්නේ කර්මාන්ත අංශයේ ශ්‍රම සැපයුම පාලනය කිරීම පිළිබඳව පවත්නා වෙනසයි. නූතන ආර්ථික විද්‍යාවේ ප්‍රමුඛතම ගුරුකුලය වන සම්භාව්‍යවාදීහු කෘෂිකාර්මික අංශයේ මූර්ත වැටුප් අනුපාතය ස්ථාවර යැයි දක්වනවිට නවතම සම්භාව්‍යවාදීහු ඊට වෙනස් අදහසක් පෙන්වා දෙති. ඉන් අදහස් වන්නේ කෘෂිකාර්මික අංශයේ ශ්‍රම සේවානියුක්තිය වෙනස් කිරීමක් එම අංශයේ නිමැවුම වෙනස් කිරීමක් නිසා විය හැකි බව ය. නමුත් නවතම සම්භාව්‍යවාදීන් ට අනුව පෙන්වා දෙන්නේ කෘෂිකාර්මික නිමැවුම කැප කිරීමකින් තොරව කර්මාන්ත අංශයට ශ්‍රමය සපයාගත නොහැකි බව ය. කර්මාන්ත අංශයේ දෘෂ්ටිකෝණයෙන් බලනවිට දිගු කාලීනව මූර්ත වැටුප් අනුපාතයේ වැඩිවීම සාධක දෙකක් මත රඳා පවති. එනම්, කෘෂිකාර්මික හා කාර්මික අංශයන් දෙකෙහි ම තාක්ෂණික ක්‍රියාවලියෙහි වර්ධන අනුපාත *(Rates of Thchnological Progress)* හා ප්‍රාග්ධන රශිකරණ *(Capital Accumulation)* අනුපාතය යි. සැඟවුණු සේවා වියුක්තියක් *(Disguised Unemployment)* නොපවතින බව මෙම න්‍යාය විවරණයේ දී හඳුනාගන්නා තවත් වැදගත් සාධකය කි.

### 4.3.2 ද්විත්ව ආර්ථික ආකෘතිය හා ආර්ථික සංවර්ධනය

ද්විත්ව ආර්ථිකයේ සංවර්ධන න්‍යාය ආර්ථිකයේ ද්විත්ව අවස්ථාවක් හඳුනාගනී. එනම්, ආර්ථික පද්ධතිය පසුගාමී *(Backward)* හෙවත් සාම්ප්‍රදායික *(Traditional)* අංශය හා පෙරටුගාමී *(Advanced)* හෙවත් නූතන *(Modern)* අංශය වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කෙරේ. තවත් ආකාරයකින් දක්වන්නේ නම් කර්මාන්ත හෝ නිෂ්පාදන *(Manufacturing)* අංශය හා කෘෂිකාර්මික අංශය යනුවෙන් ද මෙම ආර්ථිකයේ ද්විත්වභාවය වෙන්කළ හැක. ආර්ථිකයේ සමස්ත නිෂ්පාදන ශ්‍රිතය ශ්‍රමය, භූමිය හා ප්‍රාග්ධනය මත රඳා පවතින බව මෙම න්‍යාය මඟින් පිළිගනී. මෙහි දක්වන කර්මාන්ත අංශය සාම්ප්‍රදායික කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාකාරකම්වලින් යුක්ත වන අතර කෘෂිකාර්මික අංශය දියුණු අංශයෙහි අපේක්ෂාවන් සහිත උප අංශයක් ලෙස ඉදිරියෙන් පසුවේ.

මෙම න්‍යාය එමඟින් තහවුරු කෙරෙන න්‍යායාත්මක පසුබිම විග්‍රහ කිරීම සඳහා උපකල්පන කිහිපයක් මත පදනම් වේ.

- කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදනය භූමියේ හා ශ්‍රමයේ ශ්‍රිතයක් වේ. එනම්, කෘෂිකාර්මික නිෂ්පාදනය භූමිය හා ශ්‍රමය මත රඳා පවතී.
- භූමියේ රාශිකරණයක් *(Land Reclamation)* හැර ප්‍රාග්ධන රාශීකරණයක් ආර්ථිකයේ නොපවතී.
- භූමිය පෙරටුගාමී අංශයේ (කාර්මික අංශයේ) නිෂ්පාදන සාධකයක් නොවේ. මෙම අංශයේ නිෂ්පාදනය ශ්‍රමය හා ප්‍රාග්ධනය මත රඳා පවතී.





- කෘෂිකාර්මික අංශයෙහි හීනවන පරිමාණානුකූල ඵල[10] *(Diminishing Returns to Scale)* පවතී.
- නූතන අංශයේ දියුණු ප්‍රාග්ධනය භාවිතයට ගන්නා කෘෂිකර්මාන්තය (වාණිජකරණය වූ කෘෂිකර්මාන්තය - *Commercialized Agriculture*) හා සාම්ප්‍රදායික අංශයේ නොදියුණු ප්‍රාග්ධනය භාවිතයට ගන්නා කෘෂිකර්මාන්තය අතර පැහැදිලි වෙනසක් පවතී.
- සම්භාව්‍යවාදීහු මෙන්ම නවතම සම්භාව්‍යවාදීහු ද ශ්‍රමයේ ආන්තික ඵලදාව නිතරම ධන අගයක් ගන්නා බව උපකල්පනය කරන අතර සම්භාව්‍යවාදීහු එහි ශුන්‍ය වන අවස්ථාවක් පිළිබඳව සාකච්ඡා කරයි. ජනගහනය වැඩි වනවිට ශ්‍රමයේ ආන්තික ඵලදාව ශුන්‍යයට ළඟා වන බව ඔවුන් පෙන්වාදෙයි.
- සම්භාව්‍යවාදීන්ට අනුව කෘෂිකාර්මික නිමැවුම කැපකිරීමකින් තොරව කර්මාන්ත අංශයට ශ්‍රමය ලබාගත නොහැකිය.

භූමිය නිෂ්පාදන අංශයේ නිෂ්පාදන සාධකයක් නොවන බව උපකල්පනය කිරීමෙන් එම අංශයේ නිමැවුම ශ්‍රමයේ හා ප්‍රාග්ධනයේ ශ්‍රිතයක් වේ. එමෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා වන නිෂ්පාදන ශ්‍රිතය දිගුකාලීනව විතැන් වේ. ඉන් අදහස් වන්නේ කෘෂිකාර්මික නිෂ්පාදනය දිගු කාලීනව ඵලදායීව වැඩිවන බව ය. මේ නිසා දිගු කාලීනව කෘෂිකාර්මික නිෂ්පාදන ශ්‍රිතය ඉහළට විතැන් වේ. නමුත් කෘෂිකාර්මික අංශයේ පවතින්නේ හීනවන පරිමාණානුකූල ඵල වන බැවින් ආර්ථිකයේ ආයෝජනයන් කාර්මික අංශය වෙත සාපේක්ෂව නැඹුරු වේ. එහෙත් ජනගහනයේ වර්ධනය

10 "සාධක යෙදවුම් වැඩිකිරීමේ අනුපාතයට වඩා අඩු අනුපාතයකින් නිමැවුම වැඩිවන්නේ නම් එවැනි තත්ත්වයක් හීනවන පරිමාණානුකූල ඵල ලබන තත්ත්වයකි. (අතුකෝරාල, 2007).

සළකා බලනවිට කෘෂිකාර්මික අංශයේ අතිරික්ත ශ්‍රමික කණ්ඩාමක් බිහිවන අතර එය කාර්මික අංශය වෙත ඇදී යයි. නමුත් මහාචාර්ය ලුවිස් පෙන්වාදෙන ආකාරයට කෘෂිකාර්මික හා කාර්මික අංශයන්හි සැඟවුනු සේවා වියුක්තිය සම්පූර්ණ වනතුරු ජනගහනයේ වර්ධනයේ බලපෑමක් නොමැත. මේ තත්ත්වය තුළ දිගු කාලීනව ආර්ථිකයේ වැදගත් අංශය බවට කාර්මික අංශය පත්වන අතර කාර්මික නිමැවුම ඉහළ යයි. එහි තරම සාධක කිහිපයක බලපෑම මත තීරණය වේ.

- කාර්මික අංශයේ තාක්ෂණික වර්ධන වේගය
- ජනගහනයේ වර්ධන වේගය
- කාර්මික අංශයේ ශ්‍රම බලකායේ ප්‍රමාණය/කොටස

මෙහිදී විශේෂත්වය වන්නේ කෘෂිකාර්මික අංශයේ නිමැවුමේ වර්ධනය ජනගහනයේ වර්ධනය මත තීරණය වීමයි. කෘෂිකාර්මික නිෂ්පාදනයේ එලදාව වර්ධනය වී ජනගහනයේ වර්ධනයට වඩා කෘෂි නිමැවුම වර්ධනය ඉහළ යන බැවින් කාර්මික අංශයට අවශ්‍ය ශ්‍රම ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ගේ පදනම සකස් වේ.

මෙම කරුණු අනුව ද්විත්ව ආර්ථික ආකෘතිය මඟින් පැහැදිලි කෙරෙන ආර්ථික වර්ධන ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමේ දී ජනගහනයේ වර්ධනය යන සාධකය හා ආර්ථිකයේ ද්විත්ව අංශයන්හි ඇතිවිය හැකි දියුණුව සළකා බැලිය යුතුය. කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදනය වැඩිවනවිට කෘෂිකාර්මික නිෂ්පාදන ශ්‍රිතය ඉහළට විතැන් වේ. නමුත් ආර්ථික සංවර්ධනයේ උපායක්‍රමික සාධකය වන්නේ කාර්මික අංශයේ ප්‍රබෝධය යි. එය පියවර කිහිපයක ප්‍රතිඵලය කි. කෘෂිකාර්මික අංශය කාර්මික අංශයේ භාවිතයට ගත් ප්‍රාග්ධනය භාවිත කිරිම නිසාවෙන් නිෂ්පාදන තාක්ෂණික වර්ධනයක් ඇති වන අතර ඉන් කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිවී කෘෂිකාර්මික නිෂ්පාදන ශ්‍රිතය ඉහළට ගමන් කරයි. මේ සඳහා






හුදෙක් පෙරටුගාමී තාක්ෂණය හා ප්‍රාග්ධනය පමණක් නොව ජනගහනය වර්ධනයවීම ද හේතු වේ. මෙම කෘෂිකාර්මික වර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් කෘෂිකාර්මික අතිරික්තයක් බිහි වේ. එය ජනගහනයේ වර්ධන වේගය අභිබවා යන්නක් වේ. මේ නිසා ඒක පුද්ගල ආදායම ඉහළ ගොස් පාරිභෝගික ඉල්ලුම තුළ කාර්මික භාණ්ඩ ඉල්ලුම ඉහළයාම මෙන්ම කෘෂිකාර්මික අතිරික්තයෙන් උපන් ආයෝජනයන් කාර්මික අංශයට අනුයුක්තවීම යන කරුණු නිසාවෙන් කාර්මික ප්‍රබෝධයක් ඇති වේ. එබැවින් කාර්මික ශ්‍රමය හා කාර්මික නිෂ්පාදනය ආර්ථික සංවර්ධනයේ ප්‍රබල සාධකයන් බවට පත්වේ.

4.3 රූප සටහන

ද්විත්ව ආර්ථික ආකෘතියේ සංවර්ධන පියවර




## පස්වන පරිච්ඡේදය

# ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ කාර්ය භාරය:ඓතිහාසික සාක්ෂි

ඉහත පරිච්ඡේදවලදී ඉදිරිපත් කරන ලද සෑම න්‍යායක් මගින්ම ආර්ථික සංවර්ධනයේ පදනම වශයෙන් කෘෂිකාර්මික අංශය ඉතා වැදගත් මෙහෙයක් කරන බව පැහැදිලිවම පෙන්වා දී ඇත. එම න්‍යායාත්මක කරුණු සැලකිය යුතු මට්ටමකින් තහවුරු කරගැනීම සඳහා මෙම පරිච්ඡේදයේ දී ඓතිහාසික සාක්ෂි කිහිපයක් ඉදිරිපත් කෙරේ.

## 5.1 ජපානය



වර්තමානයේ දී දියුණු බවේ හිණිපෙත්තේ පසුවන අද්විතීය ආසියාතික එකම රට ජපානය යි. කිසිදු ආකාරයකින් ආර්ථික සංවර්ධනය, සඳහා සුදුසු පරිසරයක් නොතිබුණු ජපානය අද පසුවන තත්ත්වය දෙස බලනවිට එය ආශ්චර්යයක් ලෙස සැලකීම සාවද්‍ය නොවේ. මෙලෙස ජපානය දියුණුවෙන් දියුණුවට පත්වීමේ මූලික සාධකය තොකුගව හා මෙයිජි පාලන යුගයන් බව ජපන් ඓතිහාසික විකාශනය දෙස ආපසු හැරී බැලීමේ දී පැහැදිලි වේ. ජපානයේ ඓතිහාසික පරිවර්තනයේ දි වැඩවසම් ක්‍රමය හා එහි ආර්ථික ක්‍රියාදාමයන් දෙස අවධානය යොමුකිරීම වැදගත් වේ. වැඩවසම් ක්‍රමයේ නිතිරීතිවලින් ගොවියාත් කෘෂිකාර්මික අංශයත් සීමාකර තිබිණි. ගොවියා ඉඩමට සීමාකර තිබුණේ වෙනත් ප්‍රදේශයකට බැහැරව යාම තහනම් කරමිනි. විශේෂයෙන් පංති ක්‍රමය යටතේ ගොවීන්ට සිය ආර්ථික ක්‍රියවලියෙන් හෙවත් ගොවිතැනින් ඉවත්වීමට අවස්ථාවක් නොවීය. මෙම කාලසීමාවේ දී රටේ ප්‍රධාන





ධනෝපායන මාර්ගය වූයේ කෘෂිකර්මාන්තය යි. එය වැඩි දෙනෙකුගේ ජීවානෝපාය ද විය. මේ තත්ත්වය තුළ රජයේ නඩත්තුව සඳහා අවශ්‍ය ආදායම ලබාගත හැකිවන පරිදි කෘෂිකාර්මික බදු ක්‍රමය ක්‍රියාත්මක විය. කෙසේවෙතත් *තොකුගාවා පාලන කාලය*[11] වනවිට රටේ පාලන තන්ත්‍රයේ විශේෂ අවධානය කෘෂිකාර්මික අංශය කෙරෙහි යොමුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් එම අංශයේ සුවිශේෂී දියුණුවක් ඇති විය (බණ්ඩාර, 1998). මේ අනුව අපට නිගමනය කළ හැක්කේ ජපානයේ නූතන කාර්මිකකරණයේ පදනම ලෙස විද්වතුන් බොහෝ දෙනෙක් පෙන්වාදෙන වැඩවසම් ආර්ථිකයට පණනල ලබාදෙමින් යම් පමණකට කෘෂිකාර්මික දියුණුවක් ඇති කොට ආර්ථිකයේ සැලකියයුතු ස්ථාවරත්වයක් මෙයිජි පාලනයට[12] ලබා දී ඇත්තේ තොකුගව පාලනය වන බව යි. මෙම යුගයේ දී ජපානයේ ප්‍රධාන ආර්ථික කටයුත්ත ලෙස කෘෂිකර්මාන්තය පැවති අතර එය දියුණු කිරීම සඳහා

1. එක කන්නයක් වෙනුවට දෙකන්නයක් වගා කටයුතු සැලසීම
2. රසායනික පොහොර භාවිතය වැඩි කිරීම
3. වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය වැඩි කර ගැනීමට උත්සාහ කිරීම

යන ක්‍රියාමාර්ග ගෙන ඇති බව බණ්ඩාර (1998) දක්වයි. තොකුගව පාලනයේ මධ්‍ය භාගයේ දී මේ ආකාරයට කෘෂිකාර්මික ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම මගින් ලැබූ දියුණුව පිළිබඳ සැලකීමේදී 1860 වන විට ජපානයේ මුළු සහල් නිෂ්පාදනයෙන් 60% ක් වෙළඳපොළ ඉලක්ක කරගෙන සැපයීමට හැකියාව ලබා ගෙන ඇති

11 "අනෙකුත් අංශවලට වඩා කෘෂිකාර්මික අංශය තොකුගාවා පාලනයට ඉතා වැදගත් විය. එම අංශය විසින් රජයේ ආදායම සපයන ලදී" (බණ්ඩාර, 1998).

12 "වර්ෂ 268කට ආසන්න කාලයක් ජපානයේ අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබූ තොකුගාවා පවුලේ පාලන ක්‍රමය 1868 ජනවාරි මාසයේ දී බිඳවැටුණි. මෙම ඓතිහාසික යුග පෙරළිය මෙයිජි පුනරුදය (Meiji Restoration) වශයෙන් හඳින්වේ." (බණ්ඩාර, 1998).

බව සඳහන් කළ යුතුය[13]. මෙයිජි පාලනයෙන් ජපානය සමාජ, ආර්ථික හා දේශපාලනික වශයෙන් දියුණුවට පත්වූයේ අනෙක් සියුලු කාලසීමාවන් අභිබවමිනි. බණ්ඩාර (1998) පෙන්වාදෙන පරිදි බටහිර ලෝකයෙන් පිටස්තරව බටහිර ලෝකයේ දියුණු රටවලට සමාන ආර්ථික සංවර්ධනයක් අත්කරගත් ප්‍රථම රට බවට මෙයිජි පුනරුදයෙන් පසුව ජපානය පත්විය. මෙම වර්ධනීය තත්ත්වය යටතේ 19 වන සියවස අගභාගයේ සිට ජපානය ක්‍රමයෙන් කාර්මික රටක් බවට පත්වූයේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකාර්මික අංශයේ දායකත්වය ඉක්වමා කාර්මික අංශය ඉදිරියට පැමිණෙමිනි[14].

13 ''දයිම්යෝවරු සහ ඉඩම් හිමියන් විසින් වගා කළහැකි ඉඩම් ප්‍රමාණය වැඩි කිරීමට උත්සාහ දරණු ලැබුව ද ඉඩම් ප්‍රමාණය වැඩිවූයේ එක්තරා සීමාවක් දක්වා පමණි. ගොවීන්ගෙන් වැඩි ප්‍රමාණයක් වගා කරන ලද්දේ හෙක්ටයාරයකට වඩා අඩු ඉඩම් ප්‍රමාණයකි. එසේ වුවද ගොවීහු තොකුගාවා යුගයේ ආරම්භයේ දී පමණ වාණිජ අරමුණු මත කෘෂිකාර්මික අංශය පවත්වා ගෙනයාමට පෙළඹුනහ. යුරෝපා රටවල කෘෂිකාර්මික අංශය වාණිජ අරමුණු මත නිෂ්පාදන කටයුතු ආරම්භ වූයේ වැඩවසම් ක්‍රමයේ බිඳවැටීමත් සමඟ ය. එහෙත් ජපානයේ කෘෂිකාර්මික අංශය වාණිජ අරමුණු කරා යොමුවීම වැඩවසම් ක්‍රමය තහවුරුවීමත් සමඟ ම සිදුවිය. 1860 වනවිට ජපානයේ මුලු සහල් නිෂ්පාදනයෙන් 60%ක් පමණ වෙළඳපොළ ඉලක්ක කරගෙන නිෂ්පාදනය විය.'' (බණ්ඩාර, 1998).

14 ජපානයේ ආර්ථික සංවර්ධනය සහ ද.දේ.නි.යේ කෘෂිකාර්මික හා කාර්මික අංශයන්හි දායකත්වය (1885-1920)

| වර්ෂය | ද.දේ.නි. (යෙන් දශ ලක්ෂවලින්) | කෘෂිකාර්මික අංශයේ දායකත්වය (%) | කාර්මික අංශයේ දායකත්වය (%) |
|---|---|---|---|
| 1885 | 3774 | 42.1 | 7.0 |
| 1890 | 4639 | 39.8 | 7.9 |
| 1895 | 5375 | 37.0 | 8.9 |
| 1900 | 5966 | 34.7 | 11.2 |
| 1905 | 6214 | 31.6 | 12.6 |
| 1910 | 7424 | 30.9 | 15.6 |
| 1915 | 8763 | 30.7 | 19.4 |
| 1920 | 10937 | 27.3 | 18.6 |

මූලය : Penelope, Japanese Economic Development -''බණ්ඩාර, (1998)''





එහෙත් 1945 වර්ෂය වනවිට ජපානය දෙවන ලෝක යුද්ධය හේතුවෙන් යුධමය වශයෙන් විනාශයට පත්වූ රටක් විය. එම වර්ෂයේදීම කොන්දේසි විරහිතව මිත්‍ර ජාතීන්ට[15] යටත් විය. පළමු ලෝක සංග්‍රාමයෙන් ජපානය ආර්ථික වශයෙන් සංවර්ධනය වුවද දෙවන ලෝක සංග්‍රාමයෙන් එය සපුරා පරස්පර තත්ත්වයට පත්විය. 1945 න් පසුව ජපානය තුළ අමරිකානුවන් යටතේ සමාජ, ආර්ථික හා දේශපාලනික අංශවල වෙනස්කම් ඇතිවිය. 1950 පමණ වනවිට රට නැවත ආර්ථික වශයෙන් ගොඩනැගුණු තත්ත්වයක් පෙන්නුම් කළේය. මේ නිසා ජපානය වර්තමානයේ සාකච්ඡාවට ගනු ලබන දියුණු කාර්මික රටක තත්ත්වයට පත්විය. ''ජපානයේ ආර්ථික සංවර්ධනය'' යන කෘතියේ දී සුනන්ද මද්දුම බණ්ඩාරයන් විසින් ජපානයේ වේගවත් ආර්ථික සංවර්ධනයකට ඉවහල් වූ මූලික සාධක කිහිපයක්[16] පෙන්විය. ඒ අතර වඩා වැදගත් වන්නේ කෘෂිකාර්මික අංශයෙන් කාර්මික අංශයට සම්පත් මාරුවීම විශේෂත්වයක් සැළකිය හැකිවීමයි.

ජපානය තුළ බටහිර රටවල මෙන් කෘෂිකාර්මික විප්ලවයක්[17] ඇති නොවුවද කෘෂිකාර්මික අංශයෙන් කාර්මික අංශයට සම්පත් මාරුවීමක් සිදුවූ බව බොහෝ දෙනා පිළිගනු ලබන සත්‍යතාවයකි. කෙසේනමුත් ජපානයේ කෘෂිකාර්මික සංවර්ධනය ආර්ථික සංවර්ධනයට වූ දායකත්වය පිළිබඳ අදහස් විමසීමේ දී

15 දෙවන ලෝක සංග්‍රාමයේ දී ඇමරිකාව ප්‍රමුඛව යුධ වාතාවරණය සඳහා පෙළගැසී සිටි රටවල්


16 1. කොන්ෆියුසියස් දහමේ බලපෑම 2. සාම්ප්‍රදායික පැවැත්ම 3. නිෂ්පාදන තාක්ෂණය ලබාගැනීම 4. ඉහළ ඉතුරුම් අනුපාතය 5. කෘෂිකාර්මික අංශයෙන් කාර්මික අංශයට සම්පත් මාරුවීම 6. මූලය ප්‍රතිපත්තිය, අධි ණය සැපයුම සහ අධි ණය ඉල්ලුම 7. වෘත්තීය සම්බන්ධතා

17 ''යුරෝපා රටවල කාර්මිකකරණයට පදනම වැටුණේ ඒ රටවල ඇති වූ කෘෂිකාර්මික විප්ලවයන්ගෙනි. කෘෂිකාර්මික විප්ලවය හේතුවෙන් කාර්මික අංශයේ වර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය, ශ්‍රමය හා තාක්ෂණය කෘෂිකාර්මික අංශයෙන් කාර්මික අංශයට ලැබුණු අතර....'' (බණ්ඩාර, 1998).

මහාචාර්ය කේ. ඔකාවා[18] ඇතුළු හිතොත්සුබසි *(Hitotsubashi)* විශ්වවිද්‍යාලයේ ආචාර්ය කණ්ඩායම ඉදිරිපත් කළ අදහස හා ජේ. නකමුරාගේ අදහස වැදගත් වේ. ඔකාවා ඇතුළු පිරිස දක්වන ආකාරයට ජපානයේ කාර්මිකකරණය කෘෂිකාර්මික අංශය පදනම්ව ආරම්භ වී ඇත.

### 5.1 රූප සටහන

**ඔකාවා න්‍යායට අනුව ජපානයේ ආර්ථික සංවර්ධනයේ පියවර**




ජපානයේ කෘෂිකාර්මික අංශයේ ඇතිවූ වර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් රජයේ ඉඩම් බදු ආදායම ඉහළ ගිය අතර එය කාර්මික අංශය දියුණු කිරීම සඳහා යොදා ගැනීමට ජපන් ජාතිකයන්ට හැකි වී ඇත. එමෙන්ම කෘෂිකාර්මික අංශයෙන්, වැඩෙන නාගරික ජනතාවට අවශ්‍ය ආහාර සම්පාදනය සිදු වූ අතර ග්‍රාමීය ඉතුරුම්, ශ්‍රමය හා අපනයන ආදායම ආදිය ද කාර්මික සංවර්ධනයට දායක වී ඇත. ජපානයේ ආර්ථික සංවර්ධනයේ විශේෂත්වය සෙසු යුරෝපීය කාර්මික රටවල් සමඟ සැසඳීමෙන්

[18] ජපානයේ ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ දායකත්වය පිළිබඳව මහාචාර්ය ඔකාවා පෙන්වූ අදහස් ''ඔකාවා න්‍යාය'' මඟින් සවිස්තර කෙරේ.





හඳුනා ගත හැකිය. එමෙන්ම ජේ. නකමුරා පෙන්වාදෙන පරිදි කාර්මිකකරණය ආරම්භවීමට පෙර කෘෂිකාර්මික අංශය විශාල දියුණුවක් ලබා තිබූ බව තර්ක කරනු ඇත. යුරෝපීය රටවල ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී කෘෂි අංශයේ ඉඩම්, ශ්‍රමය හා නිෂ්පාදන තත්ත්වයන්ගේ විශාල වෙනස්කම් ඇති වූ කෘෂිකාර්මික විප්ලවයක් සිදුවුව ද ජපානයේ එවන් තත්ත්වයක් දැකගත නොහැකිවුව ද කෘෂි අංශයෙන් කාර්මික අංශයට සම්පත් මාරුවීමක් ආර්ථික සංවර්ධනයේ දී නිහඬවම සිදුවීම ජපානයට ම ආවේණික වූවකි. නමුත් ඔකාවා හා නකමුරා යන පුද්ගලයන්ගේ මතවාද අනුව ද පැහැදිලි වන්නේ ජපානයේ කාර්මික සංවර්ධනයට අවශ්‍ය සම්පත් කෘෂිකාර්මික අංශයෙන් ලැබුණ බව ය.

ජපානයේ ආර්ථික සංවර්ධනය පිළිබඳ අදහස් දක්වන Ohno (2006) පෙන්වා දෙන්නේ ජපානයේ ඓතිහාසික විකාශය තුළ ප්‍රධාන අවධි හතරක් (04) පහත සඳහන් පරිදි බෙදාවෙන් කළ හැකි බව ය. එනම්,

- අධිරාජ්‍යවාදී බලයට යටත්ව පැවති කාලය (පූර්ව ඓතිහාසික යුගය)
- සමුරායි පාලන සමය
- මෙයිජි පාලනය සහ යුධ සමය
- දෙවන ලෝක යුද්ධයට පසු කාලය

වශයෙනි. *'The Economic Development of Japan''* යන කෘතිය මඟින් ඔහු පෙන්වාදෙන ආකාරයට පූර්ව ඓතිහාසික යුගයේ දී දඩයම ප්‍රධාන ආර්ථික කාර්යභාරය වුවද සීමා සහිතව කෘෂිකාර්මික කටයුතු ද සිදු කර ඇත. මිනිසුන් දුරස්ව ජීවිකාව පවත්වා ගෙන ගොස් ඇත. නමුත් ශත වර්ෂ කිහිපයකට පසුව මෙම අඩු දියුණු සමාජ ආර්ථික තත්ත්වය වෙනස් වී වර්ධනීය තත්ත්වයන්ට ළඟා විය. කෙසේනමුත්, සමාජය තුළ පාලනයේ බලය එක් පාර්ශවයක් වෙත සන්කේන්ද්‍රණයවීම හේතු කරගනිමින් රණශූර

පන්තිය හෙවත් සමුරායිවරු නැගී සිටින්නට විය. ඒ හේතුවෙන් ජපානය තුළ 12 වන ශතවර්ෂය වනවිට සමුරායි රාජ්‍ය තන්ත්‍රයන් බිහිවූ අතර පළමුව කමකුරායි හි සමුරායි පාලනය ගොඩනැගුණි. මේ ආකාරයෙන් ජපානයේ පාලන තන්ත්‍රය කාලානුරූපව වෙනස්වන විට ආර්ථික ප්‍රතිපත්තීන්ද ඒ ආකාරයෙන් වෙනස්වීමට ලක්විය. වර්ෂ 1950-53 කාලය ජපානයේ ඉහළම ආර්ථික වර්ධන අවධිය (Ohno, 2005) යි. කෙසේවතත් 1970 වර්ෂය ජපාන ආර්තිකයට විශේෂ වේ. එයට හේතුව ජපානය ඒ වනවිට ලෝකයේ තිරසරව සංවර්ධනය වන රටක් වශයෙන් ඉහළ මූර්ථ දළ ජාතික නිෂ්පාදනය වර්ධනය වාර්තා කිරීමයි. මෙහිදී වැදගත් වන්නේ ජපාන සංවර්ධනයේ කෘෂිකාර්මික අංශයේ සිදුවූ පරිවර්තනය යි. ජපාන කෘෂිකාර්මික සංවර්ධනයේ විශේෂ ලක්‍ෂණ තුනක් (03) හඳුනා ගතහැකිය (සේනානායක, 2008).

- පැවති සුළු ගොවිපොළ ක්‍රමය තුළ ම කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නංවා ගැනීම
- සාධක ඵලදායීතාව විශාල වශයෙන් ඉහළ නංවා ගනිමින් කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිකර ගැනීම
- කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය එක්ව සමස්ත ආර්ථික වර්ධනය කරා ගමන් කිරීම

ජපානය සාධක ඵලදායීතාව ඉහළ නංවා ගැනීම සඳහා නව තාක්‍ෂණය හා නව යෙදවුම් යොදා ගැනීම පුළුල් කෙරිණ. තවද, ජපානයේ ආර්ථික සංවර්ධනයේ කැපී පෙනෙන කාරණය වන්නේ කෘෂිකාර්මික අංශයට වඩා සීඝ්‍රයෙන් කෘෂිකාර්මික නොවන අංශ ප්‍රසාරණය වීමයි. කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නංවා ගැනිම සඳහා ප්‍රාග්ධනය හා විදේශ විනිමය අඩුවෙන් භාවිතයට ගැනීම





නිසා කාර්මික සංවර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය හා ආයෝජනයන් වර්ධනය විය[19].

## 5.2 තායිවානය




නව කාර්මික රටක් ලෙස තායිවානය ද ආසියාකරය තුළ වර්තමානයේ දී ප්‍රසිද්ධය (සේනානායක, (2008). තායිනාවයේ ආර්ථික සංවර්ධනය පිළිබඳ විකාශය විමසා බැලීමට ප්‍රථමව එරටෙහි ආර්ථික තත්ත්වය අවබෝධයට ගැනීම වැදගත් වේ. Lau (2002) පෙන්වාදෙන ආකාරයට තායිවානය පිළිබඳව වර්තමානයේ දී සාකච්ඡා කරනුයේ නැගෙනහිර ආසියානු කලාපයේ නව කාර්මික රටක් *(Newley Industrialization Economy - NIE)* වශයෙනි. දකුණු කොරියාව *(South Korea)*ට පෙර හා හොන් කොන්ග් *(Hong Kong)*වලට පසුව කාර්මීකරණයට තායිවානය ලක්වී ඇත. තායිවානයේ ආර්ථික වෘද්ධිය කෙසේදයත් ගෙවුනු කාලසීමාව තුළ මූර්ත දළ දේශීය හා දළ ජාතික නිෂ්පාදනයෙන්

19 "එසේම නිර්යාත ආර්ථියක් නිෂ්පාදනය කිරීමෙන් ජපන් කෘෂිකර්මය විසින් කර්මාන්ත නවීකරණය කිරීම සඳහා අවශ්‍ය විදේශ ප්‍රාග්ධනය ආයාත කිරීමට ඉඩ සැලසීමෙන් විශාල මෙහෙයක් ඉටුකරන ලදී. අමු - සිල්ක් *(Raw - Silk)* තේ වැනි අර්ධ නිෂ්පාදිත ද්‍රව්‍යවලින් මේ කාලය තුළදී විශාල නිර්යාත අතිරික්තයක් ලබාගැනීමට ජපානයට හැකිවිය. නමුත් මෙම කාලය තුළදී කාර්මික සංවර්ධනය සඳහා කෘෂිකර්ම අංශයෙන් ඉටුකළ ඉතාම වැදගත් කාර්යභාරය නම් ආයෝජනය කළ හැකි සම්පත් *(Investible Resources)* ලබාදීමයි. ජපානයේ ආර්ථික සංවර්ධනයේ මුල් කාලවලදී අවශ්‍ය වූ ප්‍රාග්ධනයෙන් විශාල කොටසක් සපයා ගනු ලැබුයේ කෘෂිකාර්මික අංශයෙන් කාර්මික අංශය වෙත සම්පත් මාරු කිරීමෙනි." (සේනානායක, 2008).

06%-08% අතර අගයකින් ඉහළින් ම වර්ධනය කරා යොමුව පවතී. තායිවානයේ මෙම සැබෑ පරිවර්තනය පිටුපස ඇති ප්‍රධාන බලවේගය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රසාරණාත්මකව ප්‍රබෝධනයවීම වුවද ඒ සඳහා අවශ්‍ය ශක්තිය කෘෂි අංශය මඟින් ලැබී ඇතිබවට අවශ්‍ය සාක්ෂි ආර්ථික ඉතිහාසය පරීක්ෂා කිරීමේ දී හඳුනාගත හැකිය.

"තායිවානය, ආර්ථික සංවර්ධන ආකෘතියක් වශයෙන්.. *(Taiwan As a Model for Economic Development)*" යන කරුණු දැක්වීමේ දී *Lawrence J. Lau* තායිවාන් සංවර්ධනයේ පුරෝගාමී සංවර්ධන ප්‍රතිපත්තීන් කිහිපයක් අවධාරණය කර ඇත. ඒ අතර ප්‍රමුඛ හා වැදගත් ප්‍රතිපත්තියක් වන්නේ ඉඩම් ප්‍රතිසංස්කරණය *(Land Reform)* යි[20]. ඉඩම් ප්‍රතිසංස්කරණය කෘෂිකාර්මික ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා දිරිගැන්වීමක් බවට පත්විය. එමෙන්ම කෘෂිකාර්මික අංශය වෙත භෞතික හා මානව ප්‍රාග්ධන ප්‍රවාහය මුදාහැරීමක් ද සිදුවිය. ඒ තුළින් කෘෂිකාර්මික ඉල්ලුම ඉහළ ගිය අතර ආර්ථිකය තුළ ආයෝජන ප්‍රවාහය කාර්මික අංශය වෙත විතැන්වීමට මේ තත්ත්වය බලපා ඇත. කෘෂි අංශයේ මෙකී පරිවර්තනය තුළින් ජනනය වූ ආයෝජනයන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයේ ආයෝජනය කිරීම නිසා කාර්මික අංශය පුළුල් වූ අතර ඉන් පසුකාලීනව ආර්ථික සන්දර්භය තුළ කාර්මික භාණ්ඩ කෙරෙහි විශේෂත්වයක් ඇතිවීමට අවශ්‍ය පදනම සැකසුණි. කෙසේනමුත් *Lau* සිය විග්‍රහය අවසානයේ දී තායිවාන ආර්ථික සංවර්ධනයෙන් දියුණුවෙමින් පවතින රටවලට ගතහැකි පාඩම් කිහිපයක් අවධාරණය කර ඇත්තේ සංවර්ධනය ළඟා කර ගැනීමට නම් සම්පත් කෘෂිකාර්මික අංශයෙන් කාර්මික අංශයට

20 "Land Reform—the successful (and peaceful) land reform, one of the very few in the world, helped raise agricultural productivity, improve the income distribution, and release savings for investment in the industrial sector." (Lau, 2002).





පරිවර්තනයවීම අත්‍යාවශ්‍යයෙන් ම සිදුවිය යුතු බව[21] ද අවධාරණය කරමිනි.

සේනානායක (2008) දක්වන පරිදි 1895-1960 දක්වා කාලය තුළ තායිවානයේ සිදුවූ අන්තර් ආංශික ප්‍රාග්ධන ප්‍රවාහය ලී *(Lee)* විසින් අධ්‍යයනය කොට ඇත. මොහු භාවිතයට ගත් කාලසීමාව තුළ තායිවාන ආර්ථිකය සාමාන්‍යයෙන් වර්ෂයකට 3% කට වඩා වැඩියෙන් වර්ධනය වූ බවත් ශ්‍රම ඵලදායීතාව වර්ෂයකට 1.8% ක වේගයෙන් වැඩිවී ඇති බවත් එමඟින් පෙන්වා දී ඇත. මෙතරම් ඉහළ මට්ටමක ශ්‍රම ඵලදායීතාවයක් ලබා ගැනීමට හැකිවී ඇත්තේ ගොවීන් විශාල වශයෙන් විචල්‍ය යෙදවුම් එනම් ප්‍රධාන ලෙසම පොහොර භාවිතා කිරීම නිසාය. මෙහිදී වැදගත්වන තවත් වැදගත් කාරණයක් වන්නේ කෘෂිකර්මය තුළ මෙම කාලයේ දී ස්ථාවර ප්‍රාග්ධන යෙදවුම් ඉතාමත් ම සීමිත වීම ය. තායිවානයේ අන්තර්-ආංශික ප්‍රාග්ධන ප්‍රවාහය සිදුවූ කාලයේ දී කෘෂිකාර්මික අංශයේ සිදුවුනු වැදගත් වෙනසක් වනුයේ කෘෂිකාර්මික අංශයේ ඉල්ලුම් සංයුතිය විශාල වශයෙන් වෙනස්වීම ය. මෙයින් අදහස් වන්නේ කෘෂිකාර්ක අංශය තුළ ගෙවීම් හා අයවීම් අතර සිදුවූ පරිවර්තනය යි. මේ පිළිබඳව ජොන්ස්ටන් හා කිල්බිගේ අදහස් පදනම් කරගනිමින් කරුණු දක්වන සේනානායක (2008) දක්වන්නේ තායිවාන කෘෂි අංශයේ සිදුවූ මෙම පරිවර්තනය මඟින් එම අංශයේ තාක්ෂණික දියුණුව හා විශේෂිකරණ ක්‍රියාවලිය නිරූපනය වන බව යි. ඉහත අධ්‍යයනය සිදුවූ කාලසීමාව තුළ ආර්ථිකයේ කෘෂිකාර්මික නිමැවුමෙන් අලෙවි කරන ලද කොටස ඉහළ අගයක පැවතීම තායිවාන සංවර්ධන ගමන් මගෙහි කැපී පෙනන ලක්ෂණයක් විය. උදාහරණ වශයෙන් 1911-1915 අතර කාලයේදී ආර්ථිකයේ සමස්ත කෘෂිකාර්මික නිමැවුමෙන් 56%ක් ඉක්මවූ ප්‍රතිශතයක් අලෙවි වී ඇති

21 "The transformation from agriculture to industry is inevitable" (Lau, 2002).

අතර 1936-1940 කාලයේ දී එම අගය 71% ඉක්මවිය (සේනානායක, 2008).


ජොන්ස්ටන් හා කිල්බිගේ විවරණය අනුව තායිවාන ආර්ථිකයේ මෙම ව්‍යුහාත්මක පරිවරතනය තුළ සැබෑ කාර්යභාරයක් කෘෂිකාර්මික නිර්යාත මඟින් ඉටුකර ඇත. 1958 කාලසීමාව වනතෙක් තායිවානයේ සමස්ත නිර්යාතවලින් කෘෂිකාර්මික නිර්යාත සාපේක්ෂව ඉහළ අගයක පැවතුණ ද පසුකාලීනව එය අඩුවිය. එහෙත් කෘෂිකාර්මික නිර්යාත ඉපැයුම්වල නිරපේක්ෂ වැදගත්කම ඉහළ අගයක ගැණුනි. එසේ කෘෂිකාර්මික නිර්යාත ඉපැයුම් ඉහළයාම මඟින් ගොවීන්ගේ ආදායම ඉහළ ගිය අතර එය දේශීය කාර්මික භාණ්ඩ ඉල්ලුම ඉහළයාමට හේතුවිය. එතුළ ආයෝජනය කෘෂි අංශයේ සිට කාර්මික අංශය වෙත මාරුවිය. තායිවාන ආර්ථිකයේ සිදුවූ මෙම ව්‍යුහාත්මක පරිවර්තනයේ ගලායාම 5.1 රූප සටහන මඟින් දක්වා ඇත.





5.2 රූප සටහන

**තායිවාන් ආර්ථික සංවර්ධන ගමන්මඟ**





ඉහත රූප සටහනට අනුව නව කාර්මිකකරණය දක්වා ආර්ථික ප්‍රගමනයට අවශ්‍ය පදනම කෘෂිකාර්මික අංශයේ සිදුවූ ව්‍යුහාත්මක වෙනස හා ඒ හරහා ඇතිවූ ආයෝජන අවස්ථාවන්ගේ වෙනස්වීම් මඟින් ලැබී ඇති බව සරල වශයෙන් ම අවබෝධ වේ.

මෙම අදහස් ද්විත්වයෙන් ම පැහැදිලිවන්නේ තායිවානයේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ වත්මන් දියුණු කාර්මිකකරණයට අවශ්‍ය පදනම කෘෂිකාර්මික අංශයේ සිදුවූ ප්‍රතිපත්තිමය ප්‍රගතිය මඟින් ලැබී ඇති බව ය. දියුණු වූ කෘෂි අංශය තුළින් කාර්මික අංශයට සම්පත් මාරු කිරීම සඳහා ඉවහල් වූ යාන්ත්‍රණයන් මොනවාදැයි සොයා බලනවිට විවිධ කාරණා අනාවරණය වේ. මූල්‍ය ආයතන මඟින් කරන ලද මාරු කිරීම්, බදු මුදල් යොදා ගැනීමෙන් රටේ ප්‍රාග්ධන ස්කන්ධය ඉහළ දැමීමෙන්, ස්වේච්ඡා ඉතිරිකිරීම් ආදී වශයෙන් අන්තර් ආංශික වශයෙන් සම්පත් මාරුකිරීමක් තායිවානය ආර්ථික විකාශනය තුළින් ගම්‍ය වේ. ඒ අනුව කෘෂි අංශයේ ලබන දියුණුව ආර්ථිකයේ අනෙක් අංශවලට ද යොමු කිරීමෙන් තායිවාන ආර්ථිකය වර්තමානයේ දී කාර්මීකකරණය වෙත යොමු කර ඇති බවත්, ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකාර්මික අංශයේ කාර්යභාරය ඉතා වැදගත් වන බවත් මෙම තොරතුරු මඟින් සනාථ වේ.





## 5.3 ඇමරිකාව




වර්තමානයේ දී දියුණු ආර්ථික හා සමාජීය පද්ධතියකට උරුමකම් කියමින් ලෝකයම පාලනය කරන බලකාමයක් පෙන්වන ඇමරිකාව පවා සංවර්ධනයේ පදනම වශයෙන් යොදා ගෙන ඇත්තේ කෘෂිකාර්මික අංශයයි. *''ඇමරිකානු ආර්ථිකයේ සංක්ෂිප්ත සටහන්''* යන කෘතියේ දක්වන පරිදි ඇමරිකානු ඉතිහාසයේ ජාතියේ මුල් අවධියේ සිටම ගොවිතැන අතිශය වැදගත් තැනක් උසලා ඇත (ඇමරිකා එක්සත් ජනපද ප්‍රවෘත්ති සේවය, 1991). ඇමරිකාව කෘෂිකර්මය හඳුනා ගනු ලබන්නේ කෘෂි ව්‍යාපාරයක්[22] වශයෙනි. 19 වන සියවස මැද භාගයේ කාර්මික විප්ලවය ඇමරිකාව ග්‍රහනයට යටත් කර ගන්නා කාල සීමාව වන විට කෘෂිකර්මය හා කර්මාන්ත අතර සම්බන්ධය වඩාත් කැපී පෙනුණි. ගමනාගමන ක්ෂේත්‍රයේ කර්මාන්ත දියුණුවීම නිසා ගොවියාට භාණ්ඩ වෙළඳපොළට ප්‍රවාහනය කිරීමේ හැකියාව මහත් සේ දියුණු විය. ගොවිපොළවලින් ඉවත් කෙරුණු ගොවීන් කර්මාන්ත ශාලා හෝ මෝල්වල වැඩ කිරීමට නගරවලට රොක් විය. මෙම ප්‍රකාශය තුළින්

22 ''කෘෂි ව්‍යාපාර සේ හැඳින්වෙන්නේ වර්තමාන එක්සත් ජනපදයෙහි කෘෂි ව්‍යවසායේ මහා පරිමාණ ස්වභාවයයි. මෙම සංකල්පයට පෞද්ගලික ගොවියාගේ සිට කෘෂි රසායන නිපදවන බහුජාතික සමාගම් දක්වා සියලු ගොවිපොළ සම්බන්ධ ව්‍යාපාර සංකීර්ණයම ඇතුළත් වේ. එයට ගොවි සමූපකාර සමිති, ග්‍රාමීය බැංකු, කෘෂි භෝග, නැව්ගත කරන්නන්, භෝග වෙළඳුන්, කෘෂි උපකරණ නිපදවන වෙළඳ සමාගම්, ආහාර පිළියෙළ කිරීමේ කර්මාන්ත, වෙළඳසැල් දාමයන් හා වෙනත් විවිධ ව්‍යාපාර අඩංගු වේ'' (ඇමරිකා එක්සත් ජනපද ප්‍රවෘත්ති සේවය, 1991).

මහාචාර්ය රානිස් හා මහාචාර්ය ෆෙයිගේ අදහස් වර්තමානය තුළ ද පිළිගත හැකි බව නැවතත් තහවුරු වන අතර ඒ තුළින් යළිත් විද්‍යමාන වනුයේ ආර්ථික සංවර්ධනයට කෘෂි අංශයේ දායකත්වය ඉතා වැදගත් වන අංගයක් බව ය.

## 5.4 එංගලන්තය




කෘෂිකාර්මික සංවර්ධනය මුලාරම්භය කරගනිමින් ආර්ථික ප්‍රගමනයක් කරා රටක් ගමන් කරනුයේ කුමන ආකාරයකින් ද යන්න එංගලන්තයේ ආර්ථික ඉතිහාසය හැදෑරීමේ දී අවබෝධ වේ. වර්තමාන එංගලන්තය අද පවතින තත්ත්වයට ගෙන ඒමට හැකි වූයේ *"කාර්මික විප්ලවය (Indutrial Revolution)"* නමින් හැඳින්වූ විප්ලවය නිසා බව සෝමසුන්දර (1992) පෙන්වා දෙයි. කාර්මික සංවර්ධනයේ වේගය වැඩි වූයේ එයට ගැලපෙන වාතාවරණයක් එංගලන්තයේ පැවති නිසයි. බටහිර රටවල් අද පවතින කාර්මික දියුණුවට ළඟා වූයේ ද, අනෙක් සෑම රටකටම පෙර එංගලන්තය එම ස්ථානයට පත්වූයේ ද කාර්මික විප්ලවයට පෙර එංගලන්තයේ ඇතිවූ *"කෘෂිකාර්මික විප්ලවය (Agricultural Revolution)"* හේතුවෙනි (ඊරියගම, 1992). කෘෂිකාර්මික විප්ලවය වශයෙන් හඳුන්වන්නේ 18 වන ශතවර්ෂයේ දී එංගලන්තයේ කෘෂි නිෂ්පාදන ක්‍රමවල ඇතිවූ ප්‍රගතිය ද ඊට





අනුකූලව ඉඩම් ප්‍රතිසංවිධානය කර ගැනීම ද යන ද්විත්ව ක්‍රියාවලිය යි[23].

18 වන ශතවර්ෂය අගභාගයේ දී එංගලන්තයේ ආහාර අර්බුදයක් ඇතිවිය. එය එම කාලසීමාවේදී මිල උද්ධමනය හේතුවෙන් ආහාර මිල ගණන් ඉහළයාමෙන් පැහැදිලි වේ. එම තත්ත්වයට හේතු වූයේ ආහාර ඉල්ලුම වර්ධනය වීම සැපයුම සීමාවීම හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ආහාර මිල ගණන් ඉහළයාමයි. ආහාර ඉල්ලුම ඉහළයාම සඳහා ප්‍රමුඛව ම බලපෑම් කරන ලද්දේ මෙම කාලසීමාවේ දී එංගලන්තයේ ජනගහනය වැඩිවීම, නගර වැඩිවීම (නාගරීකරණය), නාගරික ජනගහනය පුළුල්වීම යන විචලනයන් ය. එහෙත් ආහාර සැපයුම වැඩිවීමක් සිදු නොවීම මෙම අර්බුදයේ ස්වභාවය විය. පාරම්පරික වගා ක්‍රම මඟින් වගා කටයුතුවල නියැළීම වැඩිවන ජනගහනයට සාපේක්ෂව ආහාර සැපයුම ඉහළ දැමීම නොහැකිවීමට තදින්ම බලපාන ලදී. වෙනස් වූ වාතාවරණයට අනුව කෘෂිකර්මය හැඩගසා ගැනීම හැර වෙනත් විකල්පයක් එංගලන්තයට නොවීය. මේ නිසා යල්පැනගිය වගා ක්‍රම අතහැර නවීන වගා ක්‍රමවලට මාරුවීම, එළදාව වැඩි ධාන්‍ය වගා කිරිම, නෝෆෝක් ක්‍රමය[24] අනුගමනය කිරීම තාක්ෂණික උපකරණ භාවිතය ආදී ක්‍රියාමාර්ග හේතුවෙන් මිනිස් පරිභෝජනයට සුදුසු ආහාර පමණක් නොව සත්ත්ව ආහාර ද වැඩි විය.

23 ක්‍රම ශිල්ප වෙනස්වීම හා ඉඩම් ඒකාබද්ධ කොට කොටුකර ගැනීම යන මෙම ක්‍රියාවලිය කෘෂිකාර්මික විප්ලවය නමින් ප්‍රකට ය (ඊරියගම, 1992). වගා ක්‍රම වෙනස්වීම (සිව් වැදෑරුම් බෝග මාරු කිරීමේ ක්‍රමය, ගැඹුරට පස හැරීමේ ක්‍රම, ක්‍රමානුකූලව බීජ වැපිරීම, පේළියට පැල සිටුවීම, වල්පැල නෙලීම), ජල සම්පාදන ක්‍රම සොයා ගැනීම ක්‍රම ශිල්ප වෙනස්වීම යටතේ සිදුවනවිට ඉඩම් ප්‍රතිසංවිධානය මඟින් සුළු බිම් සියල්ල ඒකාබද්ධ කර මහා පරිමාණ ගොවිපොළවල් බිහිවීම හා සාමූහික වගාව වෙනුවට පෞද්ගලික අයිතිය යටතේ වගාව සිදුකිරීම මෙයින් අදහස් කෙරේ.

24 චාල්ස් ටවුන් ෂෙන්ඩ් සාමිවරයා විසින් මුලින් ම අත්හදා බලන ලද මෙම ක්‍රමයෙන් අදහස් වන්නේ පැරණි ශෂ්‍ය මාරු ක්‍රමය වෙනුවට සිව්වැදෑරුම් බෝග මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

මෙවැනි කෘෂිකාර්මික විප්ලවයකට හේතු විමසීමේ දී *"ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය (Enclosure Movement)"* හිමිවන්නේ වැදගත් ස්ථානයකි. මින් අදහස් වන්නේ ඉඩම් හිමි රදළවරුන් සුළු පිරිසක් වෙත විශාල වශයෙන් ඉඩම් හිමිව තිබූ අවස්ථාවක එනම් ඔවුන් ඉඩම් විශාල ගොවිපොළවල් වශයෙන් කොටුකර ගන්නාවිට ප්‍රවේනිදාසයින්[25] තම වාස භූමි අතහැර නගර වෙත සංක්‍රමණයවීම හා එහි ශ්‍රම සැපයුම පුළුල්වීම මඟින් කර්මාන්ත ශාලාවලට අවශ්‍ය ශ්‍රමය ලබාගැනීම පහසුවීම මඟින් කෘෂි හා කාර්මික අංශය අතර ඇතිවූ සම්පත් හුවමාරුවයි. කෘෂිකාර්මික විප්ලවය නිසා එංගලන්තයේ ඒක පුද්ගල ආදායම ඉහළ ගියේය. එයින් ජාතික ආදායම ප්‍රසාරණය විය. භූමියෙන් උපරිම ඵල ලබා ගනිමින් ආහාර නිෂ්පාදනය වැඩිකිරීම නිසා ආහාර අතිරික්තයක් නිෂ්පාදනය කිරීමට හැකිවිය. මෙය ආකාර කිහිපයකින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට බලපාන ලදී. එක් අංශයකින් ආහාර අතිරික්තයක් රටතුළ බිහිවීමෙන් ආහාර සඳහා විදේශ වෙත ඇදී ගිය විදේශ විනිමය රට තුළ ආයෝජනය කිරීමට හැකිවීමත් අනෙක නම් ගොවීන්ගේ ආදායම් ඉහළයාමෙන් කෘෂිකාර්මික ඉතිරිකිරීම් ඉහළයාම හා ආයෝජනය යි. කාර්මික අංශය පසුකාලීනව දියුණුවට පත්වන අවස්ථාවේදී ආහාර සඳහා ද විදේශ විනිමය වැයකිරිමට හේතුවූයේ නම් රටේ ආහාර හිඟයක් මෙන්ම මිල උද්ධමනයක් ද ඇතිවීමට අවස්ථාව තිබිණ. කෙසේනමුත් රට ආහාරවලින් ස්වයංපෝෂිතවීමෙන් කම්කරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළයාම හා එය නිරෝගී ශ්‍රම බලකායක් ආර්ථිකයට බිහි කිරීමට ද හේතුවක් විය.

කෘෂිකාර්මික විප්ලවයෙන් ඉතිරිකිරීම් හා ශ්‍රම සැපයුමේ ඇතිවූ වෙනස්වීම් ද ඉතා වැදගත් වේ. කෘෂිකාර්මික අතිරික්තය යනු ඉතුරුම් ය. ඉඩම් කොටු කිරීම් හරහා සුළු ඉඩම් හිමියන් විශාල පිරිසකට වඩා විශාල ඉඩම් හිමියන් සුළු පිරිසකගේ ඉතුරුම් ඉහළ

[25] ඊඩම් හිමි රදළවරුන්ගේ ඉඩම්වල වගා කටයුතු කළ සමාජ පන්තිය






ගිය අතර ඒවා විවිධ මූල්‍ය ආයතනවල තැන්පත් කිරීම මඟින් කර්මාන්ත ආරම්භ කරන පුද්ගලයන්ට ණය ආයෝජන මූලාශ්‍ර සපයා ගැනීමට හැකිවීම මෙහිදී වැදගත් ආර්ථික අභිවෘද්ධිය විය. ශ්‍රම සැපයුම පුළුල්වීම කෘෂිකාර්මික විප්ලවයෙහි අනෙක් වැදගත් ප්‍රවණතාවය වේ. කෘෂිකර්මය සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය පුළුල්වීමත් සමඟ එම අංශයේ අනවශ්‍ය ශ්‍රමිකයින් හෙවත් අතිරික්ත ශ්‍රමිකයින් වැඩිවූ අතර ඔවුන් කාර්මික අංශය වෙත ඉතා පහසුවෙන් විතැන් විය. එයට හේතුවූයේ ඉඩම් කොටු කිරීම් හරහා ගම් මට්ටමින් ඔවුන්ට ඉඩම්වල අයිතියවත් නොවීම නිසා නගර වෙත ඔවුන් සංක්‍රමණය වීමයි. එමෙන්ම පාරිභෝජන රටාවේ ඇතිවූ විපර්යාසය ද සැළකිල්ලට ගැනීම මෙහිදී වැදගත් වේ. ආහාර නිෂ්පාදනයේ අතිරික්තය නිසා මිනිසුන්ගේ ආහාර සඳහා වැයකරන ආදායමේ ප්‍රතිශතය අඩුවෙන්නට වූ අතර එය වෙනත් කාර්මික නිමැවුම් සඳහා යොදවන්නට ඔවුන් පෙළඹිනි. මේ නිසා කාර්මික භාණ්ඩ ඉල්ලුම ඉහළ ගිය අතර එය කාර්මික භාණ්ඩ සඳහා වෙළඳපොළක් කිර්මාණය වීම කෙරෙහි ඍජුව ම බලපාන ලදී. මෙම කරුණු සැළකීමෙන් එංගලන්තයේ කෘෂිකාර්මික විප්ලවය මූලික කරගනිමින් කාර්මික විප්ලවය ඇතිවීමත් එයින් වර්තමානයේ දී සාකච්ඡා කරන දියුණු ආර්ථිකයක් වීමත් සිදුවූ ආකාරය ඉදිරි රූප සටහනෙහි පරිදි පෙළගැස්විය හැකිය.

## 5.3 රූප සටහන

## එංගලන්තයේ කෘෂිකාර්මික විප්ලවය කාර්මික විප්ලවයට දායක වූ ආකාරය








## 5.5 චීනය




ජාත්‍යන්තර වෙළඳාම හා ගෝලීයකරණ ක්‍රියාදාමයෙහි කැපීපෙනෙන කාර්යභාරයක් ඉටුකරන ආසියානු රටක් වශයෙන් චීනය අවිවාදයෙන් පිළිගත හැකිය. චීන ආර්ථිකයේ පසුගිය ආර්ථික කාර්යසාධනය අධ්‍යයනය කිරීමේ දී එවැනි ඉහළ කාර්යසාධනයකට ළඟාවීමට අවශ්‍ය මූලික ශක්තීන් හඳුනාගැනීම පහසු වේ. කෙසේනමුත් ලෝකයේ බෝහෝ දියුණු ආර්ථිකයන් ආර්ථික වශයෙන් අඩු කාර්යසාධනයක් පෙන්නුම් කරද්දී ගෝලීය මෙන්ම කලාපීය වශයෙන් ද චීනය ඉදිරියෙන් පසුවිය. චීනය දේශපාලන වශයෙන් කොමියුනිස්ට් රටකි. මේ නිසා ම වර්ෂ 40 ටත් අධික කාලයක් චීනය අභ්‍යන්තරාභිමුඛව පැවතුනි. නමුත් 1978 සිට ඇය බාහිරානමුඛ රටක් වශයෙන් කැපීපෙනෙන සංවර්ධනයක් කරා එළඹ ඇත. චීනය ලෝකයේ විශාලතම ජනගහනය වාර්තා කරන රාජ්‍යය යි. එය ආර්ථික විද්‍යා පදනම මත සළකන්නේ නම් ලෝකයේ විශාලතම ශ්‍රම බලකාය *(Labour Force)* චීනය හිමිකරගන්නේ ය. 1978 සිට චීනයට බාහිරානමුඛ ප්‍රතිපත්ති හඳුන්වාදෙනවිට බාහිර දැක්මක් සහිත ප්‍රතිපත්ති එසේත් නැතහොත් නිදහස් ආර්ථික ප්‍රතිපත්ති වෙත යොමුවිය. 1978 සිට චීනය අනුගමනය කළ ප්‍රතිසංස්කරණ ක්‍රමෝපාය, ඊට පෙර සැලසුම් කිරීමේ ගමන් පථයට සමාන්තරව වෙළඳ ගමන් පථයක් පිහිටුවීම හෙවත් ද්විත්ව ගමන්පථ ප්‍රවේශයක් ලෙස හඳුන්වා ඇත (හේනෙගෙදර, 2004). ජෙෆ්රි *(Jeffrey)* සහ තවත් අයගේ අදහස් අනුව ද්විත්ව ගමන්පථ ක්‍රමෝපාය චීනය ක්‍රමයෙන් ලෝක වෙළඳාම සහ මූලය ක්‍රමයට ඒකාබද්ධ කිරීමේ මාර්ගයක් ලෙස සැළකුනි. ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික අංශය පදනම් කරගත් ද්විත්ව

ගමන්පථ ප්‍රවේශය කොමියුන සතු ඉඩම් පෞද්ගලික ගොවි පවුල්වලට බදුදීමෙන් සමූහ ගොවිපොල කොමියුන සේවක ක්‍රමය නිති කිරීමට විශාල බලපෑමක් කළේය (හේනෙගෙදර, 2004).

1978 වර්ෂයේ සිට චීන රජය විසින් ආර්ථික සංවර්ධනය උදෙසා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ අනුව එය කාල පරිච්ඡේදයන් දෙකක් යටතේ අධ්‍යයනය කළ හැකිය. ඒ 1980 දශකයේ කාල සීමාව හා 1990 දශකයේ කාල සීමාව වශයෙනි. 1980 දශකයේ හඳුන්වාදුන් ප්‍රතිපත්ති උපකරණ අතර කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය හා ආර්ථික සංවර්ධනය සඳහා එහි දායකත්වය සළකා බැලීමේ දී *"පවුල් වගකීම් ක්‍රමය"*[26] වැදගත් වේ. චීනයේ කෘෂිකාර්මික සමෘද්ධියෙහි වැදගත් කාර්යභාරයක් වගකීම් ක්‍රමය මඟින් ඉටුකර ඇත. ගොවීන්ගේ චේතනය ඔවුන්ගේ ශ්‍රමය සමඟ සම්බන්ධ කරන එය, කළමනාකරණයේ දී ඔවුන්ට ස්වාධිකාරයක් ලබා දෙයි. 1979 දී මෙම ක්‍රමය චින කෘෂිකර්මාන්තය සඳහා හඳුන්වා දෙනලදී[27]. වගකීම් ක්‍රමය හේතුවෙන් චීන කෘෂිකර්මාන්තය කෙතෙක් දියුණුවට පත්වූයේ ද යත් 1979-82 කාලය අතරතුර චීන කෘෂිකාර්මික නිෂ්පාදනයේ වටිනාකම සාමාන්‍යයෙන් වර්ෂයකට 7.5% ක අනුපාතයකින් ඉහළ නැග ඇත. තවද වාර්ෂික ධාන්‍ය නිෂ්පාදනය 8.7% කින් ද ඉහළ ගියේය. එමෙන්ම ගොවීන්ගේ වාර්ෂික ඒක පුද්ගල ආදායම 1978 දී යුවාන් 138.6 ක් වූ අතර 1982

26 "මෙම ක්‍රමය යටතේ ග්‍රාමීය පවුල්වල ආදායම සහ නිපැයුම් වැඩි දියුණු කිරීමට අදහස් කරන ලදි. වැඩසටහන ඉතා ඵලදායක වූ අතර, කෘෂිකාර්මික නේවාසිකයන්ගේ ඒක පුද්ගල පාරිභෝගික දර්ශකය 100 (1978) සිට 199 (1986) දක්වා වැඩි වූ අතර කෘෂිකාර්මික නොවන නේවාසිකයන්ගේ දර්ශකය වැඩි වූයේ 158.1 දක්වා පමණි. 1980 දී RMB 500-2000 අතර ශුද්ධ ආදායමක් ලැබූ ග්‍රාමීය පවුල් ප්‍රතිශතය සියයට 1.6ක් පමණක් වූ අතර. 1985 දී එය සියයට 22.16ක් දක්වා වැඩිවිය. ග්‍රාමීය ප්‍රදේශවල එක්රැස්වූ ආදායම පාරිභෝගික භාණ්ඩ සහ සැහැල්ලු කාර්මික භාණ්ඩ සඳහා ඒකාබද්ධ ඉල්ලුම වැඩිවීමට හේතුවිය." (හේනේගෙදර, 2004).

27 නිෂ්පාදනයෙහි වගකීම් ක්‍රමය, කළමනාකරණයෙහි ප්‍රතිසංස්කරණය ද සියලු දෙනා අතර සමානත්වය නැතිකර දැමීමද සමඟ එක්විට ක්‍රියාත්මක කෙරෙයි.





වර්ෂය වනවිට යුවාන් 270.11 ට වර්ධනය විය[28]. මෙම ක්‍රමයට අමතරව ද්විත්ව මිල ක්‍රමය හා ලාභ ප්‍රේෂණය වෙනුවට ලාභ බදු ස්වරූපයෙන් කරන ලද මූල්‍ය ප්‍රතිසංස්කරණ යන ප්‍රතිපත්තීන් මෙහිදි අනුගමනය කර ඇත. මෙකී ප්‍රතිපත්ති උපකරණ භාවිතයෙහි ප්‍රතිඵලයක් වශයෙන් කෘෂි නොවන අංශ ප්‍රසාරණය වීම ඇරඹුණු අතර ඒ සඳහා අවශ්‍ය මඟ සැලසෙන පරිදි වාණිජමය ආකාරයෙන් කෘෂිකාර්මික අංශය දියුණු වි ඇත. නමුත්, 1990 කාල පරිච්ඡේදය සළකා බලනවිට පෙනියන්නේ ව්‍යුහාත්මක ගැලපුම් හා මූල්‍ය ප්‍රතිපත්ති[29] කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇති බව ය.

චීනයේ කෘෂිකාර්මික අංශයේ කාර්යසාධනයේ වඩාත් කැපී පෙනෙන කාල පරිච්ඡේදය වන්නේ 1957-1978 කාලය යි. ශ්‍රමය ඵලදායී ලෙස යොදා ගැනීම, ආදායම් ව්‍යාප්තියෙහි සාධාරණත්වය, යටිතල පහසුකම් දියුණුව, නිෂ්පාදන වර්ධනය ආදී වශයෙන් විවිධ අංශ කිහිපයකින් චීනය ලබාගත් දියුණුව අති විශාල වේ (සේනානායක, 2008). විශේෂයෙන් 1965න් පසු කාලසීමාව සැලකීමේ දී 1965-1978 කාලය තුළදී චීනයේ කෘෂිකාර්මික නිමැවුමෙහි දළ වටිනාකම වසරකට 04%ක පමණ වේගයකින්

28 **වගකීමේ ක්‍රමයේ වැදගත්කම හා අවශ්‍යතාවය** - ශක්තිය හෝ කළමනාකරණ කුසලතා නැතිකම නිසා මූලය දුෂ්කරතාවයන්ට මුහුණ දී සිටින පවුල්වලට, සහන හා වෙනත් වර්ගයේ ආධාර රාජ්‍ය සහ සමූහ ව්‍යවසායේ මැදිහත්වීමෙන් ලබාදෙනු ඇත. දීර්ඝ කාලීන දෘෂ්ඨිකෝණයකින් ගත්කල්හි ගොවීන්ගේ ආදායම්වල නිරන්තර වර්ධනයක් සමඟ විද්‍යාත්මක හා සංස්කෘතික ඥානය ජනයා පතුවාලීම ද ගම්බද පළාත්වල විවිධාංගීකරණය කරනු ලැබූ ආර්ථිකයක සර්වාකාර වර්ධනයක් සමඟ ග්‍රාමීය ශක්තිය, වෙසෙසින්ම දිළිඳු පවුල්වල අර්ධ-වැඩිහිටි ශ්‍රම ශක්තිය යෝග්‍යාකාරයෙන් බෙදාහැරනු ඇත. මෙයද රාජ්‍ය සහ සාමූහිකය විසින් සපයනු ලබන වර්ධනය වන්නාවූ ආධාර ද විසින් ගොවීන් අතර ආදායම් පරතරය ක්‍රමයෙන් තුරන් කර දමනු ඇත.

29 මෙම කාලයේ දී ස්වාධීන සහ නම්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, කාර්මික සහ ආර්ථික බාධක මඟහැරවීමට සහ දීර්ඝ කාලීන යටිතල සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීමට ආයෝජන ප්‍රමුඛතා නැවත යොමු කිරීම, රාජ්‍ය සන්තක කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා විශාල ඒකක ආරක්ෂා කිරීම සහ කුඩා ඒකක නිදහස් කිරීමේ ක්‍රමෝපාය *Zhuada Fangxiao* හඳුන්වාදීම යන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නංවා ඇත (හේනේගෙදර, 2004).

වර්ධනය වී ඇත. නමුත්, ජනගහනය 2.2%ක වේගයකින් වර්ධනය විය. ශ්‍රම බලකාය 02%ක වේගයකින් ද ශ්‍රම ඵලදායීතාව වසරකට 02%ක ප්‍රමාණයකින් ද වර්ධනය වූ අතර වගා කළ භූමි ප්‍රමාණය අඩුවුවද නිෂ්පාදනය වසරකට 03%ක අගයකින් ඉහළ ගොස් ඇත. එයට හේතුව භූමියේ ඵලදායීතා වර්ධනය යි.

මේ ආකාරයට චීනයේ ග්‍රාමීය ආර්ථිකයේ ආශ්චර්යමත් වර්ධනය කෘෂිකාර්මික අංශයේ සිදුවූ තාක්ෂණික වෙනස්කම් හා ඇතිවුවකි (සේනානායක, 2008). වාරිමාර්ග පහසුකම් වර්ධනය කිරීම, රසායනික පොහොර භාවිතය ඉහළ දැමීම, ගොවිපොළ යාන්ත්‍රිකකරණය (ට්‍රැක්ටර් භාවිතය, ජලාපවාහන යන්ත්‍ර භාවිතය) ආදිය කෘෂිකාර්මික අංශයේ කරන ලද තාක්ෂණික වෙනස්කම්වලින් කිහිපයක් වේ. මේ සියලු වර්ධනීය තත්ත්වයන් තුළින් අවසානයේ චීනයේ කෘෂිකාර්මික අංශය ආර්ථිකය තුළ ප්‍රාග්ධන හා ශ්‍රම ඒකරාශීකරණය මඟින් සමස්ත ආර්ථික සංවර්ධනයට දායක වී ඇත. මීට අතිරේකව අනෙකුත් අංශ කෙරෙහි ආයෝජනය හැකි සම්පත් ලබාදීම මඟින් එම දායකත්වය වඩාත් පුළුල් වී ඇත.





# ආශ්‍රිත


- Agrawal, A. N. & Kundan, L. (1989). *Economics of Development and Plannings.* New Delhi: Vikas Publishing House.
- Central Bank of Sri Lanka (2011). Annual Report – 2010. Colombo.
- Desai, R. G. (2001). *Agriculttural Economics: Models, Problems and Policy Issues.* Mumbai: Himalaya Publishing House.
- Lau, L. J. (2002). *Taiwan as a Model for Economic Development.* [online]. Available from: http://www.stanford.edu/~ljlau/Presentations/Presentations/021004.PDF (Accessed 12/12/2012).
- Nanayakkara, A. G. W. (2004). *Employment and Unemployment In Sri Lanka – Trends, Issues and Options.* Colombo: Department of census and statistics Sri Lanka.
- Sadhu, A. N. (2000). *Fundamental of Agricultural Economics.* Mumbai: Himalaya Publishing House.
- Sandford, C. (1977). *Social Economics.* London: Heineman Educational books Ltd.
- ඇමරිකා එක්සත් ජනපද ප්‍රවෘත්ති සේවය (1991). *ඇමරිකානු ආර්ථිකයේ සංක්ෂිප්ත සටහන්.* කොළඹ.
- ඊරියගම, තිස්ස. (1992). *බ්‍රිතාන්‍ය ආර්ථික ඉතිහාසය.* කොළඹ: උසස් අධ්‍යාපන පදනම.

- ධනපාල, ඒ. එච්. (1965). *භෝග වගාව හා ආර්ථික කටයුතු*. අංගොඩ: මධුෂාන් ප්‍රකාශන.
- ප්‍රනාන්දු, එල්. එස්. (2001). සංවර්ධනය තිරසාර සංවර්ධනය හා ඒ සඳහා වූ උපාය මාර්ග. *ආර්ථික විමසුම*, කොළඹ, මහජන බැංකුව.
- බණ්ඩාර, සුනන්ද මද්දුම (1998). *ජපානයේ ආර්ථික සංවර්ධනය*. කොළඹ: කර්තෘ.
- වික්‍රමසිංහ, ජේ. ඩබ්. (2002). *ජනහිතකාමී ආර්ථික සංවර්ධනය*. කොළඹ: එස්. ගොඩගේ සහෝදරයෝ.
- ශ්‍රී ලංකා මහ බැංකුව. (2007). වාර්ෂික වාර්තාව - *2006*. කොළඹ.
- සේනානායක, එස්. එම්. පී. (2008). *කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව*. කොළඹ. කර්තෘ.
- සෝමසුන්දර, දයානන්ද. (1997). *කෘෂි ආර්ථික විද්‍යාව - II කොටස*. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.